

# පාලිභාෂාවතරණය

## ප්‍රථම භාගය.



පාලිව්‍යාකරණද, භාෂාවද, වාක්‍යරචනාවද
එකවිට ඉගනීමට උපකාරවූ

# පාලිභාෂාවතරණය.

(පළමුවෙනි පොත.)

---


අම්බලම්ගොඩ
පොල්වත්තේ ආභිධර්මික
ශ්‍රී බුද්ධදත්ත ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ
විසින් සම්පාදිතයි.


---

# PĀLIBHĀSHĀVATARANAYA.

(A PALI COMPOSITION.)

---

FIRST BOOK.

---


BY
POLWATTE
SRI BUDDHADATTA STHAVIRA,
AGGĀRĀMA, AMBALANGODA.


---


PUBLISHED BY
B. MARTIN SILVA,
"Sirisewana," Ambalangoda.

1923.

බෞද්ධාධ්‍යාපනය

ප්‍රාණවද්භාවයට පැමිණවීමද,

පාලිභාෂාව

රාජකීයපරීක්ෂණයන්ගේ අඞ්ගයක් කිරීමද

නිමිති කොට

මේ පොත

කොළඹ ආනන්දමහාවිද්‍යාලයාධිපති

බී. ඒ., බී. ඇස්. සී., එල්. එල්. බී. උපාධිධාරී

ශාස්ත්‍රාචාර්ය

පැට්‍රික් ද සිල්වා කුලරත්න

මන්ත්‍රීතුමන්

වෙත

පිළිගන්වනලදී.

# විඥාපනය

"මෙය වනාහි ආධුනිකයන්ට සිංහලෙන් පාලි ඉගැන්වීම සඳහා සම්පාදිත පොතකි. මෙහි ගෙන තිබෙන පිළිවෙල නම් වාක්‍යරචනා මාර්ගයෙන් භාෂාව ඉගැන්වීමේ අභිනව ක්‍රමයයි. පාඩම් ක්‍රමයෙන් ගැඹුරුවනසේ ද අභ්‍යාසයෙන් ඉගනියයුතුසේ ද සම්පාදිතය. දීර්ඝකාලයක සිට තිබුණු ඕනෑකමක් මේ පොතෙන් පිරිමැසේ. මෙය පාලිපරිචය සඳහා පාඨශාලාවල ප්‍රථමයෙන් ඉගැන්විය යුතු පොතක් යයි අපි සම්මත කරමු." මේ වනාහි මේ පොත පිළිගැනීමේදී අධ්‍යාපන මණ්ඩලය සම්බන්ධ ග්‍රන්ථ විවේචන සභාව ප්‍රකාශකළ වචනයි. මේ පොත හැඳින්වීමට මීට වඩා විස්තර කථාවක් ඕනෑයයි නොසිතේ.

පාලිභාෂාව ඉගැනීමට මහත් ආශාවක් මෙකල බොහෝ දෙනෙකුන් තුළ ඇතිව තිබේ. එය සිංහලභාෂාවේ මාතෘභාෂාවක් වීමත්, සර්වඥධර්මය ඒ භාෂාවෙන් ලියවී තිබීමත්, ආණ්ඩුවේ පාඨපරීක්ෂණවලට පාලිභාෂාව ඇතුළත් කිරීමත් මේ උනන්දුවට හේතුවූහයි සිතමි. එහෙත් පහසුවෙන් පාලි ඉගැනීමට උපකාරවූ අභිනව ක්‍රමයට ගැළපූ පොත් නැතිවීම එය ඉගෙනගනු කැමති ආධුනිකයන්ට මහත් බාධාවෙක් විය. ඒ බාධාව මගහරවනු සඳහා ආනන්ද විද්‍යාලයාධිපති ශාස්ත්‍රාචාර්ය කුලරත්න මැතිතුමන් ආදී උසස් මහතුන්ගේ මෙහෙයීම ලෙස අප විසින් මේ පාලිභාෂාවතරණය සම්පාදිත ය.

මුලින්ම ඉගැනීමට පටන් ගන්නා ශිෂ්‍යයන් සඳහා මේ පළමුවෙනි පොත අදහස්කරන ලද බැවින් මෙය හැකිතරම් ලිහිල් භාෂාවෙන් යුක්ත කරනලදී. මෙහි ලිඞ්ග තුනට අයත් බහුල ප්‍රචාරයට පැමිණෙන ශබ්දයන් වරනහන ආකාරය ද කාලත්‍රයට අයත් ක්‍රියාපද ස්වල්පයක් ද පූර්වක්‍රියා, ක්‍රියාවිශෙෂණ, විශෙෂ්‍යපද, නිපාතපද ආදිය ද සංක්‍ෂෙපයෙන් දක්වන ලදහ. සිංහල වාක්‍යයන් සිංහලට නැගීමේදී ද ශිෂ්‍යයන්ට උපකාරවීම සඳහා පොතේ ඇතුළත් සියලු වචනයන් අකාරාදි පිළිවෙලින් ගළපා පාලි - සිංහල, සිංහල - පාලි වචනමාලා දෙකක් ද මෙහි අන්තයෙහි යොදන ලදී.

සන්ධි - සමාස - තද්ධිත - කිතකයන් - පිළිබඳ විස්තර ද ආඛ්‍යාතය පිළිබඳ වැඩි විස්තර ද දෙවෙනි පොතේ ඇතුළත්

වෙති. තුන්වෙනි පොතෙන් ඉතා උසස් පරීක්‍ෂණයකට පෙනී සිටින්නකුට වුවත් සෑහෙන තරම් ගැඹුරු දැනීමක් ලබාගත හැක. වාක්‍යරචනාව වැඩිදුර ඉගෙනගනු කැමැත්තන් උදෙසා "පාලි ගද්‍ය පද්‍ය රචනා" නම් පොතක් ද අප විසින් ප්‍රචාරයට පමුණුවා තිබේ. මෙසේ දැන් පාලි ඉගෙනගනු කැමැත්තෙකුට නිර්භයව ඒ ඉගෙනීමට බැසිය හැකිවනසේ අප විසින් කටයුතු සම්පාදනය කොට තිබේ.

පාලි ඉගැනීමට ආශා ඇතත් ගුරුවරුන් කරා පැමිණීමට අවකාශ නැතිව සිටින්නන් විසින් හෝ ගුරුවරුන් සොයාගත නොහැකි භවතුන් විසින් මේ පොත් හා "පාලිපාඨාවලී" නම් පාඩම් පොත ද පාලිභාෂාවතරණ යතුර ද ගැනීමෙන් ස්වෝත්සාහයෙන් ම පාලි ඉගැනීම ද කළ හැක. පිරිවෙන්වල ශිෂ්‍යයන් අවුරුදු දෙකකදී ලබනතරම් ඉගෙනීමක් මේ පළමුවෙනි පොතෙන් හමසකදී ලබාගත හැක.

පළමුවෙනි පොත පළමුවර මුද්‍රණයට පමුණුවන ලද්දේ 1923 දීය. පළමුකොට ආනන්ද මහාවිද්‍යාලයේ පාලි ඉගෙන ගන්නා ශිෂ්‍යයන් විසින් මෙම පරිශීලනය කරන ලදී. අවුරුදු කීපයක් අප විසින්ම ආනන්ද නාලන්ද විද්‍යාලයන්හි ශිෂ්‍යයන්ට මේ පොතෙන් පාලි ඉගැන්වීම කළ බැවින් පොතේ සකස්කළ යුතු තැන් දැනගත හැකිවිය. එසේ ප්‍රතිසංස්කරණයට පැමිණවූ මෙය නැවත 1987 දී ප්‍රචාරයට පමුණුවන ලදී. තෘතීය මුද්‍රණයේදීත් ස්වල්ප සංස්කරණයක් කරන ලදී. සිවුවෙනි වාරයේදී පොත සම්පූර්ණ සංස්කරණයකට පමුණුවන ලදී. අභ්‍යාස සියල්ලම වාගේ අමුතුවෙන් ලියා වැඩිපුර කරුණු ද ඇතුළත් කරන ලදී.

ශිෂ්‍යයන් සඳහා අප විසින් සම්පාදිතවූ පාලි – සිංහල ශබ්දකෝෂය දැන් ලබා ගත හැක.

මීට,

අම්බලම්ගොඩ අග්ගාරාමාධිපති

**පොල්වත්තේ බුඩදත්ත ස්ථවිර**

17–10–1951

# පටුන


පිට

අක්ෂර විභාගය ........ 01
ලිංග විභාගය ........ 02
විභක්ති හා වචන ........ 03
වරනැගීම (පුල්ලිංගික අකාරාන්ත ශබ්ද) ........ 05
ක්‍රියා විභාගය ........ 09
වර්තමාන ක්‍රියා ........ 10
ධාතු කොටස් ........ 13
පුල්ලිංගික ඉකාරාන්ත ශබ්ද ........ 16
අතීත ක්‍රියා ........ 18
අම්හ - තුම්හ ශබ්ද ........ 22
අනාගත ක්‍රියා ........ 26
පුල්ලිංගික ඊකාරාන්ත ශබ්ද ........ 26
පුල්ලිංගික උකාරාන්ත ශබ්ද ........ 29
ගුණවන්තු ආදී විශේෂණ පද ........ 34
ඌකාරාන්ත - පුල්ලිංගික ශබ්ද ........ 35
කාලාර්ථප්‍රකාශක නිපාත ........ 36
ස්ත්‍රීලිංගික - අකාරාන්ත ශබ්ද ........ 38
විධික්‍රියාව ........ 39
නිපාතපද ........ 40
ස්ත්‍රීලිංගික ඉකාරාන්ත ශබ්ද ........ 42
ස්ත්‍රීලිංගික ඊකාරාන්ත ශබ්ද ........ 43
පූර්වක්‍රියා ........ 44
ස්ත්‍රීලිංගික උකාරාන්ත ශබ්ද ........ 46
නපුංසක අකාරාන්ත ශබ්ද ........ 48

තුං ප්‍රත්‍යයාන්ත ශබ්ද ... 50
නපුංසක ඉකාරාන්ත ශබ්ද ... 51
තවත් නිපාත පද ... 52
නාම විභාගය ... 54
සර්වනාමයෝ ... 54
මිශ්‍රක්‍රියා කිතක පද ... 65
නාම විශෙෂණ ... 71
සංඛ්‍යා විශෙෂණ (ගණන්) ... 74
ක්‍රියා විශෙෂණ ... 82
කාරක විස්තරය ... 85
ක්‍රියා කාරකපද සම්බන්ධය ... 88
කර්මකාරක ක්‍රියා ... 90
කර්මකාරකයෙහි කිතකපද ... 94
කාරිත හෙවත් හෙත්වර්ථපද ... 97
පඤ්චමී අර්ථයෙහි තො - ප්‍රත්‍යය ... 99
පාලි - සිංහල වචන මාලාව ... 103
සිංහල - පාලි වචන මාලාව ... 119

# පාලිභාෂාවතරණය

## පළමු පොත

නමො බුඩාය

## අක්ෂර විභාගය

### ALPHABET

1. භාෂාවෙහි අකුරු

අ ආ ඉ ඊ උ ඌ එ ඔ

ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ,

ට ඨ ඩ ඪ ණ, ත ථ ද ධ න,

ප ඵ බ භ ම,

ය ර ල ව ස හ ළ අං

යි සතළිස් එක් දෙනෙකි.

2. මෙහි මුලින් දක්වූ අකුරු අට තනිව ශබ්ද කළ හැකි බැවින් **සර** (හෙවත් **ප්‍රාණාක්ෂර**) නම් වේ. ඉතිරි තිස් තුන තනිව (හෙවත් ස්වරයක සම්බන්ධය නැතිව) ශබ්ද නොකළහැකි බැවින් **ව්‍යඤ්ජන** (හෙවත් **ගාත්‍රාක්ෂර**) නම් වේ.

මේ ව්‍යඤ්ජනයන්ගේ මුල් රූප නම් "ක්, ග්" ආදීහුයි. එසේ ලිවූ විට කීම අපහසු බැවින් ප්‍රාණාක්ෂරයක් වූ අ – යන්න හා එක්කොට "ක, ග" ආදී වශයෙන් ලියනු ලැබේ.

3. එ – ඔ – දෙක සිංහල හෝඩියේ ඒ – ඕ දෙක මෙන් දීර්ඝ කොට කිය යුතුයි. එහෙත් බැඳි අකුරුවලට මුලින් සිටි ඒ අකුරු දෙක බොහෝවිට සිංහල හෝඩියේ එ – ඔ දෙක මෙන් හ්‍රස්ව කොට කියනු ලැබේ.

උදහරණ:- ඛෙත්තං, සෙඨී, එත්ථ, ඔක්කමති, ඔයො, යොත්තං

පාලියෙහි එ - ඔ දෙක බොහෝසේම ඒ - ඕ මෙන් දීර්ඝව කියවෙන නමුත් එසේ දීර්ඝ ලකුණු සහිතව නො ලියනු ලැබේ. මොග්ගල්ලායන නම් පාලි ව්‍යාකරණයෙහි වනාහි "එ - ඒ - ඔ - ඕ" යන අකුරු සතර ම පාලියෙහි ඇතැයි ද, එබැවින් අකුරු හතළිස් තුනකැයි ද කියන ලදී. අක්ෂර විභාගය පිළිබඳ වැඩි විස්තර සඳහා දෙවැනි පොත බැලිය යුතු.

# ලිංග විභාගය

## GENDER

4. "පුරිසො ගච්ඡති" (පුරුෂයා යේ)

යන්න වාක්‍යයෙකි. මෙහි පුරිසො නාම පදයකි. ගච්ඡති ක්‍රියා පදයකි.

"පුරිසො" යන්නේ මුල හෙවත් ශබ්ද ප්‍රකෘතිය "පුරිස" යන්නයි. (අන්තයෙහි යෙදී තිබෙන ො හෙවත් ඔ යන්න විභක්තියෙන් ලැබුන එකකි.) පුරිස ශබ්දය යි කීමෙන් විභක්ති නො යෙදූ මුල් ශබ්දය අදහස් කරනු ලැබේ.

5. පාලි භාෂාවෙහි සියලු නාමයෝ:-

1. පුල්ලිඞ්ග
2. ඉත්ථිලිඞ්ග
3. නපුංසකලිඞ්ග

යන ලිඟු තුනෙහි ඇතුළත් වෙති.

1. පුරුෂයන් හෝ පුරුෂාකාරය අඟවන්නාවූ ශබ්ද පුල්ලිඞ්ගයෙහි වේ. පුරිසො (=පුරුෂයා), වානරො (=වඳුරා), රුක්ඛො (=ගස) යනාදියයි.

2. ස්ත්‍රීන් හෝ ස්ත්‍රීස්වභාවය අඟවන්නාවූ ශබ්ද ඉත්ථිලිඞ්ගයෙහි වේ. වනිතා (=ස්ත්‍රී), මිගී (=මුවදෙන), ලතා (=වැල) යනාදියයි.

3. ස්ත්‍රීභාවය හෝ පුරුෂභාවය නො හඟවන ශබ්ද නපුංසකලිඞ්ගයෙහි වේ. ඵලං (=ගෙඩිය), රූපං (=රූපය) ධනං (=ධනය) යනාදිය යි.

6. මේ කියනලද්දේ සාමාන්‍ය ලක්ෂණයයි. ගෙට නමක් වූ ගෙහ ශබ්දය පුල්ලිංග නපුංසකලිංග දෙකෙහි වැටේ. එසේ ඒ ලිඟු දෙකෙහිද, පුල්ලිංග ඉත්ථිලිංග දෙකෙහිද, තුන් ලිඟුවෙහි ද වැටෙන ශබ්ද ඇත. ගලට නමක්වූ පාසාණ ශබ්දය පුල්ලිංගයෙහි වේ. ඊටම නමක්වූ සිලා ශබ්දය ඉත්ථිලිංගයෙහි වේ. එබැවින් මුලින් දක්වන ලද්දේ සාමාන්‍ය ලක්ෂණය බවත්, හැම තැන්හි එය නො යෙදෙන බවත් සැලකිය යුතු.

# විභක්ති හා (ඒක, බහු) වචන

## CASE AND NUMBER

7. පුරිෂ ශබ්දය පුල්ලිංගයෙහි වැටේ යයි කියන ලදී. "පුරුෂයා ගමට යයි". "පුරුෂයාට ගොනා ඇන්නේය" ආදිය කියයුතුවිට ඒ ශබ්දය හැමතැනම එක් ආකාරයකින් යෙදිය හැකි නොවේ. ඒ ඒ අර්ථයන් ප්‍රකාශ කිරීම සඳහා වෙනස් කොට යෙදිය යුතු වේ. මේ වෙනස් කිරීම හෙවත් බෙදීම විභක්ති යයි කියනු ලැබේ. පාලියෙහි විභක්ති සතකි.

| | පාලි | | සංස්කෘත | සිංහල |
|---|---|---|---|---|
| 1. | පඨමා විභත්ති | = | ප්‍රථමා විභක්ති | පෙර විබත් |
| 2. | දුතියා විභත්ති | = | ද්විතීය විභක්ති | කම් විබත් |
| 3. | තතියා විභත්ති | = | තෘතීයා විභක්ති | කතු විබත් |
| 4. | චතුත්ථී විභත්ති | = | චතුර්ථී විභක්ති | සපදන් විබත් |
| 5. | පඤ්චමී විභත්ති | = | පඤ්චමී විභක්ති | අවදි විබත් |
| 6. | ඡට්ඨී විභත්ති | = | ෂෂ්ඨී විභක්ති | සබඳ විබත් |
| 7. | සත්තමී විභත්ති | = | සප්තමී විභක්ති | අදර විබත් |

යන මොහුයි. තතියා විභක්තියගේ භෙදයක්වූ **කරණය** ද, ප්‍රථමාවගේ භෙදයක් වූ **ආලපනය** ද නිතර ව්‍යවහාරයට පැමිණෙන බැවින් වෙන් වූ විභක්ති දෙකක් ලෙස භාවිතයට පැමිණ තිබේ.

| | | | |
|---|---|---|---|
| 8. | කරණ විභත්ති | = කරණ විභක්ති | කරණ විබත් |
| 9. | ආලපන විභත්ති | = ආලපන විභක්ති | අලප් විබත් |

යන මේ දෙක සමග විභක්ති නවයකි.

("පඨමා" යන්නේ තේරුම "පළමු" යනුයි, "දුතියා" = "දෙවන" ආදී වශයෙන් සත්වන විභක්තිය දක්වා පිළිවෙලින් දතයුතුයි.) මේ විභක්තිවල ඉංග්‍රීසි නාම හා දන් සිංහල ව්‍යවහාරයෙහි පවත්නා නම් මෙසේයි:–

| | | |
|---|---|---|
| 1. | Nominative Case | ප්‍රථමා විභක්තිය |
| 2. | Accusative or Objective Case | කර්ම විභක්තිය |
| 3. | Ablative of Agent Case | කර්තෘ විභක්තිය |
| 4. | Dative Case | සම්ප්‍රදන විභක්තිය |
| 5. | Ablative of Separation Case | අවධි විභක්තිය |
| 6. | Genitive of Possessive Case | සම්බන්ධ විභක්තිය |
| 7. | Locative Case | ආධාර විභක්තිය |
| 8. | Ablative of Instrument Case | කරණ විභක්තිය |
| 9. | Vocative Case | ආලපන හෝ සම්බොධන විභක්තිය |

8. එක් අයෙකු හෝ එක් දෙයක් කියයුතු කල්හි **එක වචනය** ද, එක් අයකුට හෝ එක් දෙයකට වැඩි ගණනක් කියයුතු කල්හි **බහු වචනය** ද යොදනු ලැබේ. එබැවින් එක් එක් විභක්තිය

**එකවචන**

**බහුවචන**

වශයෙන් ද වෙනස්වන බව දතයුතු.

# (නාම) වරනැගීම

## DECLENSION

9. ඒ ඒ ශබ්දයන් ඒකවචන බහුවචනවලට ද, පඨමාදී විභක්තිවලට ද නියම වූ ලෙස යොද පෙන්වීම වරනැගීම යයි කියනු ලැබේ. පුල්ලිංගයෙහි ඇතුළත් සියලු ශබ්ද එක් ආකාරයකින් ම වරනැගිය හැකි නොවේ. අකාරාන්ත (=අකාරය කෙළවරෙහි ඇති) ශබ්ද එක් ආකාරයකින් ද, ඉකාරාන්ත (=ඉකාරය කෙළවරෙහි ඇති) ශබ්ද තවත් ආකාරයකින් ද වරනැගෙත්. සමාන අන්තයක් ඇති ශබ්ද ද ඇතැම්විට වෙනස් ලෙස වරනැගෙත්.

පුරිස ශබ්දයේ අග ස – යන්නේ තියෙන සවරය අ – යන්නයි. එබැවින් එය අකාරාන්ත ශබ්දයකැයි කියනු ලැබේ. ඉකාරාන්තාදිය ද මේ ක්‍රමයෙන් දතයුතුයි. (ඇස්) දත් ආදී වශයෙන් හල් අකුරු අන්තයෙහි ඇති ශබ්ද පාලියෙහි නැත්තාහ.)

පුරිස ශබ්දය පුල්ලිංගයෙහි වූ අකාරාන්ත ශබ්දයෙකි. එය යට දක්වූ විභක්තිවල ද වචනවල ද වරනැගෙන ආකාරය මෙසේයි:

| | විභක්ති | | එකවචන | බහුවචන |
|---|---|---|---|---|
| 1. | පඨමා | : | පුරිසො | පුරිසා |
| 2. | දුතියා | : | පුරිසං | පුරිසෙ |
| 3. | තතියා | : | පුරිසෙන | පුරිසෙභි: පුරිසෙහි |
| 4. | චතුත්ථී | : | පුරිසාය: පුරිසස්ස | පුරිසානං |
| 5. | පඤ්චමී | : | පුරිසා: පුරිසම්හා: පුරිසස්මා | පුරිසෙභි: පුරිසෙහි |
| 6. | ඡට්ඨී | : | පුරිසස්ස | පුරිසානං |
| 7. | සත්තමී | : | පුරිසෙ: පුරිසම්හි: පුරිසස්මිං | පුරිසෙසු |
| 8. | කරණ | : | පුරිසෙන | පුරිසෙභි: පුරිසෙහි |
| 9. | ආලපන | : | (හෙ) පුරිස: (හෙ) පුරිසා | (හෙ) පුරිසා |

**විභක්තිවලට නැගීම සඳහා මේ ශබ්දයට එක් කරන ලද කොටස් නම්:**

| | එකවචන | බහුවචන |
|---|---|---|
| 1. | ඔ | ආ |
| 2. | අං | ඒ |
| 3. | ඒන | ඒහි: ඒභි |
| 4. | ආය: ස්ස | ආනං |
| 5. | ආ: ම්හා: ස්මා | ඒහි: ඒභි |
| 6. | ස්ස | ආනං |
| 7. | ඒ: ම්හි: ස්මිං | ඒසු |
| 8. | ඒන | ඒහි: ඒභි |
| 9. | අ: ආ | ආ |

යන මොහු වෙති. (මේවා පාලියේ විභක්ති ප්‍රත්‍යයයි නො සැලකියයුතු. නොයෙක් ආදෙශාදිය කොට පද සැදුන පසු තිබෙන අකුරු වෙන්කොට ශිෂ්‍යයන්ගේ අවබොධය පිණිස මෙහි දක්වන ලදී. පුරිස ශබ්දයේ අන්තයෙහි අකාරය බොහෝ විට මැකී යයි.)

**පුරිස ශබ්දයේ ඒ ඒ විභක්ති වචනවල සිංහල තේරුම පිළිවෙලින් මෙසේ දතයුතු:-**

| | | එකවචන | බහුවචන |
|---|---|---|---|
| 1. | ප්‍රථමා | පුරුෂ තෙම | පුරුෂයෝ |
| 2. | ද්විතීයා (කර්ම) | පුරුෂයා | පුරුෂයන් |
| 3. | තෘතීයා (කර්තෘ) | පුරුෂයා විසින් | පුරුෂයන් විසින් |
| 4. | චතුර්ථී (සම්ප්‍රදාන) | පුරුෂයාට | පුරුෂයන්ට |
| 5. | පඤ්චමී (අවධි) | පුරුෂයා කෙරෙන් | පුරුෂයන් කෙරෙන් |
| 6. | ෂෂ්ඨී (සම්බන්ධ) | පුරුෂයාගේ | පුරුෂයන්ගේ |
| 7. | සප්තමී (ආධාර) | පුරුෂයා කෙරෙහි | පුරුෂයන් කෙරෙහි |
| 8. | කරණ | පුරුෂයා කරණකොට | පුරුෂයන් කරණකොට |
| 9. | ආලපන | (එම්බා) පුරුෂය | (එම්බා) පුරුෂයිනි |

**මේ පුරිස ශබ්දය මෙන් වරනැගෙන ශබ්දවලින් සමහරක්:**

| | | | |
|---|---|---|---|
| බුද්ධ | - බුදුරජ | කස්සක | - ගොවියා |
| ධම්ම | - ධර්මය | කම්මකාර | - කම්කරුවා |
| සංඝ | - සංඝයා | ගොපාල | - ගොපල්ලා |
| මනුස්ස | - මිනිසා | රජක | - රදවා |
| දෙව | - දෙවියා | දස | - දසයා |
| වාණිජ | - වෙළෙන්ද | පුත්ත | - පුත්‍රයා |
| ලේඛක | - ලියන්නා | කුමාර | - කුමරා; ළමයා |
| චොර | - සොරා | හත්ථ | - අත |
| මිත්ත | - මිතුරා | පාද | - පය |
| භූපාල | - රජ | කාය | - කය; සිරුර |

## අභ්‍යාසය 1.

**සිංහලට නැගියයුතු:**

1. මනුස්සානං. 2. දෙවෙ. 3. හත්ථං. 4. පාදම්හි. 5. කායෙන. 6. බුද්ධෙසු. 7. ධම්මො. 8. සංඝම්හා. 9. කුමාරස්ස. 10. භූපාලෙහි 11. වාණිජාය. 12. මිත්තස්මිං. 13. ලෙඛකානං. 14. දසම්හි. 15. ගොපාලෙන 16. පුත්තෙහි. 17. පාදං. 18. දසො. 19. කස්සකා. 20. රජකෙසු.

**පාලියට නැගියයුතු:**

1. දෙවියාගේ. 2. මිනිසුන් කෙරෙහි. 3. අත්වල. 4. පාවලින්. 5. රජුන්ගේ. 6. ළමයාට. 7. බුදුවරු. 8. ධර්මයෙහි. 9. සංඝයාගේ. 10. පුත්‍රයා කෙරෙන්. 11. දසයන්ට. 12. සොරා විසින්. 13. මිත්‍රයන්ට. 14. පයේ. 15. ලියන්නන් විසින්. 16. ගොවියා කෙරෙහි. 17. ගොපල්ලන්. 18. වෙළෙන්ද. 19. කම්කරුවා කෙරෙන්. 20. මිනිසා විසින්.

**පුරිස ශබ්දයට සමාන තවත් ශබ්ද**

| | | | |
|---|---|---|---|
| අස්ස | = අශ්වයා | ගාම | = ගම |
| ගොණ | = ගොනා | රුක්ඛ | = ගස |
| සුනඛ | = බල්ලා | චන්ද | = හඳ |
| සීහ | = සිංහයා | සූරිය | = හිර |
| මිග | = මුවා | පාසාණ | = ගල |
| අජ | = එළුවා | ලොක | = ලොව |
| වානර | = වඳුරා | ආලොක | = එළිය |
| සකුණ | = පක්ෂියා | මඤ්ච | = ඇඳ |
| කාක | = කාක්කා | ආකාස | = අහස |
| වරාහ | = ඌරා | මග්ග | = මාර්ගය |

## අභ්‍යාසය 2.

**සිංහලට නැගියයුතු:**

1. පුරිසස්ස ගොණා. 2. මනුස්සානං හත්ථා. 3. බුද්ධස්ස ධම්මො. 4. ආකාසම්හි සකුණා. 5. ගාමෙ මනුස්සා. 6. අස්සානං පාද. 7. ලොකම්හි රුක්ඛා. 8. භූපාලානං දීපා. 9. පාසාණෙ සීහො. 10. මඤ්චස්මිං කුමාරො. 11. ආකාසෙ සූරියො. 12. දීපස්ස ආලොකො. 13. රුක්ඛෙසු වානරා. 14. භූපාලස්ස අස්සො.

**පාලියට නැගියයුතු:**

1. එළුවාගේ පාදයෝ. 2. වඳුරන්ගේ අත්වලින්. 3. සිංහයාගේ ශරීරය. 4. ගමේ ළමයි. 5. අහසෙහි හඳ. 6. ගල උඩ බල්ලාගේ. 7. ඇඳ උඩ මිනිසා. 8. හිරුගේ එළියෙන්. 9. ගසෙහි පක්ෂීහු. 10. මිනිසාගේ ගම. 11. ලෝකයේ දිවයින්. 12. ගොනාගේ පාවලින්. 13. බුදුන්ගේ ධර්මයෙහි. 14. රජුගේ ගම්වල. 15. මාර්ගයෙහි අශ්වයෝ.

(ශිෂ්‍යයන් ලවා මෙහි පෙනෙන ශබ්ද කීපයක් පුරිස ශබ්දය මෙන් වරනැඟවීම ද, මේ අභ්‍යාසයෙහි නොදක් වූ වචන දී ඔවුන්

ලවා සිංහලට හා පාලියට පරිවර්තනය කරවීම ද ගුරුවරයා විසින් කටයුතු වේ.)

# ක්‍රියා විභාගය

## VERBS AND THEIR CONJUGATION

ගච්ඡති (=යේ යන්න ක්‍රියාපදයකැයි මුලදී කියන ලදී). ක්‍රියාවක් නැතිව වාක්‍යයක් සම්පාදනය කළහැකි නොවේ. එබැවින් මෙහිදී ක්‍රියා පිළිබඳ දතයුතු මූලික කරුණු ස්වල්පයක් දක්වනු ලැබේ.

10. පුරුෂයා දැන් යමින් සිටී නම් "යේ" හෝ "යයි" කියා ද, මින් පෙර ගියේ නම් "ගියේය" කියා ද, මතු කලෙක යන්නේ නම් "යන්නේය" කියා ද ව්‍යවහාර කරනු ලැබේ. එබැවින් ක්‍රියා පද

1. වත්තමාන (=දැන් පවත්නා) කාලය
2. අතීත (=ඉකුත්වගිය) කාලය
3. අනාගත (=නොපැමිණි) කාලය

යි තුනකට බෙදනු ලැබේ.

11. "පුරුෂයා යේ" යයි කියහැකි නමුත් "මම යේ," "තෝ යේ" යි කියහැකි නො වේ. එබැවින් ක්‍රියාව කරන්නා කවරෙක් දැයි දනගැන්මට ක්‍රියා පදය වෙනස් කොට යෙදිය යුතු වේ. ඒ වෙනස් කිරීම පුරිස (=පුරුෂ) යන්නෙන් හඳුන්වනු ලැබේ.

එනම්:–

1. පඨම පුරිස (=අන්‍යකාරක) 3rd person
2. මජ්ඣිම පුරිස (=තශබ්දකාරක) 2nd person
3. උත්තම පුරිස (=මශබ්දකාරක) 1st person

යන තුනයි. මජ්ඣිම පුරිස නම් ත්වං (=තෝ), තුම්හෙ (=තෙපි) යන දෙකයි. ඒ දෙක සම්බන්ධව කියවෙන ක්‍රියා මජ්ඣිම පුරිසයෙහි වේ. උත්තම පුරිසය නම් අහං (=මම) මයං, අම්හෙ

(=අපි) යන මොහු යි. ඒවා පිළිබඳ ව යෙදෙන ක්‍රියා ද උත්තම පුරිසයෙහි වේ. සො (=හෙතෙම) අඤ්ඤො (=අනිකෙක්) මනුස්සො (=මිනිසා) ගොණො (=ගොනා) මේ ආදීවූ මජ්ඣිම උත්තම පුරිස දෙකට අයත් නොවූ සියලු ම කර්තෘ පද පඨම පුරිසයෙහි වැටේ.

12. එක් අයකු පිළිබඳව යෙදෙන ක්‍රියාව එක වචනයෙන් ද, ඊට වැඩි දෙනෙකුන් පිළිබඳව යෙදෙන ක්‍රියාව බහු වචනයෙන්ද යෙදිය යුතු බැවින් එකවචන බහුවචන භෙදයත් ක්‍රියාවන්හි ඇතැයි දතයුතුයි.

**සංලක්ෂ්‍යය:**

ක්‍රියාවක් වරනැගීමේදී කාල ද, පුරුෂ ද, (ඒක, බහු වචන ද) යෙදිය යුතුය. (කර්තෘකාරක කර්මකාරකාදී භෙද පසුව විස්තර කරනු ලැබේ.) නාමයක් වරනැගෙන්ට පෙර ඊට "ශබ්ද" යයි කියනු ලැබේ. ක්‍රියාවක් වරනැඟෙන්ට පෙර (මුලින් සිටි ආකාරය) ධාතු යයි කියනු ලැබේ.

# වර්තමාන ක්‍රියා

## PRESENT TENSE

පච - ධාතුව පිසීමෙහි වැටේ.

එය වත්තමාන කාලයෙහි (කත්තුකාරකයෙහි) මෙසේ වරනැගේ:

| | එකවචන | බහුවචන |
|---|---|---|
| 3rd පඨම පුරිස : | පචති (=පිසේ; පිසයි) | පචන්ති (පිසත්) |
| 2nd මජ්ඣිම පුරිස : | පචසි (=පිසෙහි) | පචථ (පිසවු; පිසහු) |
| 1st උත්තම පුරිස : | පචාමි (=පිසමි) | පචාම (පිසමු) |

මෙහි පඨම පුරිස එකවචනයෙහි ති යන්න ද, බහු වචනයෙහි න්ති යන කොටස ද, මධ්‍යම පුරුෂ එක බහු වචන දෙක්හි පිළිවෙලින් සි - ථ දෙක ද, උත්තම පුරුෂයෙහි මි - ම දෙක ද යෙදී තිබෙත්. උත්තම පුරුෂයෙහි පමණක් පච යන්නේ අන්තයෙහි අ - කාරය ආ - කාරයක් වී තිබේ.

**මීට සමාන ලෙස වරනැගෙන ක්‍රියා ස්වල්පයක්:**

| | | | |
|---|---|---|---|
| ගච්ඡති | = යයි | පස්සති | = බලයි; දකී |
| තිට්ඨති | = සිටී | හරති | = ගෙනයයි |
| නිසීදති | = හිඳී | ධාවති | = දුවයි |
| සයති | = නිදයි | ලිඛති | = ලියයි |
| කීළති | = ක්‍රීඩාකරයි | වසති | = වසයි |
| ඛාදති | = කයි | ආහරති | = ගෙන ඒ |
| භුඤ්ජති | = අනුභව කරයි | ආරුහති | = නගී |
| භාසති | = කියයි | යාචති | = ඉල්වයි |
| චරති | = හැසිරේ | ඛණති | = සාරයි |
| ධොවති | = සෝදයි | කසති | = සීසායි |

හවති = වේ

## අභ්‍යාසය 3.

**සිංහලයට නැගියයුතු:**

1. බුද්ධො තිට්ඨති. 2. මිගා ධාවන්ති. 3. සීහා සයන්ති. 4. පුරිසො ගච්ඡති. 5. රජකා ධොවන්ති. 6. කස්සකා කසන්ති. 7. ලෙඛකො ලිඛති. 8. දාසො චරති, 9. මච්ඡා සයන්ති. 10. දීපෙ ජාලෙන්ති. 11. රුක්ඛෙ ආරුහන්ති. 12. වරාහො ඛණති. 13. සුනඛා භුඤ්ජන්ති. 14. අස්සො ධාවති. 15. අජා සයන්ති. 16. කම්මකාරා ආහරන්ති. 17. වාණිජා නිසීදන්ති. 18. ගොපාලො භුඤ්ජති. 19. ගොණා ඛාදන්ති. 20. වානරෝ රුක්ඛං ආරුහති.

**පාලියට නැගියයුතු:**

1. බල්ලා අනුභව කරයි. 2. වඳුරෝ නගිත්. 3. ඌරෝ දුවත්. 4. දාසයා ගෙනයයි. 5. කම්කරුවෝ පිසත්. 6. එළුවෝ සිටිත්. 7. වෙළෙන්ඳ ඇවිදී. 8. රදවා සෝදයි. 9. මුවා සිටියි.

10. ගොන්නු සීසාත්. 11. ගොවියා සාරයි. 12. මිනිසාගේ අශ්වයා. 13. කම්කරුවාගේ ගම. 14. ගොපල්ලාගේ ගොන්නු. 15. ලියන්නා පහනක් ගෙනයයි. 16. මිනිස්සු ඇඳන්වල නිදත්. 17. සිංහයෝ මුවන් කත්. 18. දසයෝ ගසට නැගෙත්. 19. සොරු ගමේ ඇවිදිත්. 20. ගොපල්ලා ගොනා ගෙන ඒ.

**සංලක්ෂ්‍යය:**

මේ අභ්‍යාසයෙහි යොද තිබෙන සියලුම ක්‍රියාපද පඨම පුරිසයට ඇතුළත් වේ. මජ්ඣිමපුරිස ක්‍රියාපද අතුරෙන් ඒක වචනය ත්වං (=තෝ) යන්න සමග ද, බහු වචනය තුම්හෙ (=තෙපි) යන්න සමග ද යෙදිය හැකි වේ. අන්කිසි පදයක් කර්තෘ වී සිටි විට නොයෙදිය හැකි වේ. උත්තමපුරිස එකවචනය අහං (=මම) යන්න සමග ද බහු වචනය අම්හෙ, මයං, (=අපි) යන දෙක සමග ද යෙදිය හැකි වේ. අන් පදයන් හා යෙදිය හැකි නොවේ. එබැවින් දෙවෙනි තුන්වෙනි පුරුෂ දෙකෙහි මේ වචන පස පමණක් යෙදේ යයි ද භාෂාවේ තිබෙන ඉතිරි නාමපද සියල්ල (ප්‍රථමා විභක්තියෙන් සිට) පඨම පුරිසයෙහි යෙදේ යයි ද සැලකිය යුතු.

## අභ්‍යාසය 4.

**සිංහලයට නැගියයුතු:**

1. මනුස්සා සුරියං පස්සන්ති. 2. ගොණා පාසාණෙ තිට්ඨන්ති. 3. වාණිජො ගාමෙ චරති. 4. සකුණො රුක්ඛෙ නිසීදති. 5. බුද්ධො ධම්මං භාසති. 6. අහං දීපං ආහරාමි. 7. මයං ගොණෙ හරාම. 8. සංඝො ගාමං ගච්ඡති. 9. ත්වං සීහං පස්සසි. 10. භූපාලා අස්සෙ ආරුහන්ති. 11. දෙවා ආකාසෙන ගච්ඡන්ති. 12. අස්සා දීපෙසු ධාවන්ති. 13. ත්වං පාදෙහි චරසි. 14. තුම්හෙ හත්ථෙහි හරථ. 15. මයං ලොකෙ වසාම.

**පාලියට නැගියයුතු:**

1. අශ්වයා ගල උඩ සිටී. 2. එළුවෝ ගමෙහි ඇවිදිත්. 3. තෙපි හිරු දකිවු. 4. හඳ අහසෙහි තහී. 5. මිනිස්සු ඇඳන්වල

නිදත්. 6. ගොන්නු සිංහයා කෙරෙන් දුවත්. 7. මම ලෝකයෙහි වසමි. 8. තෝ පහනක් ගෙනෙහි. 9. අපි දූපතක වසමු. 10. රජ සිංහයකු බලයි. 11. දේවතාවා අහසෙහි යයි. 12. වඳුරා ඌරා සමග* සෙල්ලම් කරයි. 13. අපි මිනිසුන්ගේ ශරීරයන් බලමු. 14. තෝ ගසෙහි පක්ෂියා දක්නෙහි.

# ධාතු කොටස්

13. නාමයන්ගේ වරනැගීම ලිඞ්ග වශයෙන් හා අන්ත වශයෙන් වෙනස් වේ. ක්‍රියාවන්ගේ වරනැගීම ඒ ඒ ධාතු කොටස් වශයෙන් වෙනස් වේ. ධාතූන්ගේ සියලු කොටස් පිළිබඳ විස්තරයක් දැක්වීමට මෙය අවස්ථාව නොවේ. එබැවින් මුලින් දැක්වූ භූ ධාතු කොටස හැර බහුල ව්‍යවහාරයෙහි පැමිණෙන තවත් කොටස් දෙකක් මෙහි දක්වනු ලැබේ.

චුරාදිගණ නම් කොටසට අයත් ධාතූහු රූප දෙකකින් වරනැගෙත්; රැකීම් අර්ථ ඇති පාල ධාතුවට පාලෙ, පාලය යන රූප දෙකකි; එය මෙසේ වර නැගේ:–

| | | එකවචන | බහුවචන |
|---|---|---|---|
| පඨම | : | පාලෙති (= රකී) | පාලෙන්ති (= රකිත්) |
| මජ්ඣිම | : | පාලෙසි (= රකිහි) | පාලෙථ (= රකිවු) |
| උත්තම | : | පාලෙමි (=රකිමි) | පාලෙම (=රකිමු) |
| | | | |
| පඨම | : | පාලයති (= රකී) | පාලයන්ති |
| මජ්ඣිම | : | පාලයසි | පාලයථ |
| උත්තම | : | පාලයාමි | පාලයාම |

* සමග යන අර්ථය තතියාව යෙදීමෙන් ලැබේ.

**මීට සමානසේ වරනැගෙන ක්‍රියාවලින් සමහරක්:**

| | | | |
|---|---|---|---|
| ජාලෙති | = දල්වයි | චින්තෙති | = සිතයි |
| මාරෙති | = මරයි | පූජෙති | = පුදයි |
| චොරෙති | = සොරකම් කරයි | පීළෙති | = පෙළයි |
| දෙසෙති | = දේශනා කරයි | උදෙති | = උදවෙයි |
| ඨපෙති | = තබයි | උඩ්ඩෙති | = පියාඹයි |
| ඔලොකෙති | = බලයි | ඡාදෙති | = වසයි |

14. තවත් කොටසක් මීට වෙනස් ව වරනැගේ.

## වි පුර්ව කී ධාතුව

| | | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|---|
| පඨම | : | වික්කිණාති | (=විකුණයි) | වික්කිණන්ති | (=විකුණත්) |
| මජ්ඣිම | : | වික්කිණාසි | (=විකුණහි) | වික්කිණාථ | (=විකුණහු) |
| උත්තම | : | වික්කිණාමි | (=විකුණමි) | වික්කිණාම | (=විකුණමු) |

| | | | |
|---|---|---|---|
| කිණාති | = මිළයට ගනී | මිණාති | = මනී |
| ජානාති | = දනී | ජිනාති | = දිනයි |
| ගණ්හාති | = ගනී | උග්ගණ්හාති | = උගනී |
| සුණාති | = අසයි | ඔචිනාති | = කඩා රැස්කරයි |

යනාදිය මීට සමානසේ වරනැගේ.

# අභ්‍යාසය 5.

**සිංහලයට නැගියයුතු:**

1. පුත්තො ධම්මං උග්ගණ්හාති. 2. මිත්තා සීහෙ ඔලොකෙන්ති. 3. චොරා අස්සෙ ගණ්හන්ති. 4. මනුස්සා සකුණෙ කිණන්ති. 5. ගොපාලො ගොණෙ වික්කිණාති 6. බුද්ධො ධම්මං දෙසෙති. 7. සීහො මිගෙ මාරෙති. 8. වාණිජස්ස පුත්තා අජෙ වික්කිණන්ති. 9. මයං වාණිජ මහාමච්චෙ කිණාම. 10. ලෙඛකො මිත්තෙන මග්ගෙ ගච්ඡති. 11. දාසා මිත්තානං දූතකෙ හරන්ති. 12. කාකා ආකාසෙ උඩ්ඩෙන්ති. 13. අහං බුද්ධං පූජෙමි. 14. ත්වං දීපං ජාලෙහි 15. මයං ධම්මං ජානාම. 16. දාසො මග්ගෙ කස්සකං ඔලොකෙති. 17. තුම්හෙ බුද්ධස්ස ධම්මං සුණාථ. 18. චොරා මනුස්සානං අස්සෙ චොරෙන්ති. 19. පුරිසො හත්ථෙන දීපං ගණ්හාති. 20. චන්දෙ පබ්බතා උදෙති.

**පාලියට නැගියයුතු:**

1. සොරා ගොනෙකු සොරකම් කරයි. 2. ලියන්නාගේ පුතා අශ්වයෙකු මිළදී ගනී. 3. ගොවියාගේ පුත්‍රයෝ ධර්මය උගනිත්. 4. වෙළෙන්දෝ පහන් විකුණත්. 5. ගොවියා ගොනුන් මිළට ගනී. 6. මිත්‍රයාගේ පුතා ගමෙහි ඉගෙනගනී. 7. රජ දිවයින පාලනය කරයි. 8. අපි වෙළෙන්දගේ පුතා දකිමු. 9. වඳුරෝ පක්ෂීන් පෙළත්. 10. මිනිසාගේ අත් (දෙස) බලව. 11. සොරු ලෝභයෙන් එළුවන් සොරකම් කරත්. 12. දාසයෝ ළමයින්ට ආහාර ගෙනෙත්. 13. අපි බුදුන්ගේ ධර්මය අසමු. 14. තෙපි සංඝයාට පූජා කරවු. 15. ළමයා මිත්‍රයාගේ බල්ලා ගෙන එයි. 16. හොරු මාර්ගයේදී මිනිසුන් මරත්. 17. ළමයි ගමෙහි සෙල්ලම් කරත්. 18. කම්කරුවෝ පහන් දල්වත්. 19. අශ්වයෝ ගමෙන් දුවත්. 20. සිංහයෝ මුවන් මරත්.

## අභ්‍යාසය 6.

**අඩුතැන් ක්‍රියාපද දමා පිරවිය යුතු:-**

| | | |
|---|---|---|
| කාකා .................... | වරාහා .......................... | ගොණා ............ |
| දසො ..................... | ලෙඛකා ......................... | සූනඛො ............ |
| අස්සා .................... | පණ්ඩිතා ....................... | මිත්තා ............... |
| වාණිජො ................ | රජකො .......................... | පුත්තො ............. |

**මේ ක්‍රියාවලට නාමපද යෙදිය යුතු:-**

| | | |
|---|---|---|
| ................ තිට්ඨන්ති | ........................... භණන්ති | ........... ආරුහති |
| ................ නිසීදන්ති | ........................ භුඤ්ජන්ති | .............. පචති |
| ...................... සයති | ............................. ධාවති | ................ මරති |

**අඩුතැන් කම්පද යොද පිරවිය යුතු:-**

1. පුරිසො ........................ ගච්ඡති
2. සීහා ................ මාරෙන්ති
3. දසා ......................... ආහරන්ති
4. පුත්තො ...... උග්ගණ්හාති
5. චොරො .......................... හරති
6. වරාහො ................ භණති
7. වාණිජා ............... වික්කිණන්ති
8. කුමාරො ....... ඔලොකෙති

**15. පුල්ලිඞ්ගයෙහි ඉකාරාන්ත අග්ගි ශබ්දය මෙසේ වරනැගේ:-**

පඨමා : අග්ගි (=ගින්න)

අග්ගී, අග්ගයො (=ගිනි)

දුතියා : අග්ගිං (=ගින්න)

අග්ගී, අග්ගයො (=ගිනි)

තතියා : අග්ගිනා (=ගින්න විසින්)

අග්ගිහි, අග්ගීහි (=ගිනි විසින්)

චතුත්ථී : අග්ගිනො, අග්ගිස්ස (=ගින්නට)
අග්ගීනං (=ගිනිවලට)

පඤ්චමී : අගිනා, අග්ගිම්හා, අග්ගිස්මා (=ගින්න කෙරෙන්)
අග්ගීභි, අග්ගීහි (=ගිනිකෙරෙන්)

ඡට්ඨී : අග්ගිනො, අග්ගිස්ස (=ගින්න ගේ)
අග්ගීනං (=ගිනිවල)

සත්තමී : අග්ගිම්හි, අග්ගිස්මිං (=ගින්නෙහි)
අග්ගිසු, අග්ගීසු (=ගිනිවල හෝ ගිනිකෙරෙහි)

කරණ : අග්ගිනා (=ගින්න කරණකොට)
අග්ගීභි, අග්ගීහි (= ගිනි කරණකොට)

ආලපන : (හෙ) අග්ගි (=එම්බා ගින්න)
(හෙ) අග්ගි, අග්ගියො (=එම්බා ගිනි)

**මීට සමාන ලෙස වරනැගෙන ශබ්දවලින් සමහරක්:**

| | | | |
|---|---|---|---|
| මුනි | = භික්ෂුව | අරි | = සතුරා |
| ඉසි | = ඍෂියා | අහි | = සර්පයා |
| මණි | = මැණික | කපි | = වඳුරා |
| ගිරි | = පර්වතය | අසි | = කඩුව |
| කවි | = පණ්ඩිතයා | දීපි | = දිවියා |
| අතිථි | = ආගන්තුකයා | රවි | = හිරු |
| ගහපති | = ගෘහපතියා | කුච්ඡි | = කුස; බඩ |
| භූපති | = රජ | උද්ධි | = සාගරය |
| සාරථී | = රථාචාර්යයා | ජලනිධි | = මුහුද |
| අධිපති | = අධිපතියා | නිධි. | = නිධානය |
| පති | = ස්වාමියා | වීහි | = වී |

| | | | |
|---|---|---|---|
| පාණි | = අත | ඤාති | = නෑයා |
| ව්‍යාධි | = රෝගය | රාසි | = සමූහය, ගොඩ |
| මුට්ඨි | = මීට | යට්ඨි | = සැරයටිය |

# අතීත ක්‍රියා

## PAST TENSE

16. පච ධාතුව අතීත කාලයෙහි (කත්තුකාරකයෙහි) මෙසේ වරනැගේ:–

පඨම : ඒකවචන: අපචි: පචි (=පිසුවේය, හෝ පිසී)
බහුවචන: අපචිංසු: පචිංසු, අපචුං: පචුං (=පිසූහ)

මජ්ඣිම : ඒකවචන: අපචෝ: පචෝ (=පිසුවෙහි)
බහුවචන: අපචිත්ථ: පචිත්ථ (=පිසුවහු)

උත්තම : ඒකවචන: අපචිං: පචිං (=පිසුවෙමි, පිසීමි)
බහුවචන: අපචිම්හ: පචිම්හ: අපචිම්හා: පචිම්හා (=පිසුවෙමු)

| | | | |
|---|---|---|---|
| ගච්ඡි | = ගියේය | ගමි | = ගියේය |
| යාචි | = ඉල්ලුවේය | චරි | = හැසුරුණේය |
| පහරි | = ගැසුවේය | නිසීදි | = හුන්නේය |
| ගණ්හි | = ගත්තේය | සයි | = නිදගත්තේය |
| දදි | = දුන්නේය | ධාවි | = දිව්වේය |
| හරි | = ගෙන ගියේය | කරි | = කෙළේය |
| ඛාදි | = කෑවේය | වික්කිණි | = විකුණුවේය |
| ඡින්දි | = කැපුවේය | කිණි | = මිළට ගත්තේය |
| භඤ්ජි | = කැඩුවේය | ඩසි | = දෂ්ට කෙළේය |
| ආරුහි | = නැංගේය | අහවී | = විය |

ආදිය මීට සමානව වරනැගේ. වර්තමාන කාලයට උදහරණ වශයෙන් දැක්වූ මුල් කොටසේ ක්‍රියා අතුරෙන් 'තිට්ඨති' යන්න

හැර ඉතිරි සියල්ල අතීතයෙහි මෙසේ වරනැගේ. 'ආහරති' ආදි ස්වරයක් මුලින් ඇති පදයන්ට 'අපචි' ආදි තන්හි වැඩිවන අ කාරය නො යෙදේ.

**සිංහලට නැගියයුතු:**

1. මුනි ධම්මං අභාසි. 2. ගහපතයො විහිං මිණිංසු. 3. අහි අධිපතිනො හත්ථං ඩසි. 4. කවි පාණිනා මණිං ගණ්හි. 5. දීපයො ගිරිම්හි චරිංසු. 6. අරි අසිනා ගොණං පා හරි. 7. කවයො දීපම්හි නිධි ඛණිංසු. 8. තුම්හෙ අත්ථීනං කපයො දදිත්ථ. 9. මුනයො අධිපතීනං ගාමං ගච්ඡිංසු. 10. කපි අහිනො කුච්ඡිං පහරි. 11. ගහපතිස්ස කුමාරො උද්ධිං අගච්ඡි. 12. අධිපති කවීනංමණයො අදදි. 13. කපයො හත්ථෙහි රුක්ඛෙ ආරුහිංසු. 14. භූපතිනො අස්සො මග්ගෙ ධාවි. 15. චොරා අධිපතිනො නිධිං හරිංසු.

**පාලියට නැගියයුතු:**

1. දිවියෝ මුවන් කෑහ. 2. මුනීහු පර්වතයෙන් ගමට ආහ. 3. සර්පයෝ මිනිසුන් දෂ්ට කළහ. 4. ගෘහපතියාගේ වී සතුරෝ ගෙන ගියහ. 5. පණ්ඩිතයන්ගේ මැණික් වෙළෙන්දෝ ගත්හ. 6. මිත්‍රයා ආගන්තුකයාට අශ්වයකු දුන්නේය. 7. ස්වාමීහු අධිපතීන්ගේ ගම්වල හැසුරුණාහ. 8. මුනීහු ගම්වල මිනිසුන්ට ධර්මය කීහ. 9. ගෘහපතියා සතුරාගේ අත කැපුවේය. 10. ස්වාමි පුරුෂයා ආගන්තුකයන්ට වී දුන්නේය. 11. රජතෙම සොරුන්ගේ කඩු ගත්තේය. 12. කාක්කා ගසෙන් අහසට නැංගේය. 13. ගස උඩ වඳුරෝ දිවියාට ගැසූහ. 14. ගොවියාගේ පුත්‍රයා වී රාශියක්[1] මැන්නේය. 15. රජුගේ අතෙහි කඩුවක් තිබේ. (=අත්ථි හෝ භවති)

---

1. වීහි ශබ්දයේ ෂෂ්ඨී බහු වචනය සමග රාශි ශබ්දයේ ද්‍විතියා එක වචනය යෙදිය යුතු.

**17. චුරාදිගණික ධාතු කොටස අතීතයෙහි මෙසේ වරනැගේ:-**

පඨම :

එකවචන: පාලෙසි: පාලයි (=රැක්කේය; පාලනය කෙළේ)

බහුවචන: පාලසුං: පාලයිංසු (=රැක්කාහ; පාලනය කළහ)

මජ්ඣිම :

එකවචන: පාලයො (රැක්කෙහි)

බහුවචන: පාලයිත්ථ (=රැක්කාහු)

උත්තම :

එකවචන: පාලයිං: පාලෙසිං (=රැක්කෙමි)

බහුවචන: පාලයිම්හ: පාලයිම්හා (=රැක්කෙමි)

**මීට සමානවූ අන්‍ය ක්‍රියා සවල්පයක්:-**

| | | | |
|---|---|---|---|
| මාරෙසි | = මැරුවේය | පීළෙසි | = පෙළුවේය |
| ජාලෙසි | = දැල්විය | කථෙසි | = කීවේය |
| දෙසෙසි | = දේශනා කෙළේය | පාතෙසි | = හෙළුවේය |
| චොරෙසි | = සොරකම් කෙළේය | ඨපෙසි | = තැබුවේය |
| ආනෙසි | = ගෙනාවේය | නෙසි | = ගෙන ගියේය |
| චින්තෙසි | = සිතුවේය | පූජෙසි | = පිදුවේය |

**පඨම පුරිසයෙහි**

කර – ධාතුවෙන් අකාසි (=කෙළේය), අකංසු (= කළහ)

දා – ධාතුවෙන් අදාසි (=දුන්නේය), අදංසු (=දුන්හ)

ඨා – ධාතුවෙන් අට්ඨාසි (=සිටියේය), අට්ඨංසු (=සිටියහ)

ගමු – ධාතුවෙන් අගමාසි (=ගියේය), අගමංසු (=ගියහ)

යන පද සෑදෙන බව සැලකිය යුතු.

# අභ්‍යාසය 8.

**සිංහලට නැගියයුතු:**

1. මුනයො මඤ්චසු නිසීදිංසු. 2. අහං දීපම්හි අචරිං. 3. චොරා ගහපතිනො නිධිං චොරෙසුං. 4. මයං භූපතිනො අසිං ඔලොකයිම්හ. 5. ත්‍වං අත්ථිනො ආහාරං දදෙ. 6. අධිපති වාණිජම්හා මණයො කිණි. 7. පති කස්සකං විහිං යාචි 8. ඉසයො කවීනං ධම්මං දෙසෙසුං. 9. කපයො ගිරිම්හා රුක්ඛං ධාවිංසු. 10. වාණිජා උද්ධිම්හි ගච්ඡිංසු. 11. මයං මග්ගෙන ගාමං ගච්ඡිම්හ. 12. දීපං කපිං මාරෙසි. 13. තුම්හෙ පතිනො දීපෙ ගණ්හිත්‍ථං. 14. අහං බුද්ධස්ස පාදෙ පූජෙසිං. 15. කවයෙ කපීනං ආහාරං දදිංසු. 16. අරයො අසිං ආනෙසුං. 17. අහි කපිනො පාණිං ඩසි. 18. මයං ගිරිම්හා වන්‍දං පස්සාම. 19. තුම්හෙ මුනීනං ආහාරං දදිත්‍ථ. 20. භූපති නිධයො පාලෙසි.

**පාලියට නැගියයුතු:**

1. දසයා කඩුවකින් සතුරාට ගැසුවේය. 2. අපි ගෘහපතියාට ආහාර දුනිමු. 3. හෙතෙම (=සො) පර්වතයෙන් වඳුරකු ගෙනාවේය. 4. වෙළෙන්දෝ මාර්ගයෙන් ගමට ගියාහුය. 5. පක්ෂීහු ගසෙන් අහසට නැංගහ. 6. සොරු රජුගේ මැණික් සොරකම් කළහ. 7. මම ස්වාමීන්ට ආහාර දුනිමි. 8. පණ්ඩිතයාගේ පුත්‍රයෝ භික්ෂුවගෙන් ධර්මය ඇසූහ. 9. මම මාර්ගයෙහි දිවියකු දුටුවෙමි. 10. සිංහයා ගල උඩ මුවා මැරුවේය. 11. ඔවුහු (=තෙ) දිවයිනෙහි පර්වතය දුටුවාහ. 12. ළමයා මුහුදට ගියේය. 13. බල්ලෝ ගමට දිවූහ. 14. වෙළෙන්ද අධිපතියාගෙන් අශ්වයකු මිළයට ගත්තේය. 15. ආගන්තුකයා මිටින් මැණිකක් ගෙනාවේය. 16. වඳුරුතෙම සර්පයා කුසින් ඇල්ලුවේය. (=ගණ්හි) 17. ගෘහපතියා ඇඳක නිදගත්තේය. 18. ළමයා අත්වලින් වඳුරාට ගැසුවේය. 19. මම රජුගේ කඩුව දුටුවෙමි. 20. පණ්ඩිතයෝ ආහාර අනුභව කළහ.

# අම්හ - තුම්හ - ශබ්ද

## PERSONAL PRONOUNS

18. නිතර ව්‍යවහාරයට පැමිණෙන බැවින් අන්‍ය පුල්ලිංගික ශබ්දයන් දක්වන්නට පෙර "අම්හ තුම්හ" ශබ්ද දෙක වරනගන සැටි දක්වනු ලැබේ. මේ ශබ්ද දෙක ලිඟු වශයෙන් වෙනසක් නැතිව වරනැගෙන බැවින් අලිංගික ශබ්දයයි කියන ලදී. පුරුෂයකු "මම" ය කීවත්, ස්ත්‍රියක් "මම" ය කීවත් නපුංසකයකු "මම" ය කීවත් ශබ්දයාගේ වෙනස් වීමෙක් නැත.

අලිංගික **අම්හ ශබ්දය**

| | | |
|---|---|---|
| පඨමා : | එකවචනː | අහං (=මම) |
| | බහුවචනː | මයං, අම්හෙ (=අපි) |
| දුතියා : | එකවචනː | මං, මමං (=මා) |
| | බහුවචනː | අම්හාකං, අම්හෙ (=අපි) |
| තතියා : | එකවචනː | මයා, මෙ (=මා විසින්) |
| | බහුවචනː | අම්හෙභි, අම්හෙහි, නො (=අප විසින්) |
| චතුත්ථී : | එකවචනː | මම, මය්හං, මමං, මෙ (=මට) |
| | බහුවචනː | අම්හං, අම්හාකං, නො (=අපට) |
| පඤ්චමී : | එකවචනː | මයා (=මා කෙරෙන්) |
| | බහුවචනː | අම්හෙභි, අම්හෙහි (=අප කෙරෙන්) |
| ඡට්ඨී : | එකවචනː | මම, මය්හං, මමං, මෙ (=මාගේ) |
| | බහුවචනː | අම්හං, අම්හාකං, නො (=අපගේ) |
| සත්තමී : | එකවචනː | මයි (=මා කෙරෙහි) |
| | බහුවචනː | අම්හෙසු (=අප කෙරෙහි) |
| කරණ : | එකවචනː | මයා (=මා කරණකොට) |
| | බහුවචනː | අම්හෙභි, අම්හෙහි (= අප කරණකොට) |

අලිංගික **තුම්හ ශබ්දය**

ප: එකවචන: ත්වං, තුවං (=තෝ)

බහුවචන: තුම්හෙ (=තෙපි, තොපි)

දු: එකවචන: තං, තවං, තුවං (=තා)

බහුවචන: තුම්හාකං, තුම්හෙ, වො (=තොප)

ත: එකවචන: ත්වයා, තයා, තෙ (=තා විසින්)

බහුවචන: තුම්හෙහි, තුම්හෙභි, වො (=තොප විසින්)

ච: එකවචන: තව, තුය්හං, තෙ (=තව)

බහුවචන: තුම්හං, තුම්හාකං, වො (=තොපට)

ප: එකවචන: තයා (= තා කෙරෙන්)

බහුවචන: තුම්හෙහි, තුම්හෙභි (=තොප කෙරෙන්)

ඡ: එකවචන: තව, තුය්හං, තෙ (=තාගේ)

බහුවචන: තුම්හං, තුම්හාකං, වො (=තොපගේ)

ස: එකවචන: ත්වයි, තයි (= තා කෙරෙහි)

බහුවචන: තුම්හෙසු (=තොප කෙරෙහි)

ක: එකවචන: ත්වයා, තයා (=තා කරණකොට)

බහුවචන: තුම්හෙහි, තුම්හෙභි (= තොප කරණකොට)

**සංලක්ෂ්‍යය:**

(1) "අම්හ, තුම්හ" දෙකට ආලපනයක් නැත.

(2) මෙ, තෙ, වො, නො යන වචන වාක්‍යයක මුල නො යෙදිය යුතුයි.

# අභ්‍යාසය 9.

**සිංහලයට නැගියයුතු:**

1. අහං මය්හං පුත්තස්ස අස්සං අදදිං. 2. ත්වං අම්හාකං ගාමං ගච්ඡසි. 3. මයං තව හත්ථෙ පස්සාම. 4. මම පුත්තා ගිරිං ආරුහිංසු. 5. තුම්හාකං සුනඛා මග්ගෙ සයිංසු. 6. අම්හං මිත්තා චොරං අසිනා පහරිංසු. 7. තුම්හං දසා අරීනං අස්සෙ හරිංසු. 8. චොරො මම පුත්තස්ස මණයො චොරෙසි. 9. ඉසයො මය්හං ගෙහෙ (=ගෙයි) න වසිංසු. 10. කවි තව පුත්තානං ධම්මං දෙසෙසි. 11. අම්හෙසු කොධො නත්ථි (=නැත). 12. තුම්හෙ වාණිජස්ස අජෙ කිණිත්ථ. 13. මයං භූපතිනො මිගෙ වික්කිණිම්හ. 14. ගහපතිනො පුත්තො මං පහරි. 15. අධිපතිනො දසා මම ගොණෙ පහරිංසු. 16. අහං තුම්හාකං වීහිං න ගණ්හිං. 17. දීපි මිගම්හා න ධාවි. 18. තුම්හෙ අහයො මා[1] මාරෙථ. 19. මයං අතිථීනං ආහාරං පචාම. 20. කපයො මං ආහාරං යාචිංසු.

**පාලියට නැගියයුතු:**

1. මම මාගේ මැණික් වෙළෙන්දට වික්කෙමි. 2. අපි අපේ ගොන්නු දසයන්ට දුන්නෙමු. 3. තෙපි මාගෙන් කඩුවක් මිළදී ගත්තහු. 4. තෝ වඳුරන්ට අත්වලින් නො ගසව. 5. අධිපතියා පර්වතයෙන් සිංහයකු ගෙනාවේය. 6. භික්ෂු තෙම තොපට ධර්මය දෙසී. 7. අපි සර්පයන්ට ආහාර දුනිමු. 8. ගෘහපතියාගේ දසයෝ අපේ වී ගෙනගියහ. 9. උඹලා මූදට නො ගියහුය. 10. මාගේ මිටෙහි මැණික් නැත්තාහ. 11. පණ්ඩිතයාගේ පුතා බල්ලාට සැරයටියකින් ගැසුවේය. 12. අපගේ පුත්‍රයෝ ඍෂියා ගෙන් උගතිත්. 13. උඹේ වඳුරා ගහෙන් වැටුණේය. (=පති) 14. මාගේ බල්ලා මා සමග ගෙට (ගෙහං) ගියේය. 15. මාගේ පුත්‍රයාගේ පය සර්පයෙක් දෂ්ට කෙළේය. 16. දිවියා මාර්ගයේදී ගොනකු මැරුවේය. 17. අපි රජු ගේ කඩුව නො බැලුවෙමු. 18. මම මුවන් ළඟට නො ගියෙමි. 19. අපේ මිත්‍රයෝ සිංහයන් බැලූහ. 20. තෝ පණ්ඩිතයාගෙන් පක්ෂියකු මිළදී ගත්තෙහි.

---

1. ක්‍රියාවක් වැළැක්වීමට පාලියෙහි යෙදෙන්නේ 'මා' යන්නයි.

**සංලක්ෂ්‍යය:**

"නො ගසවූ" යන තැන "නො" යන්නට "මා" යනුද ඉතිරි තැන්හි "නො" යන්නට පාලියෙන් "න" යනු ද යෙදිය යුතු.

"මුවන් ළඟට" යන්නට මිග ශබ්දයේ ජට්ඨී බහු වචනය හා "සන්තිකං" යනු යොදනු.

අඩු තැන් **තුම්හ - අම්හ** ශබ්ද යෝග්‍ය ලෙස යොද පිරවිය යුතු:-

| | | |
|---|---|---|
| 1. ......................පචථ. | 5. ...........භුඤ්ජිත්ථ. | 9. .....නිසීදිම්හා. |
| 2. .......... වික්කිණිම්හ. | 6. ..............නිසීදසි. | 10. ............සයසි. |
| 3. ........................ අදසි. | 7. ..............සුණාමි. | 11. ......... සුණාම. |
| 4. .................. සුණාථ. | 8. ............ භුඤ්ජාමි. | 12. .........ජානාසි. |

**අඩු තැන් යෝග්‍ය ක්‍රියා පදවලින් පිරවිය යුතු:-**

| | | |
|---|---|---|
| 1. අහං ........................ | 4. ත්වං ..................... | 7. තුම්හෙ .......... |
| 2. මයං ........................ | 5. තුම්හෙ ................ | 8. අහං .............. |
| 3. අම්හෙ ...................... | 6. තුවං .................... | 9. මයං .............. |

**අඩුතැන් අතීත ක්‍රියාවලින් පිරවිය යුතු:-**

| | |
|---|---|
| 1. ගහපතයො විහිං ............. | 9. අරයො අසයො ..................... |
| 2. සාරථී ගාමං ..................... | 10. ව්‍යාධි මනුස්සං ..................... |
| 3. දීපයො වානරෙ ............... | 11. සාරථී අස්සං ........................ |
| 4. කුමාරො මඤ්චෙ .............. | 12. කවයො ධම්මං ...................... |
| 5. වානරො ගිරිං .................. | 13. දීපි අහිං ................................ |
| 6. අරි ගහපතිං ..................... | 14. අධිපති අසිනා ...................... |
| 7. වාණිජො මණයො .......... | 15. ඉසි ගාමෙ ............................ |
| 8. මුනයො ඕදනං ................. | 16. පති රුක්ඛම්හා ...................... |

# අනාගත ක්‍රියා

## VERBS IN THE FUTURE TENSE

19. පච – ධාතුව අනාගත කාලයෙහි මෙසේ වරනැගේ:–

| | | |
|---|---|---|
| පඨම : | එකවචන: | පචිස්සති (=පිසන්නේය) |
| | බහුවචන: | පචිස්සන්ති (=පිසන්නාහ) |
| මජ්ඣිම : | එකවචන: | පචිස්සසි (=පිසන්නෙහි) |
| | බහුවචන: | පචිස්සථ (=පිසන්නෙව්, පිසන්නහු) |
| උත්තම : | එකවචන: | පචිස්සාමි (=පිසන්නෙමි) |
| | බහුවචන: | පචිස්සාම (=පිසන්නෙමු) |

වත්මාන ක්‍රියාවන්ගේ මැදට 'ඉස්ස' යන කොටස එක්වීමෙන් මේ අනාගත ක්‍රියා සෑදී තිබෙත්යයි සිතාගත්විට ඉගනීම පහසු වේ.

වත්මානයෙහි දක්වූ සියලු ක්‍රියා මෙහි යෙදෙති:

| | | | |
|---|---|---|---|
| ගච්ඡිස්සති | = යන්නේය | පස්සිස්සති | = බලන්නේය |
| ගමිස්සති | = යන්නේය | ජානිස්සති | = දනගන්නේය |
| භවිස්සති | = වන්නේය | දදිස්සති | } = දෙන්නේය |
| වසිස්සති | = වසන්නේය | දස්සති | |
| හාසිස්සති | = හයවන්නේය | කරිස්සති | = කරන්නේය |
| ලභිස්සති | = ලබන්නේය | ජීවිස්සති | = ජීවත්වන්නේය |

යනාදියයි.

**20. ඊකාරාන්ත පුල්ලිංගික ශබ්දයෝ මෙසේ වරනැගෙත්.**

පක්ඛී ශබ්දය

| | | |
|---|---|---|
| පඨමා : | එකවචන: | පක්ඛී (=පක්ෂිතෙම) |
| | බහුවචන: | පක්ඛී, පක්ඛිනො (පක්ෂීහු) |
| දුතියා : | එකවචන: | පක්ඛිනං, පක්ඛිං (=පක්ෂියා) |
| | බහුවචන: | පක්ඛී: පක්ඛිනො (පක්ෂීන්) |

| | | | |
|---|---|---|---|
| තතියා | : | එකවචන: | **පක්ඛිනා** (=පක්ෂියා විසින්) |
| | | බහුවචන: | **පක්ඛීහි, පක්ඛීභි** (=පක්ෂීන් විසින්) |
| චතුත්ථී | : | එකවචන: | **පක්ඛිනො, පක්ඛිස්ස** (=පක්ෂියාට) |
| | | බහුවචන: | **පක්ඛීනං** (=පක්ෂීන්ට) |
| පඤ්චමී | : | එකවචන: | **පක්ඛිනා, පක්ඛිම්හා, පක්ඛිස්මා** (=පක්ෂියා කෙරෙන්) |
| | | බහුවචන: | **පක්ඛීහි, පක්ඛීභි** (=පක්ෂීන් කෙරෙන්) |
| ඡට්ඨී | : | එකවචන: | **පක්ඛිනො, පක්ඛිස්ස** (=පක්ෂියාගේ) |
| | | බහුවචන: | **පක්ඛීනං** (=පක්ෂීන්ගේ) |
| උත්තම | : | එකවචන: | **පක්ඛිනි, පක්ඛිම්හි, පක්ඛිස්මිං** (=පක්ෂියා කෙරෙහි) |
| | | බහුවචන: | **පක්ඛීසු** (=පක්ෂීන් කෙරෙහි) |
| කරණ | : | එකවචන: | **පක්ඛිනා** (=පක්ෂියා කරණකොට) |
| | | බහුවචන: | **පක්ඛීහි, පක්ඛීභි** (=පක්ෂීන් කරණකොට) |
| ආලපන | : | එකවචන: | **(හෙ) පක්ඛි** (=එම්බා පක්ෂියා) |
| | | බහුවචන: | **පක්ඛී, පක්ඛිනො** (=පක්ෂීන්, පක්ෂීනි) |

**මීට සමාන ශබ්දවලින් සමහරක්:-**

| | | | |
|---|---|---|---|
| හත්ථී | = ඇතා | දන්තී | = ඇතා; දත් ඇත්තා |
| සාමී | = ස්වාමියා; අයිතිකාරයා | මන්තී | = මන්ත්‍රීවරයා |
| සසී | = චන්ද්‍රයා | ඡත්තී | = කුඩ ඇත්තා |
| කරී | = ඇතා | පාපකාරී | = පව්කරන්නා |
| බලී | = බලවතා | දීඝජීවී | = දීර්ඝකාලයක් ජීවත්වන්නා |
| ගණී | = සමූහ ඇත්තා | | |
| මාලී | = මාලා ඇත්තා | ධම්මවාදී | = ධර්මය කියන්නා |
| සුඛී | = සුවපත්; සැප ඇත්තා | සීඝයායී | = ඉක්මනින් යන්නා |
| දාඨී | = සර්පයා; දළ ඇත්තා | සෙට්ඨී | = සිටුතෙම |
| සිඛී | = මොනරා; ගින්න | සාරථී | = රථාචාර්‍යයා |
| භොගී | = සර්පයා; සම්පත් ඇත්තා | | (මෙය ඉකාරාන්තවත් |
| කුට්ඨී | = කුෂ්ට ඇත්තා | | ඊකාරාන්තවත් පෙනේ) |

දණ්ඩී = දඬු ඇත්තා

# අභ්‍යාසය 10.

**සිංහලට නැගියයුතු:**

1. මන්ති හත්ථිනං ආරුහිස්සති. 2. මයං සෙට්ඨිනො ගෙහං ගමිස්සාම. 3. ත්වං සාමිනො පුත්තස්ස කපිං දදිස්සසි. 4. ගණිනො සුඛිනො භවිස්සන්ති. 5. අම්හාකං සාමිනො දීඝජීවිනො න භවන්ති. 6. පාපකාරී යට්ඨිනා භොගිං මාරෙස්සති. 7. මම පුත්තා සෙට්ඨිනො ගාමෙ වසිස්සන්ති. 8. සිඛී ඡත්තිම්හා හායිස්සති. 9. සාරථී අස්සෙ ගාමම්හා හරිස්සති. 10. තුම්හෙ මාලීහි සසිනං ඔලොකෙස්සථ. 11. බලී දඨිනො කායං ඡින්දිස්සති. 12. අම්හාකං මන්තිනො බලිනො අභිවිංසු. 13. කුට්ඨී සාරථිනො පාදං යට්ඨිනා පහරිස්සති. 14. සෙට්ඨිනො මාලිනො පුරිසෙ පස්සිස්සන්ති. 15. මයං ගෙහෙ ඔදනං (=බත්) භුඤ්ජිස්සාම.

**පාලියට නැගියයුතු:**

1. අපගේ ස්වාමියා මන්තීන් වෙත[1] යන්නේය. 2. සිටුතෙම දීර්ඝ ජීවිත ඇත්තෙක් වන්නේය. 3. පව්කාරයෝ සැප ඇත්තෝ නොවන්නාහ. 4. දළ ඇත්තා කුෂ්ට ඇත්තාට පහර දෙන්නේය. 5. මන්ත්‍රීතෙමේ ස්වාමියාගෙන් මොනරකු ලබන්නේය. 6. රථාචාර්යයා මන්ත්‍රීන්ගෙන් අශ්වයන් මිළට ගන්නේය. 7. මාගේ මොනරු පර්වතයෙහි ජීවත් වන්නාහ. 8. සර්පයෝ බලවතුන් දෂ්ට කරන්නාහ. 9. ස්වාමියාගේ පුත්‍රයෝ සිටුහුගේ සිංහයන් බලන්නාහ. 10. අපි ආගන්තුකයාගෙන් මුවකු මිළට ගන්නෙමු. 11. ඇතා (උගේ) පයින් මිනිසෙකු මැරුවේය. 12. තෝ සිටු කෙනෙක් නොවන්නෙහි. 13. රජුගේ පුත්තු මන්ත්‍රීන් හා අනුභව කරන්නාහ. 14. වඳුරා ගසෙන් නොවැටෙන්නේය. 15. අපි ඇතා රථාචාර්යයා වෙතට[2] නොගෙනයන්නෙමු.

---

1. මන්තීන සන්තිකං යන්න යොදනු.
2. රථාචරියස්ස සන්තිකං යි යොදනු.

**පහත පෙනෙන වාක්‍යවල අඩුතැන් අතීත - අනාගත ක්‍රියාවලින් පිරවිය යුතු:-**

1. මය්හං දසො හත්ථිම්හා ..........
2. තව පක්ඛි තරුම්හි ..........
3. සින්ධුමහි වානරා ..........
4. පාපකාරී එරසුනා කුට්ඨිං ..........
5. සුසු පාණිනා පක්ඛිං ..........
6. ආබවො රුක්ඛං ..........
7. අහං පාණිනං අසිං ..........
8. ත්වං අසිනා අරිං ..........
9. දන්තිනො උච්ඡු ..........
10. දණ්ඩං මය්හං බාහුං ..........
11. තුය්හං බන්ධවො ගාමෙ ..........
12. බලී අම්හාකං කෙතුං ..........

21. උකාරාන්ත පුල්ලිඞ්ග ගරු ශබ්දය

| | | | |
|---|---|---|---|
| පඨමා | : | එකවචන: | ගරු (=ආචාර්‍යතෙම) |
| | | බහුවචන: | ගරූ, ගරවො (=ආචාර්‍යයෝ තුමූ) |
| දුතියා | : | එකවචන: | ගරුං (=ආචාර්‍යයා) |
| | | බහුවචන: | ගරූ, ගරවො (=ආචාර්‍යයන්) |
| තතියා/කරණ | : | එකවචන: | ගරුනා |
| | | බහුවචන: | ගරූභි, ගරූහි |
| චතුත්ථී/ඡට්ඨී | : | එකවචන: | ගරුනො, ගරුස්ස |
| | | බහුවචන: | ගරූනං |
| පඤ්චමී | : | එකවචන: | ගරුනා |
| | | බහුවචන: | ගරූභි, ගරූහි |
| සත්තමී | : | එකවචන: | ගරුම්හි, ගරුස්මිං |
| | | බහුවචන: | ගරූසු |
| ආලපන | : | එකවචන: | (හෙ) ගරු |
| | | බහුවචන: | (හෙ) ගරූ, ගරවො |

**මීට සමාන ශබ්දවලින් සමහරක්**

| | | | |
|---|---|---|---|
| භික්ඛු | = භික්ෂුනම | උච්ඡු | = උක් |
| ආඛු | = මීයා | බන්ධු | = නෑයා |
| පසු | = තිරිසනා | වේළු | = උණගස |
| තරු | = ගස | බාහු | = අතේ උඩ කොටස |
| සුසු | = බැලයා | ඵරසු | = පොරව |
| කේතු | = කොඩිය | කටච්ඡු | = හැන්ද |
| සින්ධු | = මුහුද | සත්තු | = සතුරා |
| සේතු | = පාලම, හේදණ්ඩ | | |

22. ඇතැම් උකාරාන්ත ශබ්දයෝ ගරු ශබ්දයට වෙනස්ව වරනැගෙත්.

පුල්ලිංගික භාතු – ශබ්දය

| | | | |
|---|---|---|---|
| පඨමා | : | එකවචන: | භාතා (=සහෝදර තෙම) |
| | | බහුවචන: | භාතරො (=සහෝදරයෝ) |
| දුතියා | : | එකවචන: | භාතරං (=සොහොයුරා) |
| | | බහුවචන: | භාතරේ, භාතරො (=සොහොයුරන්) |
| තතියා / පඤ්චමී / කරණ | : | එකවචන: | භාතරා |
| | | බහුවචන: | භාතරෙභි, භාතරෙහි භාතූභි, භාතූහි |
| ච: ඡ | : | එකවචන: | භාතු, භාතුනො, භාතුස්ස |
| | | බහුවචන: | භාතරානං, භාතානං, භාතූනං |
| සත්තමී | : | එකවචන: | භාතරි |
| | | බහුවචන: | භාතරෙසු, භාතූසු |
| ආලපන | : | එකවචන: | (හෙ) භාත, භාතා |
| | | බහුවචන: | (හෙ) භාරො |

පියා යන අර්ථ ඇති පිතු – ශබ්දය ද භාතු – ශබ්දයට සමානයි.

23. නත්තු – ශබ්දය මීටත් වෙනස් වේ.

| | | |
|---|---|---|
| පඨමා : | එකවචන: | නත්තා (=මුනුබුරා) |
| | බහුවචන: | නත්තාරො (=මුනුබුරෝ) |
| දුතියා : | එකවචන: | නත්තාරං (=මුනුබුරා) |
| | බහුවචන: | නත්තාරෙ, නත්තාරො (=මුනුබුරන්) |
| තතියා : පඤ්චමී : කරණ : | එකවචන: | නත්තාරා |
| | බහුවචන: | නත්තාරෙහි, නත්තාරෙභි |
| චතුත්ථී : ඡට්ඨී : | එකවචන: | නත්තු, නත්තුනො, නත්තුස්ස |
| | බහුවචන: | නත්තාරානං, නත්තානං, නත්තූනං |
| සත්තමී : | එකවචන: | නත්තරි |
| | බහුවචන: | නත්තාරෙසු, නත්තූසු |
| ආලපන : | එකවචන: | (හෙ) නත්ත, නත්තා |
| | බහුවචන: | (හෙ) නත්තාරො |

**මීට සමාන ලෙස වරනැගෙන ශබ්දවලින් කීපයක්:**

| | | | |
|---|---|---|---|
| සත්ථු | = අනුශාසකයා; බුදුරද | නෙතු | = නායකයා; ගෙනයන්නා |
| කත්තු | = කරන්නා | වත්තු | = කියන්නා |
| භත්තු | = ස්වාමිපුරුෂයා | ජෙතු | = දිනන්නා |
| ගන්තු | = යන්නා | දාතු | = දෙන්නා |
| සොතු | = අසන්නා | විනෙතු | = හික්මවන්නා |

# අභ්‍යාසය 11.

**සංලක්ෂ්‍යය:**

'සමග' යන අර්ථ ඇති සහ, සද්ධිං නිපාත දෙක තතියාව සමග යෙදිය යුතුයි. ඒ දෙක බොහෝ සේ ම සම්බන්ධ කරනු ලබන පදයෙන් පසුව යෙදේ: "පුරිසෙන සද්ධිං" ආදී වශයෙනි.

එක් කිරීම් අර්ථයෙහි යෙදෙන ද – කාරය වෙනුවෙන් පාලියෙහි ච, අපි යන නිපාත යෙදිය හැක. අපි ශබ්දය බොහෝ විට ආකාරය ලොප්වී පි යන්නෙන් පමණක් දක්නා ලැබේ "නොහොත්" යන්නට "වා" නිපාතය යොදනු.

**සිංහලට නැගියයුතු:**

1. බන්ධවො සුසුහි සද්ධිං අම්හාකං ගෙහං ආගමිස්සන්ති. 2. සත්තු ඵරසුනා තව තරවො ඡින්දිස්සති. 3. ගරු මය්හං සුසුනං උච්ඡවො අදදි. 4. භික්ඛවො නත්තාරානං ධම්මං දෙසෙස්සන්ති. 5. ත්වං බන්ධුනා සින්ධුං ගමිස්සසි. 6. අස්සා ච ගොණා ච ගාමෙ චරිස්සන්ති. 7. තුම්හෙ පසවො වා පක්ඛි වා මා මාරෙථ. 8. මයං නෙතාරෙහි සහ සත්ථාරං පූජෙස්සාම. 9. භාතා වේළුනා පක්ඛිං මාරෙස්සති. 10. අම්හාකං පිතරො සත්තූනං කෙතවො ආහරිංසු. 11. ජෙතා දතාරං බාහුනා පහරි. 12. සත්ථා අම්හාකං නෙතා හවි. 13. මයං පිතරා සද්ධිං වෙළවො ආහරිස්සාම. 14. අභයො ආබවො භුඤ්ජන්ති. 15. මම සත්තවො සෙතුම්හි නිසීදිංසු. 16. අම්හාකං භාතරො ච පිතරො ච සින්ධුං ගච්ඡිංසු. 17. අහං මම භාතරානං සිබ්බිනො වික්කිණිස්සාමි. 18. සුසවො කටච්ඡුනා ඔදනං ආහරිංසු. 19. ගාමං ගන්තා තරුසු කෙතවො පස්සිස්සති. 20. සෙතුං කත්තා ගාමම්හා වෙළවො ආහරි.

**පාලියට නැගියයුතු:**

1. මම මාගේ පොරොවෙන් උණගස් කපන්නෙමි. 2. ආචාර්යවරු ජයග්‍රාහකයා බලන්නාහ. 3. ඔවුහු ඇතාට උක්ගස් ගෙන ගියහ. 4. ධර්මය අසන්නෝ භික්ෂූන් වෙත එන්නාහ.

5. දිවියෝ ද සිංහයෝද ගම්වල නො වසත්. 6. මම මාගේ සොහොයුරා සමග අනුශාසකයා වෙත ගියෙමි. 7. අපේ පියවරු ද සහෝදරයෝ ද වෙළෙන්දෝ වූහ. 8. අපේ නෑයෝ මොනරුන් හා පක්ෂීන් මිළදී ගන්නාහ. 9. වඳුරා ද මුවා ද පර්වතයෙහි වසත්. 10. හෙතෙම මාගේ මුනුබුරාගේ බාහුවට ගැසුවේය. 11. සතුරෝ අපේ නායකයාගේ කොඩිය ගෙන යන්නාහ. 12. පාලම් සාදන්නෝ ගමෙන් උණගස් ගෙනාහ. 13. මීයෝ සර්පයන්ට භය වන්නාහ. 14. මම මාගේ නෑයන්ට බත් දෙන්නෙමි. 15. ආහාර[1] දෙන්නා හැන්දෙන් බත් ගෙනාවේය. 16. මාගේ පියාගේ සිවුපාවෝ පර්වතයෙහි සිටියාහ. 17. අපේ මුනුබුරාත් සහෝදරයෝත් ඇතුන් මිළයට නො ගන්නාහ. 18. ගුරුවරයාගේ පුතා අසකු හෝ ගොනකු මිළදී ගත්තේය. 19. මාගේ පුතා හෝ සහෝදරයා බාලයන් පිණිස[2] වඳුරකු ගෙනෙන්නේය.

**සංලක්ෂ්‍යය:**

සිංහල කොටසේ 6 වෙනි වාක්‍යයෙහි දෙදෙනෙකුන්ගේ යෑම සිදු වූ නමුත් ක්‍රියාව ඒකවචනයෙන් යෙදී තිබේ. සමග යන්නෙන් තවත් නාමයක් එක් කළවිට එය තතියාවෙන් සිටින බැවින් ප්‍රථමාවෙන් සිටි පදය පමණක් කර්තෘ සේ ගණන් ගෙන ක්‍රියාව යෙදිය යුතුයි. එහි "මම" යන්න "අපි" යයි බහුවචනය වී නම් ක්‍රියාවත් බහුවචනය ගනී. එහෙත් 'සමග' යන්නෙන් එක් වූ වචනය නිසා එය බහුවචනය නො වේ.

9 වෙනි වාක්‍යයෙහි කර්තෘ පද ඒකවචනයෙනි, ක්‍රියාපදය බහුවචනයෙනි. එසේ වීමට හේතුව ප්‍රථමාවෙන් සිටි කර්තෘ පද දෙකක් ද – ශබ්දයෙන් එක් කිරීම යි.

24. උඩ දක් වූ උකාරාන්ත පුල්ලිංගික ශබ්දයන්ට වෙනස් ව වරනැගෙන වන්තු – මන්තු දෙකින් අවසන්වන, බොහෝ සේ විශේෂණ පද වශයෙන් සිටින, ගුණනාම කොටසක් වේ. ඒවා මෙසේ වරනැගෙත්:–

---

1. ආහාර ශබ්දය පුරිස ශබ්දය මෙන් වරනැගෙත්.
2. චතුත්ථිය යෙදීමෙන් "පිණිස" යන අර්ථය ලැබේ.

ගුණවන්තු = ශබ්දය

| | | එකවචන | බහුවචන |
|---|---|---|---|
| ප | : | ගුණවා (=ගුණවතා) | ගුණවන්තො, ගුණවන්තා (=ගුණවත්හු) |
| දු | : | ගුණවන්තං | ගුණවන්තෙ |
| ත<br>ක | :<br>: | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි,<br>ගුණවන්තෙභි |
| ච: ඡ | : | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවන්තානං |
| ප | : | ගුණවතා, ගුණවන්තම්හා,<br>ගුණවන්තස්මා | ගුණවන්තෙහි,<br>ගුණවන්තේභි |
| ස | : | ගුණවතී, ගුණවන්තෙ,<br>ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |
| ආ | : | (හෙ) ගුණවං, ගුණව, ගුණවා | (හෙ) ගුණවන්තො,<br>ගුණවන්තා |

| | |
|---|---|
| සීලවන්තු = සිල්වත් | පඤ්ඤාවන්තු = නුවණැති |
| ධනවන්තු = ධනවත් | පුඤ්ඤවන්තු = පින් ඇති |
| කුලවන්තු = කුලවත් | යසවන්තු = පිරිස් හෝ කීර්තිය ඇති |
| හිමවන්තු = හිමාලය | භගවන්තු = භාග්‍යවත් |
| බලවන්තු = බලවත් | ඵලවන්තු = ගෙඩි ඇති |

ආදි වන්තු – යන්න කෙළවරෙහි ඇති ශබ්ද ද

| | |
|---|---|
| චක්ඛුමන්තු = ඇස් ඇති | හිරිමන්තු = ලජ්ජා ඇති |
| බුද්ධිමන්තු = නුවණැති | බන්ධුමන්තු = නෑයන් ඇති |
| සතිමන්තු = සිහි ඇති | භානුමන්තු = රශ්මි ඇති, සූර්යයා |

ආදි මන්තු – යන්න කෙළවරෙහි ඇති ශබ්ද ද ගුණවන්තු මෙන් වරනැගෙත්.

මන්තු අන්ත ශබ්දය

| | | |
|---|---|---|
| ප: | චක්ඛුමා | චක්ඛුමන්තො, චක්ඛුමන්තා |
| දු: | චක්ඛුමන්තා | චක්ඛුමන්තෙ |

ආදි වශයෙන් වරනැගිය යුතු.

## 25. ඌකාරාන්ත පුල්ලිංගික විදූ ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා : ආලපන : | විදූ (=පණ්ඩිතයා) | විදූ: විදුනො |
| දුතියා : | විදුං | විදූ: විදුනො |
| තතියා : පඤ්චමී : | විදුනා | විදූහි: විදූභි |
| චතුත්ථී : ඡට්ඨී : | විදුනො: විදුස්ස | විදූනං |
| සත්තමී : | විදුම්හි: විදුස්මිං | විදූසු |

විඤ්ඤූ = පණ්ඩිතයා

පභූ = අධිපතියා

වදඤ්ඤූ = වචනදන්නා, පරිත්‍යාග කරන්නා

කතඤ්ඤූ = කෙළෙහි ගුණදන්නා

සබ්බඤ්ඤූ = සර්වඥ

මත්තඤ්ඤූ = පමණ දන්නා

වේදගූ = වේදය දන්නා

ආදීහු මීට සමානව වරනැගේ.

## 26. කාලාර්ථ ප්‍රකාශක නිපාත:

| | | | |
|---|---|---|---|
| කදා | = කවදා | හීයො | = ඊයේ |
| තදා | = එකල්හි | පාතො | = උදෑසන |
| සදා | = හැමකල්හි | සායං | = සවස |
| ඉදානි | = දැන් | පුරා | = පෙර |
| අජ්ජ | = අද | පච්ඡා | = පසුව |
| සුවෙ | = හෙට | යදා | = යම්කලෙක |

එකදා = එක්කලෙක

## අභ්‍යාසය 12.

### සිංහලට නැගියයුතු

1. භගවා අජ්ජ සොතාරානං ධම්මං දෙසෙස්සති. 2. භික්ඛවො තදා භගවතො පාදෙ වන්දිංසු. 3. චක්ඛුමන්තො සදා භානුමන්තං පස්සන්ති. 4. තදා බලවන්තා අරී වෙළුහි පහරිංසු. 5. කදා තුම්හෙ ධනවන්තං පස්සිස්සථ? 6. සුවෙ මයං සීලවන්තං භික්ඛුං වන්දිස්සාම. 7. භගවන්තො සබ්බඤ්ඤුනො භවන්ති. 8. විදුනො ඉදානි කුලවතො ගෙහං ගච්ඡිංසු. 9. හිමවති සීහා ච ඉසිනො ච සදා වසන්ති. 10. පුඤ්ඤාවතො නත්තා බන්ධුමා භවි. 11. කුලවතං භාතරෝ ධනවන්තො න භවිංසු. 12. අහං හිමවන්තම්හි ඵලවන්තෙ රුක්ඛෙ පස්සිං. 13. පුරා මයං බන්ධූහි සහ හිමවන්තං ගච්ඡිම්හ. 14. හීයො සායං බුද්ධිමන්තො සසවතං ගාමං ගච්ඡිංසු. 15. විඤ්ඤුනො පච්ඡා පභුනො ගෙහෙ වසිස්සන්ති. 16. යසවතං භාතරෝ බලවන්තො භවන්ති. 17. අම්භාකං පිතරෝ සතිමන්තො අභවිංසු. 18. පුඤ්ඤවන්තො එකදා මණයො ලභන්ති. 19. බුද්ධිමන්තො අම්හාකං සත්ථාරං වන්දන්ති. 20. බලවතො නත්තා පාතො මම ගොණං ගණ්හි.

**පාලියට නැගියයුතු:**

1. ඇස් ඇත්තා උදෑසන සිල්වතුන් බලයි. 2. ධනවතුන්ගේ පුත්‍රයෝ හැමවිටම ප්‍රඥවත්හු නොවෙත්. 3. නැයන් ඇත්තා සතුරන්ට භය නොවේ. 4. ගුණවතුන්ගේ සහෝදරයෝ එකල්හි බුදුන්ගේ පා වැන්දහ. 5. ඔබලාගේ මුනුබුරෝ දත් බුඩිමත්හු නොවෙත්. 6. නුවණැත්තා හෙට කුලවතුන්ට ධර්මය කියන්නේය. 7. ධනවත්හු පුත්‍රයන් සමග හිමාලයට යන්නාහ. 8. භාග්‍යවතුන් වහන්සේ සිල්වතුන්ගේ ද නැණවතුන්ගේ ද ගුරුවරයා විය. 9. කීර්තිමත්හු අපේ ගමට කවද එන්නාහුද? 10. බලවතුන්ගේ දරුවෝ පසුව ගුණවත්හු වන්නාහ. 11. එක් කලෙක පණ්ඩිතයාගේ සොහොයුරා ගුණවතාට ගැසුවේය. 12. පූර්වයේ දී මම ප්‍රභූහුගේ ගෙයි විසුවෙමි. 13. ඊයේ මාර්ගයෙහි ඇත්තු ද අශ්වයෝ ද සිටියාහ. 14. කුලවතා දත් සිංහයෙකු හා මුවකු මිළයට ගත්තේය. 15. ධනවතා හිමාලයෙන් ඇතකු හා සිංහයකු ගෙනාවේය. 16. අද උදෑසන ධනවතාගේ පුත්තු හිමාලයට ගියහ. 17. අපේ මුණුබුරෝ සිල්වත් පියවරුන්ට වඳිත්. 18. පින්වතුන්ගේ පුත්‍රයෝ නැයන් ඇත්තෝ වන්නාහ. 20. බලවතුන්ගේ දසයෝ ඊයේ හවස මගේ අශ්වයන් ගෙන ගියහ.

**සංලක්ෂ්‍යය:**

අකාරාන්ත පුල්ලිඞ්ගික රාජ ශබ්දයද, අත්‍ත ශබ්දයද පුරිස ශබ්දයට වෙනස් ලෙස වරනැගෙති. ඒ ශබ්ද දෙක වරනැගෙන ආකාරය හා ඔකාරාන්ත පුල්ලිංගික ගො ශබ්දය වරනැගෙන ආකාරය දෙවෙනි පොතෙහි දක්වනු ලැබේ. සා ආදි ආකාරාන්ත පුල්ලිංගික ශබ්දයන්ගේ ද "පමා – බ්‍රහ්මා" ආදි වශයෙන් ප්‍රථමා ඒකවචනයේ දී ආකාරාන්තව සිටින ආකාරාන්ත ශබ්දයන්ගේ ද වරනැගීම තුන්වෙනි පොතෙහි දක්වනු ලැබේ.

27. ආකාරාන්ත ඉත්ථිලිංගික වනිතා – ශබ්දය මෙසේ වරනැගේ.

| | **එකවචන** | **බහුවචන** |
|---|---|---|
| පඨමා | : වනිත (ස්ත්‍රීතොමෝ) | වනිතා, වනිතායො (ස්ත්‍රීහුතුමූ) |
| දුතියා | : වනිතං (ස්ත්‍රිය) | වනිතා, වනිතායො (ස්ත්‍රීන්) |
| තතියා | : වනිතාය (ස්ත්‍රිය විසින්) | වනිතාහි, වනිතාභි (ස්ත්‍රීන් විසින්) |
| චතුත්ථී | : වනිතාය (ස්ත්‍රියට) | වනිතානං (ස්ත්‍රීන්ට) |
| පඤ්චමී | : වනිතාය | වනිතාහි, වනිතාභි |
| ඡට්ඨී | : වනිතාය | වනිතානං |
| සත්ත | : වනිතායං, වනිතාය | වනිතාසු |
| කරණ | : වනිතාය | වනිතාහි, වනිතාභි |
| ආලපන | : (හෙ) වනිතෙ | (හෙ) වනිතා, වනිතායො |

**මීට සමානව වරනැගෙන ශබ්දවලින් සමහරක්;**

| | | | |
|---|---|---|---|
| ගඞ්ගා | = ගඟ | කඤ්ඤා | = කන්‍යාව, ගෑණු ළමයා |
| නාවා | = නැව | දාරිකා | = දැරිය, තරුණිය |
| දිසා | = දිශාව | භරියා | = භාර්‍යාව |
| සෙනා | = සේනාව | දෙවතා | = දේවතාවා |
| සාලා | = ශාලාව | පූජා | = පූජාව |
| සභා | = සභාව | වසුධා | = පොළොව |
| පරිසා | = පිරිස | ගුහා | = ගුහාව |
| කථා | = කථාව | ඛුදා | = බඩගින්න |
| ගීවා | = බෙල්ල | නිද්දා | = නිදීම |
| ජිව්හා | = දිව | ලඞ්කා | = ලක්දිව |
| ජඞ්ඝා | = කෙණ්ඩය | සක්ඛරා | = ගල්කැට; හකුරු |

| | | | |
|---|---|---|---|
| වාචා | = වචනය | සාඛා | = අත්ත |
| මඤ්ජුසා | = පෙට්ටිය | සිලා | = ගල |
| නාසා | = නහය | විසිබා | = විථිය |
| තුලා | = තරාදිය | වාලිකා | = වැලි |
| භාසා | = භාෂාව | වාලුකා | = වැලි |
| මාලා | = මල්දම | ගාථා | = ගාථාව |
| වළවා | = වෙළඹ; අශ්වදෙන | සුරා | = මත්පැන් |
| ලතා | = වැල | පඤ්ඤා | = ප්‍රඥව |

"මව" යන අර්ථ ඇති අම්මා ශබ්දය වනිතා ශබ්දයට සමාන වුවත් ආලපන එකවචනයෙහි (හෙ) අම්ම, අම්මා යි වරනැගෙන බව සැලකිය යුතු.

# විධි ක්‍රියාව

## IMPERATIVE MOOD

28. කාල තුනට අයත් ක්‍රියා යට දක්වන ලදී. අන්‍යයකුට (වැඩක් කිරීමට) අණ කරන කල්හි යොදන ක්‍රියාව විධි ක්‍රියා නම් වේ. විධානය නම් "යව, පිසව" යනාදියයි. විශෙෂයෙන් කියතහොත් එය යෙදිය හැක්කේ මධ්‍යම පුරුෂයෙහි පමණයි. "යේවා, යෙම්වා, වෙම්වා, ජීවත්වේවා" ආදිය යම් කිසිවක් ප්‍රාර්ථනා කරන බැවින් හෝ කැමතිවන බැවින් ආසිකිරිය නම්වේ. පාලියෙහි මේ අර්ථ දෙකෙහිම වැටෙන ක්‍රියාව එක සමාන වේ. එය කාල විශෙෂයක් නැතිව හෝ වර්තමානයට සමීප කාලයෙහි හෝ වේයයි දක්වා තිබේ.

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨම | : පචතු (=පිසේවා) | පචන්තු (=පිසත්වා) |
| මජ්ඣිම | : පච, පචාහි (=පිසව) | පචථ (=පිසවූ හෝ පිසහුවා) |
| උත්තම | : පචාමි (පිසම්වා) | පචාම (=පිසමුවා) |

| | | | | | |
|---|---|---|---|---|---|
| ජයතු | = | ජයගනීවා | රක්ඛතු | = | රකීවා |
| සුණාතු | = | අසාවා | භවතු | = | වේවා |
| භාසතු | = | කියාවා | පිවතු | = | බෝවා |
| ගච්ඡතු | = | යේවා | හොතු | = | වේවා |
| ඨපෙතු | = | තබාවා | | | |

ආදිය ද පෙර දක් වූ බොහෝ ක්‍රියා ද මෙහි යෙදිය යුත්තාහ.

# නිපාත පද

## PARTICLES

29. නිපාතයෝ ලිඞ්ග වශයෙන් හෝ විභක්ති වශයෙන් හෝ එක වචන වශයෙන් හෝ වෙනසකට නො පැමිණ එක් ආකාරයකින්ම සිටිති. (කොයි ලිඟුවක ශබ්දයක් හා යෙදුනත් කොයි විභක්ති පදයක් හා යෙදුනත් නිපාතයන් ගේ රූපය වෙනස් නොවේ.)

එහෙත් ඇතැම් නිපාතයෝ විභක්තීන්ගේ අර්ථවල පමණක් වෙති: හෙ (=එම්බා) නිපාතය ආලපනයෙහි පමණක් යෙදේ. හෙට්ඨා (=යට), උපරි (=මත්තෙහි), අධො (=යට) බහි (=පිටත) යනාදි නිපාතයෝ ද 26 වෙනි අංකයෙහි දක්වූ කාලාර්ථවාචී නිපාතයෝ ද සත්තමී විභක්තියෙහි වෙති. සයං (=තෙමේ) නිපාතය පඨමා, තතියාවන්හි වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| තථා | = | එසේ | තත්‍ථ | = | එහි |
| යථා | = | යම්සේ | උපරි | = | මත්තෙහි |
| යාව | = | යම්තාක් | හෙට්ඨා | = | යට |
| තාව | = | ඒතාක් | කත්‍ථ | = | කොහේ, කොහි |
| සචෙ | = | ඉදින් | යත්‍ථ | = | යම්තැනක |
| යදි | = | ඉදින් | යහිං | = | යම් තැනක |
| ආම | = | එසේය | තහිං | = | එහි |
| එවං | = | මෙසේ | තිරියං | = | සරස |

| | | | |
|---|---|---|---|
| අථ = ඉක්බිති | | සමන්තා = හාත්පස | |
| අථවා = නොහොත් | | අන්තො = ඇතුළෙහි | |
| පන = වනාහි | | බහි = පිටත | |
| අද්ධා = ඒකාන්තයෙන් | | ඉතො = මෙයින්, මෙතැනින් | |
| පුන = නැවත | | කුතො = කොයින් | |
| අන්තරා = අතරෙහි | | තතො = එතැනින් | |
| සනිකං = හෙමින් | | ඛිප්පං = වහා | |

ඉධ = මෙහි

## අභ්‍යාසය 13.

**සිංහලට නැගියයුතු:**

1. වනිතායො නාවාහි ගඞ්ගාසු ගච්ඡන්ති. 2. ත්වං සාලාය කඤ්ඤානං ඔදනං පචාහි. 3. සචෙ තුම්හෙ නහායිස්සථ අහම්පි නහායිස්සාමි. 4. යාව තව කඤ්ඤා ආගමිස්සති තාව ඉධ තිට්ඨාහි. 5. ලඞ්කාය භූපතිනො සෙනායො තත්ථ ජයන්තු. 6. දෙවතා වසුධායං මනුස්සෙ රක්ඛන්තු. 7. තුම්හෙ කඤ්ඤාය හත්ථෙ මාලං ඨපෙථ. 8. සාලාය ඡායා වසුධායං අත්ථි. 9. චොරා ඉතො මඤ්ජුසායො ගුහං හරිංසු. 10. අථ කඤ්ඤායො ගොධං සක්ඛරාය පහරිංසු. 11. ත්වං තතො කත්ථ ගච්ඡසි? 12. යත්ථ පඤ්ඤාවන්තො වසන්ති, තත්ථ අහං ගමිස්සාමි. 13. හත්ථී ගාමම්හා බහි තරුනො ශාඛා ඡින්දි. 14. සචෙ තුම්හෙ තද පරිසාය කථෙස්සථ, අහම්පි කථෙස්සාමි. 15. වනිතානං මණයො මංජූසාය අන්තො ඨපෙථ. 16. මයං ගාමස්ස සමන්තා ගුහාසු වසාම. 17. අම්හාකං අම්මා සුවෙ දෙලාය ගාමං ගමිස්සති. 18. තුම්හෙ පරිසාය සඞ්ඛං මම කථං සුණාථ. 19. යථා මම භරියා කථෙස්සති, තථා අහං භාසිස්සාමි. 20. දරිකා කඤ්ඤාය නාසායං සක්ඛරං ඛිපි, (දැම්මාය.)

**පාලියට නැගියයුතු:**

1. හොරා පෙට්ටිය ගුහාවට ගෙන ගියේය. 2. තොපගේ මවුවරුන් සමග හෙට ගමට යවු. 3. ස්ත්‍රියගේ සහෝදරයා ඊයේ

නැවෙන් ගියේය. 4. හැමකල්හිම මාගේ පූජාවෝ නුවණැත්තන්ට වෙත්වා. 5. තෙපි අද කන්‍යාවගේ අතෙහි මල්දමක් තබවු. 6. යම්සේ තොපගේ පියා කීවේද එසේ කරවු. 7. යම් කලක පිරිස යන්නේ නම් එකල මම ද යන්නෙමි. 8. ඉදින් ස්වාමියාගේ භාර්‍යාව සභාවෙහි කථා කරන්නී නම් අපි (එය) අසන්නෙමු. 9. ස්ත්‍රිය පෙට්ටියෙන් තරාදියක් ගෙනැවිත් එහි හකුරු දැම්මාය. 10. දූරියගේ පෙට්ටිවල මැණික් තිබෙත්. (=සන්ති) 11. කන්‍යාවෝ උදැසන වීථියෙන් වැලි ගෙනාහ. 12. රජුගේ ඇත්තු ගමතුළ ගස්වල අතු කැඩූහ. 13. ලංකාවෙහි ගල් ද ගල් බොරලු ද පර්වත ද ඇත්තාහ. 14. ඉක්බිති රජතෙමේ පිරිස සමග ගඟෙහි නැවකින් ගියේය. 15. වැලේ සෙවනැල්ල පොළොවෙහි තිබේ. 16. දෙවිවරු අපගේ පුතුන් හා මුනුබුරන් රකිත්වා. 17. මාගේ සේනාව ගමෙන් පිටදී ජය ගනීවා. 18. අපි අපේ දිව කරණකොට වචන කියමු. 19. මම සභාවේදී දූරියගේ කථාව ඇසීමි. 20. මාගේ මව ඒකාන්තයෙන් අද සවස එන්නේය.

30. ඉකාරාන්ත ඉත්ථිලිඞ්ග භූමි - ශබ්දය

| | | **එක** | **බහු** |
|---|---|---|---|
| පඨ | : | භූමි (=භූමිතොමෝ) | භූමී, භූමියො (=භූමිහු) |
| දුති | : | භූමිං (=භූමිය) | භූමී, භූමියො (=භූමින්) |
| තති: කර | : | භූමියා | භූමිහි, භූමීහි |
| පඤ්ච | : | | |
| චතු: ඡට්ඨී | : | භූමියා | භූමීනං |
| සත්ත | : | භූමියං, භූමියා | භූමීසු |
| ආලපන | : | (හෙ) භූමි | (හෙ) භූමී, භූමියො |

**මීට සමානව වරනැගෙන ශබ්දවලින් සමහරක්:**

| | | | |
|---|---|---|---|
| රත්ති | = රෑ | සන්ති | = සැනසීම |
| ඛන්ති | = ඉවසීම | දොණි | = ඔරුව |
| සති | = සිහිය | කිත්ති | = කීර්තිය |
| මති | = ප්‍රඥාව | අසනි | = හෙනය |

| | | | |
|---|---|---|---|
| අටවි | = වනය | පත්ත | = පාබල සෙනග |
| යුවති | = තරුණිය | වුට්ඨි | = වැස්ස |
| නාළි | = නැළිය | රංසි | = රශ්මිය |
| අංගුලි | = ඇඟිල්ල: අඟල | ධූලි | = දූලි |
| දුන්දුභි | = බෙරය | පීති | = ප්‍රීතිය |
| වුඩ්ඪි | = අභිවෘද්ධිය | | |

31. ඊකාරාන්ත – ඉත්ථිලිංග කුමාරී – ශබ්දය

| | එක | බහු |
|---|---|---|
| පඨ | : කුමාරී (කුමාරී තොමෝ) | කුමාරී, කුමරියො (කුමරියෝ) |
| දුති | : කුමාරිං (=කුමාරිය) | කුමාරී, කුමාරියො |
| තති: පඤ්ච : කරණ : | කුමාරියා | කුමාරීහි, කුමාරීභි |
| චතු: ඡට්ඨි | : කුමාරියා | කුමාරීනං |
| සත්ත | : කුමාරියං, කුමාරියා | කුමාරීසු |
| ආල | : (හෙ) කුමාරි | (හෙ) කුමාරී, කුමාරියො |

කුමරිය නම් වයසින් අඩු ස්ත්‍රිය යි.

**මීට සමාන ශබ්ද නම්:-**

| | | | |
|---|---|---|---|
| තරුණී | = තරුණිය | වානරී | = වැඳිරිය |
| බ්‍රාහ්මණී | = බැමිණිය | මිගී | = මුවදෙන |
| නාරී | = ස්ත්‍රිය | සීහී | = සිංහදෙන |
| ඉත්ථී | = ස්ත්‍රිය | ගාවී | = ගව දෙන |
| භගිනී | = සහෝදරිය | කාකී | = කවුඩු දෙන |
| රාජිනී | = රැජිනිය | හත්ථිනී | = ඇතින්න |
| දෙවී | = රාජ දේවිය | කුක්කුටී | = කිකිළිය |
| මාතුලානී | = නැන්දා | වාපී | = වැව |
| දාසී | = දාසිය | නදී | = ගඟ |
| සඛී | = යහළු ස්ත්‍රිය | පොක්ඛණී | = පොකුණ |
| කින්නරී | = කිඳුරිය | කදලී | = කෙසෙල් ගස |

ධනවතී = ධනවත් ස්ත්‍රිය

# පූර්ව ක්‍රියා

32. කත්වා (=කොට), ගන්ත්වා (=ගොස්) ආදිය අවසාන ක්‍රියාවට මුලින් සිටින බැවින් පූර්ව ක්‍රියා නම් වේ. මින් ඉහත දැක්වූ අවසාන ක්‍රියාවක් නැතිව පූර්ව ක්‍රියාවකින් පමණක් වාක්‍යයක් සම්පූර්ණ කළහැකි නොවේ. කත්වා යනාදියට "පූර්ව ක්‍රියා" යන නම් ඇතත් ඔවුහු ක්‍රියා පදයන්හි නොව නිපාතයන්හි ගණිනු ලැබෙත්.

| | | | |
|---|---|---|---|
| ගන්ත්වා | = ගොස් | ආගන්ත්වා | = අවුත් |
| ධාවිත්වා | = දුව, දුවලා | නහාත්වා | = නා, නාලා |
| පවිත්වා | = පිස | ඨත්වා | = සිට |
| සයිත්වා | = නිදා | නිසීදිත්වා | = හිඳ |
| භුඤ්ජිත්වා | = අනුභව කොට | උට්ඨහිත්වා | = නැගිට |
| ඛාදිත්වා | = කා, කාලා | ලභිත්වා | = ලබා |

ත්වා – යන්නෙන් අන්තිමවන සියලු පූර්ව ක්‍රියාවන්ට "පචිත්වාන, සයිත්වාන" ආදි වශයෙන් ත්වාන – යන්නෙන් යුක්තව සෑදෙන රූප ද ඇති බව සැලකිය යුතු.

| | | | |
|---|---|---|---|
| ආගම්ම | = අවුත් | නික්ඛම්ම | = නික්ම |
| ඔරුය්හ | = බැස | ලද්ධාන | = ලැබ |
| ආරුය්හ | = නැගී | කාතූන | = කොට |
| ආදාය | = ගෙන | ලද්ධා | = ලැබ |

යනාදීහු සාමාන්‍ය ලක්ෂණයට වෙනස්ව සෑදෙති.

# අභ්‍යාසය 14.

**සිංහලට නැගියයුතු:**

1. බ්‍රාහ්මණී කුමාරියා සද්ධිං පාතො නදියං නහාත්වා ගෙහං අගමි. 2. නාරියො ඔදනං පචිත්වා භුඤ්ජිත්වා කුක්කුටීනම්පි අදංසු. 3. සුවෙ දෙවියා කුමාරියො සඛීහි සහ වාපිං ගන්ත්වා නහායිස්සන්ති. 4. රාජිනී පරිසාය සහ දීපා නික්ඛම්ම නාවාය ගමිස්සති. 5. වානරී ඉත්ථියො පස්සිත්වා තරුං ආරුය්හ නිසීදි. 6. තරුණියො හත්ථෙහි තරූනං සාඛා ආදාය ඡින්දිංසු. 7. තුම්හෙ පුන වාපිං තරිත්වා[1] අටවිං පවිසථ. 8. දීපයො අටවිසු ඨත්වා මිගී මාරෙත්වා ඛාදන්ති. 9. යුවතීනං පිතරො සායං අටවියා ආගම්ම භුඤ්ජිත්වා සයිස්සන්ති. 10. හත්ථිනී පොක්ඛරණිං ඔරුය්හ නහාත්වා කදලියො ඛාදිස්සති. 11. සීහී අජං මාරෙත්වා සුසූනං දස්සති. 12. මම මාතුලානී පුත්තස්ස දුන්දුභිං ආනෙස්සති. 13. සකුණියො මහියං චරිත්වා සුසූනං ආහාරං පරියෙසන්ති. (=සොයත්) 14. කාකී තරුනො සාඛාසු නිසීදිත්වා විහිං භුඤ්ජිංසු. 15. ගාවියො භූමියං සයිත්වා ගාමෙ චරිත්වා අටවිං ගච්ඡිංසු.

**පාලියට නැගියයුතු:**

1. සිංහ දෙන ඊයේ මුවදෙනක මරා කෑවාය. 2. බැමිණිය ගඟෙන් එතෙරව[2] කැලයෙන් කිඳුරියක ගෙනාවාය. 3. ඉක්බිති තරුණියගේ සොහොයුරා ගඟෙහි නා ගෙට ගොස් අනුභව කෙළේය. 4. වැදිරිය ගසට නැග අතේ ඇඟිලිවලින් අත්තක් ඇල්ලුවාය.[3] 5. තරුණියෝ වැවට ගොස් නා ක්‍රීඩාකොට වහා ගමට ආහ. 6. තෙපි ඔරුවලින් ගඟෙන් එතෙරව ගම්වලින් කිකිළියන් ගෙනෙවු. 7. තරුණිය පියාට බත් පිස යෙහෙළියන් සමග එහි වැවට ගියාය. 8. අපේ සොහොයුරෝ අද උදේ වනයට ගොස් මුවදෙනක මැරූහ. 9. අපි වැවෙහි නා ගමට ගොස් පිස අනුභව කොට නිදන්නෙමු. 10. මාගේ සොහොයුරියෝ එතැනින් ඔරුවක නැග ගඟේ ගියහ. 11. කුමරියෝ වහා මල්මාලාවක් ගෙනවුත් දේවියගේ බෙල්ලෙහි තැබූහ. 12. සිවුහුගේ දෙන්නු ද හවස වනයෙන් නික්ම වැවෙහි (පැන්) බී ගමට ඇතුළු වූහ. 13. දේවිය පිරිස සමග

---

1. වාපිං තරිත්වා – වැව් තරණය කොට හෝ වැවෙන් එතෙරව.
1. නදිං තරිත්වා යි යෙදිය යුතු. අන් තන්හිත් මේ පිළිවෙල ගතයුතු.
2. "ගත්තේය" යන අර්ථවත් ක්‍රියාව යොදනු.

රජුගේ පොකුණට ගොස් නැවාය. 14. ස්ත්‍රියකගේ සොහොයුරිය බෙරයක් මිළට ගෙන යෙහෙළියකට දුන්නාහ. 15. සිංහයෝ ඇතුන් ද ඇතින්නන් ද මරා කා වනයන්හි වාසය කරත්.

33. උකාරාන්ත ඉත්ථිලිංග මාතු - ශබ්දය

ප : ඒකවචන: මාතා (=මවුතොමෝ)
බහුවචන: මාතරො (=මවුවරු)

දු : ඒකවචන: මාතරං (=මව)
බහුවචන: මාතරෙ, මාතරො (=මවුන්)

තː පː කː ඒකවචන: මාතරා, මාතුයා
බහුවචන: මාතරෙහි, මාතරෙභි, මාතූහි, මාතූභි

චː ඡ : ඒකවචන: මාතුයා
බහුවචන: මාතරානං, මාතානං, මාතූනං

ස : ඒකවචන: මාතරි
බහුවචන: මාතරෙසු, මාතූසු

ආ : ඒකවචන: (හෙ) මාත, මාතා
බහුවචන: (හෙ) මාතරො

ධීතු (=දූ), දුහිතු (=දූ) ශබ්දයෝ මාතු ශබ්දයට සමානවෙති.

34. ධෙනු ශබ්දදිය මීට වෙනස්ව වරනැගේ.

ප : ඒකවචන: ධෙනු (=දෙන් තොමෝ)
බහුවචන: ධෙනූ, ධෙනුයො (=දෙන්නු)

දු : ඒකවචන: ධෙනුං (දෙන)
බහුවචන: ධෙනූ, ධෙනුයො (=දෙනුන්)

තː පː කː ඒකවචන: ධෙනුයා
බහුවචන: ධෙනූහි, ධෙනූභි

| | | |
|---|---|---|
| ච: ඡ | : ඒකවචන: | ධේනුයා |
| | බහුවචන: | ධේනූනං |
| ස | : ඒකවචන: | ධේනුයා, ධේනුයා |
| | බහුවචන: | ධේනූසු |
| ආ | : ඒකවචන: | (හෙ) ධේනු |
| | බහුවචන: | (හෙ) ධේනූ, ධේනුයො |

| | | | |
|---|---|---|---|
| යාගු | = කැඳ | රජ්ජු | = රැහැන |
| කණේරු | = ඇතින්න | කාසු | = වළ |
| දද්දු | = දදය | සස්සු | = නැන්දම්මා |
| කණ්ඩු | = කැසීම | විජ්ජු | = විදුලිය |

ධාතු = ධාතුව

මේ ආදීහු ධේනු - ශබ්දය මෙන් වරනැගෙත්.

## අභ්‍යාසය 15.

**සිංහලට නැගියයුතු:**

1. දසියා මාතා ධේනුං රජ්ජුයා බන්ධිත්වා ඉධ ආනෙසි. 2. මය්හං මාතුලානි පාතො යාගුං පචිත්වා ධීතරානං දදිස්සති. 3. කණේරුයො අටවිසු චරිත්වා තත්ථ කාසූසු පතිංසු. 4. ධනවතියො සස්සූ අජ්ජ ඉධ ආගමම භික්ඛූ වන්දිස්සති. 5. රාජිනියා ධීතරො භීයො විහාරං ගන්ත්වා සත්ථාරං මාලාහි පූජේසුං. 6. කඤ්ඤානං පිතරො සද ධීතරානං වුඩ්ඪිං ඉච්ඡන්ති. 7. කුතො ත්වං ධේනුයො කිණිස්සසි? 8. කත්ථ තව භගිනියො නහායිත්වා පචිත්වා භුඤ්ජිංසු? 9. කුමාරා නදියා ච වාපියා ච අන්තරා කීළිසුං. 10. නාරියා ධීතරො ගෙහස්ස අන්තො මඤ්චේසු සයන්ති. 11. ධීතුයා ජඩ්ඝාය‍ං දද්දු අත්ථි. 12. යුවති මාලා ආදය සායං සස්සුයා ගෙහං ගමිස්සති. 13. අම්හාකං මාතරානං ගාවියො සබ්බත්ථ චරිත්වා රත්තියා ආගමිස්සන්ති. 14. ධනවන්තියා නත්තරො මගෙග තිරියං ධාවිත්වා අටවිං පවිසිංසු. 15. අසනි රුක්ඛස්ස උපරි පතිත්වා සාඛා භුඤ්ජිත්වා රුක්ඛං මාරෙසි.

**පාලියට නැගියයුතු:**

1. කන්‍යාවගේ මව තරුණියට මල්දමක් දුනි. 2. ස්ත්‍රිය උදෑසන කඹවලින් දෙනුන් බැඳ කැලයට ගෙනගියාය. 3. තරුණිය ගේ සොහොයුරා දිවයිනේ සෑමතැන ඇවිද අවුත් ආහාර අනුභව කෙළේය. 4. ඔබගේ මවගේ සොහොයුරිය කොහි වසයිද? 5. මාගේ සොහොයුරියගේ දූවරු ගඟේ නා වැවට ගියහ. 6. ඔව්හු කවද ඔරුවකින් එන්නාහුද? 7. දේවියගේ නැන්දම්මා ඊයේ මෙහි අවුත් කෙසෙල් ගස් බැලීය. 8. ධනවතියගේ දූවරු වැවෙහි නා ගම සරස ගියහ. 9. අපේ නැන්ද කැඳ උයා යෙහෙළියන් සමග බොන්නීය. 10. නැන්දම්මාගේ දෙන්නු පර්වතයටත් ගඟටත් අතරෙහි හැසුරුණාහ. 11. තොපගේ මවුවරුත් දූවරුත් කවද විහාරයට ගොස් ධර්මය අසන්නහුද? 12. ඔබ ඇතා ගෙනාවේ කොහෙන් ද? 13. අපේ දෙන්නු වනයෙහි හැසිර වල්හි වැටුණාහ. 14. හෙනය පර්වතය උඩ වැටී එහි ඇතකු මැරුවේය. 15. සොහොයුරියගේ අතෙහි දදයක් ඇත්තේය.

## 35. නපුසංක ලිඞ්ගයෙහි අකාරාන්ත ශබ්දයෝ මෙසේ වරනැගෙත්.

චිත්ත ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | : චිත්තං (=සිත) | චිත්තා, චිත්තානි (=සිත්) |
| දුතියා | : චිත්තං (=සිත) | චිත්තෙ, චිත්තානි (=සිත්) |
| තතියා | : චිත්තෙන (=සිත විසින්) | චිත්තෙහි, චිත්තෙභි (=සිත් විසින්) |
| චතුත්ථී | : චිත්තස්ස (=සිතට) | චිත්තානං (=සිත්වලට) |
| පඤ්චමී | : චිත්තා, චිත්තම්හා, චිත්තස්මා | චිත්තෙහි, චිත්තෙභි |
| ඡට්ඨී | : චිත්තස්ස | චිත්තානං |
| සත්තමී | : චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං | චිත්තෙසු |
| කරණ | : චිත්තෙන | චිත්තෙහි, චිත්තෙභි |
| ආලපන | : (හෙ) චිත්ත | (හෙ) චිත්තා, චිත්තානි |

**මීට සමාන ශබ්දයන්ගෙන් සමහරක්:**

| | | | |
|---|---|---|---|
| ඤාණ | = ඥානය, නුවණ | චේතිය | = චෛත්‍යය |
| දන | = දන | සීල | = ශීලය |
| ධන | = ධනය | පුඤ්ඤ | = පින |
| පාප | = පව | ඵල | = ගෙඩිය, විපාකය |
| රූප | = රූපය | සෝත | = කන |
| ඝාන | = නාසය | සුඛ | = සැපය |
| දුක්ඛ | = දුක | මූල | = මුල, මිල |
| බල | = බලය | කූල | = ඉවුර |
| වන | = වනය | කුල | = පවුල |
| පීඨ | = පුටුව | පදුම | = පියුම |
| තිණ | = තණකොළ | පණ්ණ | = කොළය |
| නයන | = ඇස | වදන | = මූණ |
| සුසාන | = සොහොන | චීවර | = සිවුර |
| ලෝචන | = ඇස | පුලින | = වැලි |
| අමත | = අමෘතය | නගර | = නුවර |
| හදය | = හෘදය | සුවණ්ණ | = රත්රන් |
| ඛීර | = කිරි | උදක | = දිය; ජලය |
| සෝපාණ | = හිණිමග | ආයුධ | = ආයුධය |
| අරඤ්ඤ | = වනය | අණ්ඩ | = බිත්තරය |
| වත්ථ | = වස්ත්‍රය | අලාත | = ගිනිපෙනෙල්ල |
| ඡත්ත | = කුඩය | පුප්ඵ | = මල |

මන ශබ්දදිය මීට වෙනස්ව වරනැගෙත්. මෙහි ඒ වෙනස නොදක්වනු ලැබේ.

36. තුං ප්‍රත්‍යාන්ත ශබ්ද

| | | | |
|---|---|---|---|
| පචිතුං | = පිසන්නට | හරිතුං | = ගෙනයන්ට |
| කත්තුං | = කරන්ට | ආහරිතුං | = ගෙනෙන්ට |
| කාතුං | = කරන්ට | ලද්ධුං | = ලබන්ට |
| ගන්තුං | = යන්ට | ලභිතුං | = ලබන්ට |
| පාතුං | = බොන්ට | භොත්තුං | = අනුභව කරන්ට |
| පිවිතුං | = බොන්ට | භුඤ්ජිතුං | = අනුභව කරන්ට |

## අභ්‍යාසය 16.

**සිංහලට නැගියයුතු:**

1. ධනවන්තො භාතරානං ධනං දතුං න ඉච්ඡන්ති. 2. දනං දත්වා සීලං රක්ඛිත්වා සග්ගෙ නිබ්බත්තිතුං සක්කොන්ති[1]. 3. කුමාරි අලාතං ආහරිත්වා භත්තං පචිතුං අග්ගිං ජාලෙස්සති. 4. නාරියො නගරා නික්ඛම්ම උදකං පාතුං වාපියා කූලං ගච්ඡිංසු. 5. නත්තාරො අරඤ්ඤෙ ඵලානි ආහරිත්වා ඛාදිතුං ආරභිංසු[2]. 6. සීලවා ඉසි ධම්මං දෙසෙතුං පීඨෙ නිසීදි. 7. චොරො ආයුධෙන පහරිත්වා මම පිතුනො අංගුලිං ඡින්දි. 8. යුවතියො පදුමානි ඔචිනිතුං නදිං ගන්ත්වා කූලෙ නිසීදිංසු. 9. මයං ඤත්තානි ආදය සුසානං ගන්ත්වා පුප්ඵානි ඔචිනිස්සාම. 10. කඤ්ඤා වත්ථං ආනෙතුං ආපණං ගමිස්සති. 11. තුම්හෙ වනං ගන්ත්වා ගාවීනං දාතුං පණ්ණානි ආහරථ. 12. මයං ලොචනෙහි රූපානි පස්සිත්වා සුඛං දුක්ඛං ච ලභාම. 13. ත්වං සොතෙන සුණිතුං ඝාණෙන සායිතුං ච සක්කොසි. 14. කුක්කුටියා අණ්ඩානි රුක්ඛස්ස මූලෙ සන්ති. 15. විදූනො අමතං ලභිත්වා මරණං න භායන්ති. 16. මනුස්සා චිත්තෙන චින්තෙත්වා පුඤ්ඤානි කරිස්සන්ති. 17. තුම්හෙ ධම්මං සොතුං විහාරං ගන්ත්වා පුලිනෙ නිසීදථ. 18. ධනවන්තො සුවණ්ණං දත්වා ඤාණං ලද්ධුං න සක්කොන්ති. 19. දරකො ඡත්තං ගණ්හිතුං සොපාණං ආරුහි. 20. මම භගිනී පුඤ්ඤං ලභිතුං සීලං රක්ඛිස්සති.

---

1. සක්නොති – හැකිවේ.
2. ආරභි – පටන් ගත්තේය.

**පාලියට නැගියයුතු:**

1. ළමයි ගෙඩි කන්ට ගස මුලට ගියාහ. 2. තරුණිය මල් කඩා රැස් කරන්ට ගසට නැංගාය. 3. මම කුඩයක් ද වස්ත්‍රයක් ද ගෙන ඒමට ගෙට ගියෙමි. 4. කුමරිය ගිනි දල්වන්ට ගිනි පෙනෙල්ලක් ඉල්විය. 5. අපි ඇස්වලින් රූප බලන්ට සමර්ථවෙමු.[1] 6. තෙපි නාස්වලින් ගඳ දන ගන්නහුය. කන්වලින් අසන්නහුය. 7. බණ අසන්ට ගොස් ඔවුහු වැලි මත්තෙහි හිඳගත්හ. 8. මිනිස්සු මුදල් දී ඍනය ගන්ට නොහැකි වෙති. 9. ධනවතා තමාගේ (=අත්තනො) ධනය බෙද දූවරුන්ට හා පුතුන්ට දුන්නේය. 10. තරුණියෝ ගඟේ නෑම පිණිස තුවරින් පිටත ගියහ. 11. සතුරා ආයුධයකින් ගසා මාගේ නැන්දම්මාගේ අත කැපුවේය. 12. ඔවුහු උයනට ගොස් ළමයින්ට මල් හා ගෙඩි ගෙනාහ. 13. හෙතෙම දෙනුන්ට දීමට තණ හා කොළ ගෙන ඒමට වනයට ගියේය. 14. පිරිමි ළමයි ද ගැණු ළමයි ද චෛත්‍යයට පිදීමට පොකුණෙන් නෙළුම් මල් ගෙනාහ. 15. අපේ සහෝදරයෝ ද සහෝදරියෝ ද වැවේ නා කෑමට හා නිදීමට ගෙදර ආවෝය. 16. ළමයා දිවියකු දක උයන හරහා දුව ගොස් ගඟෙන් එතර විය. 17. තෙපි දනයෙන් හා ශීලයෙන් පින් ලබවු. 18. මාගේ නැන්දගේ දෙන්නු සොහොනෙහි තණ කා දිය බීමට වැවට ගියහ. 19. තරුණියෝ තමන්ගේ සොහොයුරියන්ට මල්දම් සෑදීම පිණිම මල් ගෙනාහ. 20. මගේ සහෝදරයා දෙව්ලොව යෑමට සිල් රකියි.

**37. නපුංසක ලිඟුවෙහි ඉකාරාන්ත ශබ්දයෝ මෙසේ වරනැගෙත්.**

අට්ඨි ශබ්දය

| | | |
|---|---|---|
| පඨමා : | එකවචන: | අට්ඨි (=ඇටය) |
| | බහුවචන: | අට්ඨීනි, අට්ඨී (=ඇට) |
| දුතියා : | එකවචන: | අට්ඨිං (=ඇටය) |
| | බහුවචන: | අට්ඨීනි, අට්ඨී (=ඇට) |
| තතියා : | එකවචන: | අට්ඨිනා (=ඇටය විසින්) |
| | බහුවචන: | අට්ඨීහි, අට්ඨීභි (=ඇට විසින්) |

සෙසු පුලිඟුවෙහි අග්ගි - ශබ්දය මෙන් වරනැගිය යුතු.

1. "හැකිවෙමු" යන්නට සමානයි.

| | | | | | |
|---|---|---|---|---|---|
| වාරි | = ජලය | දධි | = මිදුණුකිරි | සත්ථි | = කලවය |
| අක්ඛි | = ඇස | අච්චි | = ගිනිසිළ | සප්පි | = ගිතෙල් |

යනාදීහු මීට සමාන වෙති.

38. උකාරාන්ත චක්ඛු – ශබ්දය

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨ: | චක්ඛු (=ඇසතෙම) | චක්ඛූනි, චක්ඛූ (=ඇස්) |
| දු: | චක්ඛුං (=ඇස) | චක්ඛූනි, චක්ඛූ (=ඇස්) |
| ත: | චක්ඛුනා (=ඇස විසින්) | චක්ඛූහි, චක්ඛූභි (=ඇස් විසින්) |

සෙස්ස පුල්ලිඞ්ගයෙහි ගරු – ශබ්දය මෙන් වරනැගිය යුතු.

මේ දෙතැන්හිම කරණ විභක්තීහු තතියා විභක්තීන්ට ද ආලපන විභක්ති පඨමා විභක්තීන්ට ද සමාන වෙතියි දතයුතු:

| | | | | | |
|---|---|---|---|---|---|
| ආයු | = ආයුෂ | මධු | = මීපැණි | ජතු | = ලාකඩ |
| ධනු | = දුන්න | අස්සු | = කඳුළු | තිපු | = ඊයම් |
| හිංගු | = පෙරුම්කායම් | අම්බු | = ජලය | දරු | = දර |

යනාදීහු චක්ඛු ශබ්දයට සමාන වෙති.

**39. (අ) තවත් නිපාත පද**

| | | | |
|---|---|---|---|
| වා | = හෝ; නොහොත් | නානා | = නොයෙක්; වෙන්වූ |
| සකිං | = වරක් | විනා | = හැර; නැතිව |
| කස්මා | = කවර හෙයකින් | කථං | = කෙසේ |
| තස්මා | = එහෙයින් | පරතො | = ඉදිරියෙහි |
| ච | = ද, ත් | කිමත්ථං | = කුමකට |

# අභ්‍යාසය 17.

**සිංහලට නැගියයුතු:**

1. මයං ගාවියා ඛීරං, ඛීරම්හා දධිං, දධිම්හා සප්පිංච ලභාම. 2. මාතා ධීතුයා අක්ඛීසු අස්සූනි දිස්වා තස්ස (=ඇගේ) වදනං වාරිනා ධොවි. 3. කස්මා ත්වං අජ්ජ වාපිං ගන්ත්වා පුන නදිං ගන්තුං ඉච්ඡසි? 4. කථං තව භාතරො නදියා පදුමානි ඔචිනිත්වා ආහරිස්සන්ති? 5. අඩා තෙ ධනූනි ආදය වනං පවිසිත්වා මිගෙ මාරෙත්වා ආනෙස්සන්ති. 6. අම්හාකං පිතරො තද වනම්හා මධුං ආහරිත්වා දධිනා සහ භුඤ්ජිංසු. 7. මයං සුවෙ තුම්හෙහි[1] විනා අරඤ්ඤං ගන්ත්වා දරූනි භුඤ්ජිස්සාම. 8. කුමාරා සීඝං ධාවිත්වා වාපියං කීළිත්වා සනිකං ගෙහානි අගමිංසු. 9. තුම්හෙ ඛීරං පිවිතුං ඉච්ඡථ? අථ වා දධිං භුඤ්ජිතුං. 10. යාව මය්හං පිතා නහායිස්සති තාව අහං ඉධ තිට්ඨාමි. 11. යථා භූපති ආණාපෙති, තථා ත්වං කරොහි. 12. ආම, අහං භූපතිනො වචනං අතික්කමිතුං[2] න සක්කොමි.

**පාලියට නැගියයුතු:**

1. උඹලා කිරි බොන්ට කැමැත්තාහුද? නොහොත් මිදුණු කිරි කන්ට කැමැත්තාහු ද? 2. මම පළමුකොට කැඳ බී මී පැණි සමග දීකිරි කන්නෙමි. 3. කඩයට ගොස් වහා ගිතෙල් ගෙනෙව. 4. මූදේ නා ඇවිත් දූන් නැවත එහි කුමට යන්නෙහි ද? 5. අපේ පියවරු කෙසේ වනයෙන් මී පැණි එකතු කළාහුදැයි[3] තෝ දන්නෙහි ද? 6. ඔබ ගඟෙන් එතෙර ගොස් එනතුරු මම ගං ඉවුරෙහි සිටින්නෙමි. 7. මාගේ නැන්දම්මා පිරිස නැතිව නුවරට ගොස් සහෝදරියක සමග ආවාය. 8. සිටුතෙම රජුගේ පා ළඟ[4] වැටී රජුට[5] වැන්දේය. 9. ඔබගේ අශ්වයා ඉක්මනට දුවන්ට සමර්ථ ද? 10. ඔව්, ඌ ඒකාන්තයෙන් ඉක්මනින් දුවන්නේය. 11. ගමේ මිනිස්සු දුනු ගෙන වනයට ගොස් ඇතකු මරා උගේ දළ කැපූහ. 12. ඔබගේ පියා කුමක් හෙයින් වැලිමත්තෙහි හෙමින් ඇවිදින්නේ ද?

---

1.
2. ඉක්මවන්ට
3. යි – යන්ට පාලියෙන් ඉති ශබ්දය යොදනු.
4. සත්තමී බහු වචනය යෙදිය යුතු.
5. කර්ම විභක්තිය යෙදිය යුතු.

# නාම විභාගය

39. (ආ) නාමපද වනාහි

(1) නාමනාම (2) සබ්බනාම

(3) සමාසනාම (4) තද්ධිතනාම

(5) කිතකනාම යන පස් කොටසකට බෙදන ලදහ.

(2) **සබ්බනාම** නම්, ත (=ඒ), ඉම (=මේ), ය (=යම්), සබ්බ (=සියලු), ඉතර (=අනික්) අම්හ (=මම), තුම්හ (=තෝ) යනාදිය යි.

(3) **සමාසනාම** නම් පද දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ එක් වී සෑදෙන නාමයෝයි. තිලුප්පල (=තිල් උපුල්) රාජපුත්ත (=රාජ පුත්‍ර), සුරාසුරනරොරග (=දෙවි අසුර මිනිස් සර්ප) යනාදියයි.

(4) **තද්ධිතනාම** නම්: නාමයකින් පරව 'ඔහුගේ පුත්‍රයා' යනාදි අර්ථයෙක්හි යම්කිසි ප්‍රත්‍යයක් වී සෑදෙන නාමයෝයි. සමණ - ශබ්දය කෙරෙන් පුත්‍රාර්ථයෙහි ණෙර යන ප්‍රත්‍ය වී සාමණෙර යන්න සෑදේ. "ශ්‍රමණයාගේ පුත්‍ර" යන අර්ථ ඇත්තේය.

(5) **කිතකනාම** නම් ධාතුවකින් ප්‍රත්‍යයක් වී සෑදෙන නාමයකි. දීමෙහි වූ ද - ධාතුව කෙරෙන් ණ්වු ප්‍රත්‍යය වී නැවත ඒ ප්‍රත්‍යයට 'අක' යන ආදේශය වීමෙන් දායක යන නාමය සෑදේ. 'දෙන්නා' යන අර්ථ ඇත්තේය.

(6) මෙකී නාම සතරෙන් වෙන්වූ රුක්ඛ (=ගස), මනුස්ස (=මිනිස්), අස්ස (=අශ්ව), භූමි (=පොළොව), චිත්ත (=සිත) ආදී ශබ්දයෝ නාමනාම නම් වෙත්.

'සාරිපුත්ත', 'ආනන්ද' ආදී සංඥා නාමයෝ ද මෙහිම ඇතුළත් වෙති.

## සර්වනාමයෝ

### PRONOUNS

40. සර්වනාමයෝ ලිඟු තුනෙහිම වැටෙති. පුරුෂයකු වෙනුවෙන් හෝ පුරුෂයෙකුගේ විශෙෂණයක් වශයෙන් සර්ව නාමයක් යොදන කල්හි පුල්ලිඞ්ගයෙහි ද, ස්ත්‍රියක වෙනුවෙන් හෝ ස්ත්‍රියකට විශෙෂණ

කොට යොදන කල්හි ඉත්ථිලිඞගයෙහි ද, නපුංසකයකු වෙනුවෙන් හෝ ඔහුට විශෙෂණ කොට යොදන කල්හි නපුංසක ලිඞගයෙහි ද වැටෙත්.

මෙහි 'පුරුෂයකු' 'ස්ත්‍රියක' 'නපුංසකයකු' යයි කියන ලද නමුත් ඒ ලිඟු තුනෙහි වැටෙන අන්‍ය ශබ්දයන් වෙනුවෙන් යෙදෙන කල්හි හෝ ඒ ශබ්දයන් විශෙෂ කරන කල්හිත් සර්වනාමයෝ ඒ ඒ ශබ්දයන්ගේ ලිඟුව ගනිත්. (විශේෂණය ගැන පසුව කරුණු දක්වනු ලැබේ.)

"පුරිසො අජ්ජ ගාමං ගච්ඡති සො සුවෙ ආගමිස්සති" (=පුරුෂයා) අද ගමට යයි. හෙතෙම හෙට (හැරී එන්නේය.) යන තැන 'සො' යන්න සර්වනාමයකි. එය පළමු කී පුරුෂයා වෙනුවට යෙදී තිබේ. එබැවින් එය පුල්ලිඞගයෙහි වේ.

"අයං පුරුසො රුක්ඛං ඡින්දති" (මේ මිනිසා ගස කපයි) යන තැන 'අයං' යන සර්වනාමය 'පුරිසො' යන්නට විශෙෂණව යෙදී තිබේ.

"එකා කඤ්ඤා භත්තං පචි; සා තං භුඤ්ජිස්සති" (=එක් කන්‍යාවක් බත් පිසීය. ඕ එය අනුභව කරන්නීය) යන තැන 'සා' යන සර්වනාමය 'කඤ්ඤා' වෙනුවට යෙදී තිබේ. කඤ්ඤා ඉත්ථිලිඞගයෙහි බැවින් ඒ වෙනුවට යෙදූ සර්ව නාමයත් ඉත්ථි ලිඞගයෙහි වේ. එකා යන සර්වනාමය 'කඤ්ඤා' යන්නට විශෙෂණව යෙදී තිබේ.

"අයං දරකො ඵලානි ඔචිනිත්වා තානි භාතරානං අදසි" (=මේ ළමයා ගෙඩි කඩා රැස්කොට ඒවා සොහොයුරන්ට දුන්නේය) යන තැන 'තානි' යන සර්වනාමය 'ඵලානි' වෙනුවට යෙදී තිබේ. ඵල ශබ්දය නපුංසකයෙහි බැවින් 'තානි' යන්න ද නපුංසකයෙහි වේ.

41. සර්වනාමයක් වූ ය - ශබ්දය ලිඟු තුනෙහි වරනැගෙන ආකාරය.

**පුල්ලිඞ්ගයෙහි**

| | | |
|---|---|---|
| පඨමා | : එකවචන: | යො (=යමෙක්) |
| | බහුවචන: | යෙ (=යම් කෙනෙක්) |
| දුතියා | : එකවචන: | යං (=යමකු ) |
| | බහුවචන: | යෙ (=යම් කෙනෙකුන්ට) |
| තතියා | : එකවචන: | යෙන (=යමකු විසින්) |
| | බහුවචන: | යෙභි, යෙහි (යම් කෙනෙකුන් විසින්) |
| චතු: ඡට්ඨී | : එකවචන: | යස්ස |
| | බහුවචන: | යෙසං, යෙසානං |
| පඤ්චමී | : එකවචන: | යම්හා, යස්මා |
| | බහුවචන: | යෙභි, යෙහි |
| සත්තමී | : එකවචන: | යම්හි, යස්මිං |
| | බහුවචන: | යෙසු |
| කරණ | : එකවචන: | යෙන |
| | බහුවචන: | යෙභි, යෙහි |

මේ ය - ශබ්දය හා තවත් බොහෝ සර්වනාමවලට ආලපනයක් නැත.

**ඉත්ථිලිඞ්ගයෙහි**

| | එකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | : යා (යම් ස්ත්‍රියක්) | යා, යායො (යම් ස්ත්‍රීහු) |
| දුතියා | : යං (යම් ස්ත්‍රියකු) | යා, යායො (යම් ස්ත්‍රීන්) |
| තති: කර : පඤ්ච : | යාය | යාභි, යාහි |
| චතු: ඡට්ඨී | : යස්සා, යාය | යාසං, යාසානං |
| සත්ත | : යස්සා: යායං | යාසු |

### නපුංසක ලිංගයෙහි

පඨමා : එකවචන: යං (=යම් දෙයක් හෝ යමක්)

බහුවචන: යෙ, යානි (=යම් දේවල්)

දුතියා : එකවචන: යං (=යමක්)

බහුවචන: යෙ, යානි (=යම් දේවල්)

තතියා : එකවචන: යෙන

බහුවචන: යෙභි, යෙහි

ඉතිරි සියල්ල පුල්ලිංගයෙහි මෙනි.

සබ්බ = සියලු

අඤ්ඤතර = එක්තරා, අප්‍රකට වූ

අඤ්ඤ = අනෙක්

අපර = අන්‍ය, බටහිර දෙස, පසු

ඉතර = (දෙදෙනාගෙන්) අනිකා

කතර = (දෙදෙනාගෙන්) කවරෙක්

උභය = දෙදෙන

කතම = (බොහෝ දෙනාගෙන්) කවරෙක්

ක (මුල කිං) = කවර

පර = පසු වූ, අන්‍ය

එක = එක්තරා

යන ශබ්ද ද ය - ශබ්දය මෙන් ලිංගත්‍රයෙහි වරනැගිය යුතු.

42. මේ ශබ්දයන් අතුරෙන් අඤ්ඤ, අඤ්ඤතර, ඉතර, එක ශබ්දයන්ගේ ඉත්ථිලිඞ්ගයෙහි චතුත්ථී - ඡට්ඨී - එකවචනවල

අඤ්ඤිස්සා, අඤ්ඤතරිස්සා, ඉතරිස්සා, එකිස්සා යන වචන ද සත්තමී එකවචනයෙහි;

අඤ්ඤිස්සං, අඤ්ඤතරිස්සං, ඉතරිස්සං, එකිස්සං යන වචන ද පුබ්බ, පර, අපර යන ශබ්දයන්ගේ පුලිඞ්ගයේ පඤ්චමී එකවචනයෙහි;

පුබ්බා, පරා, අපරා යන වචන ද

සත්තමී එකවචනයෙහි පුබ්බෙ, පරෙ, අපරෙ යන වචන ද දක්නා ලැබෙත්.

43. සර්වනාම වශයෙන් ද විශෙෂණ වශයෙන් දැයි සර්වනාමයන්ගේ දෙයාකාර වූ පැවැත්මක් ඇත්තේය.

අඤ්ඤො (=අනිකෙක්) යි තනිව දක්වූ විට එය තවත් ශබ්දයකට විශෙෂණ නොවේ. අන්‍ය ශබ්දයක් වෙනුවෙන් සිටින්නේ වේ. මෙහි මේ අඤ්ඤ ශබ්දයෙන් ප්‍රකාශ කරනු ලබන්නා කවරෙක්දැයි නොපෙනෙන නමුත් පුල්ලිංගයෙන් දක්වූ බැවින් පුරුෂයකු හෝ පුල්ලිඞ්ගයෙහි වූ අන්‍ය සත්ත්වයකු හෝ ද්‍රව්‍යයක් වෙනුවෙන් යොදන ලද බව පැහැදිලිය.

අඤ්ඤො පුරිසො (=අන් පුරුෂයෙක්)

යි කී කල්හි "අඤ්ඤො" යන්න "පුරිසො" යන්නට විශෙෂණව සිටී. පුරුෂයෝ බොහෝ දෙනෙක් නම්:

අඤ්ඤ පුරිසා (=අන් පුරුෂයෝ)

යි පුරිස - ශබ්දය බහුවචනය අනුව අඤ්ඤ - ශබ්දය ද බහු වචනයෙන් යුක්ත වේ.

ඉතරා වනිතා (=අනික් ස්ත්‍රිය)

ඉතරායො වනිතායො (=අන්‍ය ස්ත්‍රීහු)

වනිතා - ශබ්දය ඉත්ථිලිඞ්ගයෙහි බැවින් ඒ සමග යෙදුණු ඉතර - ශබ්දය ද ඉත්ථිලිඞ්ගයෙහි වේ.

යං ඵලං (=යම් ගෙඩියක්)

යානි ඵලානි (=යම් ගෙඩි)

ඵල - ශබ්දය නපුංසකයෙහි බැවින් ය - ශබ්දය ද නපුංසකයෙහි වේ. මෙසේ සර්වනාමයෝ යමකු වෙනුවට පෙනී සිටිත් නම් ඔහුගේ ලිඞ්ග විභක්ති - වචන ද යම් නාමයක් හා (සම්බන්ධව) යෙදෙත් නම් ඒ නාමයෙන් ලිඞ්ග - විභක්ති වචන ද ගන්නා බව සැලකිය යුතු.

# අභ්‍යාසය 18.

**සිංහලට නැගියයුතු:**

1. සබ්බෙසං නත්තාරො පඤ්ඤවන්තො න භවන්ති. 2. සබ්බ ඉත්ථියො වාපියං නහාත්වා පදුමානි පිළන්ධිත්වා ආගච්ඡිංසු. 3. වාණිජො සබ්බං ධනං යාචකානං දත්වා අඤ්ඤං රට්ඨං අගමි. 4. මාතා උභයාසම්පි ධීතරානං වත්ථානි කිණිත්වා දදිස්සති. 5. කො නදියා වාපියා ච අන්තරා ධෙනුං හරති? 6. කස්ස පුත්තො දක්ඛිණං දිසං ගන්ත්වා වීහිං ආහරිස්සති? 7. යෙ පාපානි කරොන්ති, තෙ නිරයෙ නිබ්බත්තිත්වා දුක්ඛං ලභිස්සන්ති. 8. කාසං ධීතරො වනම්හා දරූනි ආහරිත්වා ඔදනං පචිස්සන්ති? 9. කතරෙන මග්ගෙන සො පුරිසො නගරං ගන්ත්වා භණ්ඩානි කිණි? 10. ඉතරා දරිකා වනිතාය හත්ථා පුප්ඵානි ගහෙත්වා චෙතියං පූජෙසි. 11. පරෙසං ධනං ධඤ්ඤං වා ගණ්හිතුං මා වින්තෙථ. 12. අපරො අඤ්ඤිස්සං වාපියං නහාත්වා පුබ්බාය දිසාය නගරං පාවිසි.

**පාලියට නැගියයුතු:**

1. ගෙවල් හා වීථි ද උයන් ද බැලීම පිණිස සියලු දෙන නුවරට ඇතුලු වූහ. 2. ගමේ සියලු ස්ත්‍රීන්ගේ දූවරු මාගීයෙන් චෛත්‍ය (චෙත)ට ගියහ. 3. අන්‍ය කන්‍යාවක් නෙලුම් මලක් ගෙන අතිකියකට දුණි. 4. කවරෙක් මට කිරි හෝ දීකිරි ගෙනෙන්නේද? 5. කවරහු ගංඉවුරේ සිටගෙන දකුණු දිශාව බලත් ද? 6. සියලු ධනවතුන්ගේ පුත්‍රයෝ හැමවිටම ධනවත්තු නොවෙති. 7. කවුරුන්ගේ මුණුබුරෝ දෙනුත් මෙහි ගෙනවුත් කන්ට තණකොළ දුන්නාහු ද? 8. හෙට නුවර සියලු ස්ත්‍රීහු පිටතට අවුත් වනයෙහි ඇවිදින්නාහ. 9. අතික් ස්ත්‍රිය වීථියෙහි දිවියකු දක උයන හරහා දිව්වාය. 10. දන් දීමෙන් පින් රැස් කරන්නෝ ස්වගීයෙහි උපදින්නාහ. 11. එක්තරා මිනිහෙක් පොකුණෙන් නෙලුම්මල් ගෙනාවේය. අන් මිනිසෙක් ඒවා විකිණීමට කඩයට ගෙන ගියේය. 12. මාගේ සහෝදරයාගේ පුතා මල් කොළ හා ගෙඩි කඩා රැස්කිරීම පිණිස අතික් ගහේ අතු කැඩුවේය.

44. ත - ශබ්දය

### පුල්ලිඟුවෙහි

| | | එකවචන | බහුවචන |
|---|---|---|---|
| පඨමා | : | සො (=හෙතෙම) | තෙ (=ඔවුහු) |
| දුතියා | : | තං (=ඔහු) | තෙ (=ඔවුන්) |
| තතියා | : | තෙන (=ඔහු විසින්) | තෙහි, තෙහි (=ඔවුන් විසින්) |
| ච: ඡ | : | තස්ස | තෙසං, තෙසානං |
| පඤ්චමී | : | තම්හා, තස්මා | තෙහි, තෙහි |

### ඉත්ථිලිඞ්ගයෙහි

| | | | |
|---|---|---|---|
| ප | : | සා (=ඕතොමෝ, ඇ) | තා, තායො (=ඇලා) |
| දු | : | තං (=ඇය) | තා, තායො (=ඇලා) |
| ත | : | තාය | තාහි, තාභි |
| ච: ඡ | : | තස්සා, තාය | තාසං, තාසානං |
| ස | : | තස්සං, තායං | තාසු |

### නපුංසකයෙහි

| | | | |
|---|---|---|---|
| ප | : | තං (=එය) | තෙ, තානි (=ඒවා, ඔවුහු) |
| දු | : | තං (=එය) | තෙ, තානි (=ඒවා, ඔවුන්) |

සෙස්ස පුල්ලිඟුවෙහි මෙනි.

45. එත - ශබ්දය ද ත - ශබ්දයට සමාන වේ.

| | | | |
|---|---|---|---|
| ප | : | එසො (=අර පුරුෂතෙම) | එතෙ (=අර පුරුෂයෝ තුමූ) |
| දු | : | එතං (=අර පුරුෂයා) | එතෙ (=අර පුරුෂයන්) |
| ප | : | එසා (අර ස්ත්‍රී තොමෝ) | එතා, එතායො (=අර ස්ත්‍රීහු තුමූ) |

දු : එතං (=අර ස්ත්‍රිය) එතා, එතායො (=අර ස්ත්‍රීන්)

ප : එතං (=අර දෙය) එතා, එතායො (=අර දේවල්)

දු : එතං (=අර දෙය) එතෙ, එතානි (=අර දේවල්)

යනාදි වශයෙන් දතයුතුයි.

ත - ශබ්දයේ පුල්ලිඞ්ග ඉත්ථිලිඞ්ගයෙහි පඨමා එකවචනයන් හැර ඉතිරි සියලු තැන්හි නෙ, නා, නායො, නං, නානි යනාදි න කාරයෙන් යුක්ත පද සෑදෙති. එත ශබ්දයේ දුතියා - තතියාවන්හි පමණක් 'එනං, එනෙ' ආදි පද විද්‍යමාන වෙති.

46. ඉම - ශබ්දය

**පුල්ලිඞ්ග**

| | | |
|---|---|---|
| ප : | එක: | අයං (=මේතෙම) |
| | බහු: | ඉමෙ (=මොවුහු තුමූ) |
| දු : | එක: | ඉමං (=මොහු) |
| | බහු: | ඉමෙ (=මොවුන්) |
| ත : | එක: | ඉමිනා, අනෙන (=මොහු විසින්) |
| | බහු: | ඉමෙහි, ඉමෙභි, එහි, එභි (=මොවුන් විසින්) |
| ච: ඡ : | එක: | ඉමස්ස, අස්ස |
| | බහු: | ඉමෙසං, ඉමෙසානං, එසං, එසානං |
| පඤ්ච : | එක: | ඉමම්හා, ඉමස්මා, අස්මා |
| | බහු: | ඉමෙහි, ඉමෙභි, එහි, එභි |
| ස : | එක: | ඉමම්හි, ඉමස්මිං, අස්මිං |
| | බහු: | ඉමෙසු, එසු |

### ඉත්ථිලිඞ්ග

| | | |
|---|---|---|
| ප : | එක: | අයං (=මෝ තොමෝ) |
| | බහු: | ඉමා, ඉමායො (=මැලා) |
| දු : | එක: | ඉමං (=මෑ) |
| | බහු: | ඉමා, ඉමායො (=මැලා) |
| ත : | එක: | ඉමාය (= මෑ විසින්) |
| | බහු: | ඉමාභි, ඉමාහි (=මැලා විසින්) |
| ච: ඡ : | එක: | ඉමිස්සා, ඉමාය, අස්සා, අස්සාය |
| | බහු: | ඉමාසා, ඉමාසානං |
| පඤ්ච : | එක: | ඉමාය |
| | බහු: | ඉමාභි, ඉමාහි |
| ස : | එක: | ඉමිස්සං, ඉමායං, අසසං |
| | බහු: | ඉමාසු |
| ප : | එක: | ඉදං, ඉමං (=මෙය, මේ දේ) |
| | බහු: | ඉමෙ, ඉමානි (=මේවා) |
| දු : | එක: | ඉදං, ඉමං (=මෙය, මේ දේ) |
| | බහු: | ඉමෙ, ඉමානි (=මේවා) |
| ත : | එක: | ඉමිනා, අනෙන (=මෙය විසින්) |

සෙස්ස පුල්ලිඟුවෙහි මෙනි.

## අභ්‍යාසය 19.

**සිංහලට නැගියයුතු:**

1. අයං සීහො තුම්හා වනම්හා නික්ඛම්ම ඉමස්මිං මගෙග එකං ඉත්ථිං මාරෙසි. 2. සො තාසං යුවතීනං තානි වත්ථානි වික්කිණිත්වා මූලානි ලභිස්සති. 3. ඉමිස්සා ධීතරො අස්මා වනම්හා ඉමානි ඵලානි ආහරිංසු, අඤ්ඤා නාරියො තානි ඛාදිතුං ගණ්හිංසු. 4. ඉමං සබ්බා යුවතියො තං විහාරං ගන්ත්වා ධම්මං සුත්වා බුඩං

වන්දිස්සන්ති. 5. ඉමෙ මනුස්සා යානි පුඤ්ඤානි වා පාපානි වා කරොන්ති, තානි තෙ අනුගච්ඡන්ති. 6. තස්සා කඤ්ඤාය මාතා දක්ඛිණාය දිසාය ඉමං ගාමං ආගන්ත්වා ඉධ චිරං වසිස්සති. 7. තස්ස නත්තා ඉමස්ස භාතරා සද්ධිං නගරං ගන්ත්වා තානි භණ්ඩානි කිණිස්සති. 8. තා නාරියො එතාසං සබ්බාසං කුමාරිනං හත්ථෙසු පදුමානි ඨපෙසුං. 9. තස්සා රාජිනියා තා දසියො ඉමෙහි රුක්ඛෙහි ඉමානි පුප්ඵානි ඔචිනිත්වා ඉමා මාලා කරිංසු. 10. තෙසං සො ඉමං ධනං දත්වා සුඛං ලභිස්සති? 11. යො මගෙග ගච්ඡති, තස්ස පුත්තො සුරං පිවිත්වා එත්ථ සයති. 12. තෙ තං ඛෙත්තං ගන්ත්වා තිණං ආහරිත්වා ඉමාසං ගාවිනං දත්වා ඛීරං ලභිතුං ඉච්ඡන්ති?

**පාලියට නැගියයුතු:**

1. එක්තරා මිනිහෙක් ඒ සොහොනට ගොස් ඒ මල් නෙලා මෙහි ගෙනාවේය. 2. මේ සිංහදෙන ඒ වනයෙන් පිටත අවුත් මෙතැනදී දෙනක මැරුවාය. 3. අර ස්ත්‍රියගේ ස්වාමිපුරුෂයා කඩයෙන් මේ රෙදි ගෙනැවිත් ඔහුගේ මුනුබුරන්ට දුන්නේය. 4. ඔබටත් මටත් බඩු ගෙන ඒම පිණිස කවරෙක් කොළඹට යන්නේ ද? 5. හෙට ඔහුගේ සහෝදරවරු ඒ වනයට ගොස් මීපැණි හා ගෙඩි එකතුකර ගන්නාහ. 6. ඇගේ සොහොයුරියෝ මේ දෙනුන්ට තණකොළ ගෙන ඒම පිණිස අර කෙතට ගියහ. 7. මම මේ පියුම් හා මල් අර ගමේ එක්තරා ස්ත්‍රියකගෙන් ලදිමි. 8. අද මෙනුවර සියලු තරුණියෝ අර ගඟට ගොස් එහි නාත්නාහ. 9. ඔවුහු ඒ වෙළෙඳුන්ට දෙනුන් විකුණා ඒ මුදලෙන් රෙදි ද මල්දම් ද කුඩ ද ගත්තාහ. 10. ඔවුහු ඒ බඩු අර වෙළෙඳ සැලේ එක් වෙළෙන්දෙකුට දීමට ගෙනාහ. 11. ඊයේ කවර කෙනෙක් මේ වනයෙහි සිංහයකු මැරුවාහු ද? 12. කවර ස්ත්‍රියක් ඇගේ මල්දම සොරකම්කොට වීථියෙහි දිව්වා ද?

## අභ්‍යාසය 20.

**"අස්ස. ඉමෙ. ඉමං. ඉමස්මිං. කස්ස. තස්මිං. තාසං. සබ්බෙ. සො. යෙ. තෙ. ඉමානි. එතෙ. සබ්බේසං. තස්සා."**

යන වචනයන් යෝග්‍ය ලෙස දමා පහත පෙනෙන වාක්‍යයන්ගේ අඩුතැන් පිරවිය යුතු -

1. ..................................... භාතා වනං ගන්ත්වා සීහං විජ්ඣි.
2. අම්හාකං පිතරෝ .......................................... ගෙහං කිණිංසු.
3. ............................ පුරිසා ඵලානි ඔචිනිත්වා වික්කිණන්ති.
4. .................. රුක්ඛෙ පුප්ඵානි න සන්ති; පණ්ණානි සන්ති.
5. ................................................ ධාවිත්වා පතිත්වා උට්ඨාසි.
6. ...................... පුත්තා ................................. ගොණං පහරිංසු?
7. යුවතීනං මාතරෝ .......................................... වත්ථානි අදංසු.
8. ................................ වනෙ සීහා නසන්ති, ව්‍යග්ඝා වසන්ති.
9. .................................. විහාරං ගන්ත්වා ධම්මං සුණිස්සන්ති.
10. ......... පුඤ්ඤං කරිස්සති ...................... සග්ගෙ නිබ්බත්තිස්සති.
11. පීඨෙසු නිසීදිංසු ............................ නගරෙ ආපණං අගමිංසු.
12. කො ........................................................... ආයුධානි ආහරි?
13. ...................................... පදුමානි ඔචිනිතුං නදිං ගමිස්සන්ති.
14. ............................................................... පුත්තා මරිස්සන්ති.
15. කුමාරි වත්ථං කිණිත්වා ................................ භාතුනො අදසි.

පහත පෙනෙන වාක්‍යයන්හි අඩුතැන් මෙම පූර්ව ක්‍රියාවලින් ගැළපෙන එකක් හෝ දෙකක් යොද පිරවිය යුතු:

**"පචිත්වා, භුඤ්ජිත්වා, සයිත්වා, ගන්ත්වා, ආගන්ත්වා, සුත්වා, (=අසා) ආහරිත්වා, දත්වා, ඔචිනිත්වා, රක්ඛිත්වා, කත්වා, ඛාදිත්වා, මාරෙත්වා, කිණිත්වා, නහාත්වා"**

1. තස්ස පුත්තො භත්තං ................................... සයිත්වා කිළි.
2. සබ්බා ඉත්ථියො .................................. භුඤ්ජිත්වා සයිස්සන්ති.
3. අහං ගාමං ............................................ ඵලානි ආනෙස්සාමි.
4. කුමාරි මච්ඡෙ ............................ උට්ඨහිත්වා භත්තං භුඤ්ජි.

5. කුමාරියා මාතා වාපියං ...................................... භුඤ්ජිස්සති.

6. තා ඉත්ථියො නදියං පදුමානි............ නගරෙ වික්කිණිංසු.

7. තාසං මාතරො අටවිං ...................................................... දරූනි
...................................................................................... ආහරිස්සන්ති.

8. තුය්හං පිතා විහාරං ...................................................... ධම්මං
...................................................................................... ආගමිස්සති.

9. එකො සීහො ගාමං ......................................................... මනුස්සං
...................................................................................... අගමාසි.

10. තුම්හෙ ඵලානි .......................................................... නගරං
...................................................................................... වික්කිණාථ.

11. දනං............................ සීලං ............................ පුඤ්ඤං ලභන්ති.

12. පුඤ්ඤානි ........................... සග්ගෙ නිබ්බත්තන්ති ...................

13. ව්‍යග්ඝො මිගං .................................. සයි.

14. ඉමෙ මනුස්සා ආපණං ................................................ වත්ථානි
...................................................................................... ආගමිංසු.

# මිශ්‍රක්‍රියා කිතකපද

## PRESENT PARTICIPLE

47. **ගච්ඡන්තො** = } යමින්, යන්නේ
**ගච්ඡමානො** = }

**පචන්තො** = } පිසමින්, පිසන්නේ
**පචමානො** = }

මේ ආදිය සිංහල භාෂාවෙහි මිශ්‍රක්‍රියායයි කියනු ලැබේ. පාලියෙහි කිතකපද වෙති. **කිතකපද** නාමයන්ගේ කොටසක් බව යට නාම විභාගයෙහි කියන ලදී. එබැවින් **ගච්ඡන්ත** ආදීහු

නාමපද මෙන් සියලු විභක්තීන්හි වරනැගෙත්. සර්වනාමයන් මෙන් ලිඟු තුනෙහිම යෙදෙත්.

**ගච්ඡන්ත** ශබ්දය පුල්ලිඞ්ගයෙහි මෙසේ වරනැගේ:

| | | |
|---|---|---|
| පඨමා : | එකවචන: | **ගච්ඡං, ගච්ඡන්තො** (=යන්නේ) |
| | බහුවචන: | **ගච්ඡන්තො, ගච්ඡන්තා** (=යන්නෝ) |
| දුතියා : | එකවචන: | **ගච්ඡන්ත** (=යන්නා) |
| | බහුවචන: | **ගච්ඡන්තෙ** (=යන්නන්) |
| ත: ක : | එකවචන: | **ගච්ඡතා, ගච්ඡන්තෙන** |
| | බහුවචන: | **ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි** |
| චතු: ඡ : | එකවචන: | **ගච්ඡතො, ගච්ඡන්තස්ස** |
| | බහුවචන: | **ගච්ඡතං, ගච්ඡන්තානං** |
| පඤ්ච : | එකවචන: | **ගච්ඡතා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා** |
| | බහුවචන: | **ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි** |
| සත්ත : | එකවචන: | **ගච්ඡති, ගච්ඡන්තෙ, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං** |
| | බහුවචන: | **ගච්ඡන්තෙසු** |
| ආල : | එකවචන: | (හෙ) **ගච්ඡං, ගච්ඡ, ගච්ඡා** |
| | බහුවචන: | (හෙ) **ගච්ඡන්තො, ගච්ඡන්තා** |

**ඉත්ථිලිංගයෙහි**

| | | |
|---|---|---|
| පඨ : | එකවචන: | **ගච්ඡන්ති** (=යන්නී) |
| | බහුවචන: | **ගච්ඡන්ති, ගච්ඡන්තියො** (=යන්නියෝ) |
| දුති : | එකවචන: | **ගච්ඡන්තිං** (=යන්නිය) |
| | බහුවචන: | **ගච්ඡන්ති, ගච්ඡන්තියො** (=යන්නියන්) |
| තති : | එකවචන: | **ගච්ඡන්තියා** |
| | බහුවචන: | **ගච්ඡන්තීහි, ගච්ඡන්තීභි** |
| චතු : | එකවචන: | **ගච්ඡන්තියා** |
| | බහුවචන: | **ගච්ඡන්තිනං** |

ආදි වශයෙන් කුමාරි ශබ්දය මෙන් වරනැගිය යුතු.

**නපුංසකයෙහි**

පඨ : ඒකවචන: **ගච්ඡ** (=යන්නා)

බහුවචන: **ගච්ඡන්තා, ගච්ඡන්තානි** (=යන්නෝ)

දුති : ඒකවචන: **ගච්ඡන්තං** (=යන්නාහු)

බහුවචන: **ගච්ඡන්තෙ, ගච්ඡන්තානි** (=යන්නන්)

තති : ඒකවචන: **ගච්ඡතා, ගච්ඡන්තෙන**

බහුවචන: **ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙහි**

ආදි වශයෙන් පුල්ලිංගයෙහි මෙන් වරනැගිය යුතු. ආලපන බහුවචනය **ගච්ඡන්තානි** යි යෙදිය යුතු.

48. පුල්ලිංගයෙහි පඨමා ඒකවචනයට "**යමින්, යන්නේය**" යන අර්ථ දෙකක් යෙදිය හැකිය. හේ මෙසේයි:–

**ගච්ඡන්තො ගොණං හරති.**

(=යන්නා ගොණෙකු ගෙනයයි.)

**සො ගාමං ගච්ඡන්තො රොදති.**

මීටම "හෙතෙම ගමට යන්නේ හඬයි" කියා ද කියහැක.

**ගච්ඡං පුරිසො රොදති** යි කීවිට **ගච්ඡං** යන්න "පුරිසො" යන්නට විශෙෂණව යෙදේ.

**සියලු මිශ්‍රක්‍රියා කිතකපදයන් ගේ මෙ වැනි යෙදුම් ඇති බව සැලකිය යුතුයි.**

"**නාරී භත්තං පචන්තී හසති**" (="ස්ත්‍රිය බත් පිසමින් සිනාසේ)" යි කීවිට "පිසමින්" යන අර්ථ ඇති "**පචන්ති**" යන්න ඉත්ථිලිංගයෙන් යෙදේ. එහෙත් සිංහලෙහි "යමින්, පිසමින්" යනාදිය ලිඟු වශයෙන් වෙනස් කිරීමට ආකාරයක් නැත්තේය.

**ගච්ඡන්ත** – ශබ්දය හා සමානලෙස වරනැගෙන අන්‍ය මිශ්‍රක්‍රියා කිතකපදවලින් සමහරක්:–

| | | | |
|---|---|---|---|
| පචන්ත | = පිසන | සයන්ත | = නිදන |
| කරොන්ත | = කරන | විහරන්ත | = වසන |

| | | | |
|---|---|---|---|
| ධාවන්ත | = දුවන | සුණන්ත | = අසන |
| නහායන්ත | = නාන | පස්සන්ත | = බලන |
| පිවන්ත | = බොන | හරන්ත | = ගෙනයන |
| හසන්ත | = සිනාසෙන | රොදන්ත | = හඬන |
| නිසීදන්ත | = හිඳින | වික්කිණන්ත | = විකුණන |
| තිට්ඨන්ත | = සිටින | කිණන්ත | = මිළදී ගන්න |
| දදන්ත | = දෙන | ආහිණ්ඩන්ත | = ඇවිදින |
| භුඤ්ජන්ත | = අනුභවකරන | චරන්ත | = හැසිරෙන |

මොවුහු **ගච්ඡන්ත** මෙන් තුන් ලිඟුවෙහි වරනැගෙත්. ඉත්ථි ලිංගයේදී **පචන්ති**, **කරොන්තී** ආදී වශයෙන් ඊකාරාන්ත වෙත්.

මේ සියලු ශබ්දයන්ගේ

ගච්ඡමාන පචමාන තිට්ඨමාන

රොදමාන භුඤ්ජමාන දදමාන

ආදී **මාන** යන්නෙන් යුත් රූප ද ඇත්තාහ.

ඒ **මාන** යන්නෙන් අවසන්වන ශබ්ද පුල්ලිංගයෙහි **පුරිස** ශබ්දය මෙන්

**ගච්ඡමානො ගච්ඡමානා**

ආදි වශයෙන් ද

ඉත්ථිලිඞගයේ දී **වනිතා** – ශබ්දය මෙන්

**ගච්ඡමානා ගච්ඡමානා, ගච්ඡමානායො**

ආදී වශයෙන් ද

නපුංසකලිඞගයේ දී

**ගච්ඡමානං ගච්ඡමානා, ගච්ඡමානානි**

ආදී වශයෙන් **චිත්ත** – ශබ්දය මෙන් ද වරනැගෙත්, **න්ත** යන්නෙන් අවසන් වුවත් **මාන** – යන්නෙන් අවසන් වුවත් අර්ථයන්ගේ වෙනසක් නැත.

49. මේ කිතකපදයන් අන්‍ය නාමයන් හා යෙදෙන සැටි මෙසේයි:–

### පුල්ලිංගයෙහි

| | |
|---|---|
| **තිට්ඨං ගොණො** | (=සිටින හෝ සිටින්නා වූ ගොනා) |
| **තිට්ඨන්තා ගොණා** | (=සිටින ගොන්නු) |
| **තිට්ඨන්තං ගොණං** | (=සිටින ගොනා) |
| **තිට්ඨතා ගොණෙන** | (=සිටින ගොනා විසින්) |
| **තිට්ඨන්තෙහි ගොණෙහි** | (=සිටින ගොනුන් විසින්) |
| **තිට්ඨතො ගොණස්ස** | (=සිටින ගොනාට හෝ ගොනාගේ) |
| **තිට්ඨතා ගොණා** | (=සිටින ගොනා කෙරෙන්) |
| **තිට්ඨතං ගොණානං** | (=සිටින ගොනුන්ගේ) |
| **තිට්ඨති ගොණෙ** | (සිටින ගොනා කෙරෙහි) |

### ඉත්ථිලිංගයෙහි

| | |
|---|---|
| **නිසීදන්තී නාරී** | (=හින්නාවූ ස්ත්‍රී) |
| **නිසීදන්තී නාරිං** | (=හින්නා වූ ස්ත්‍රිය) |
| **නිසීදන්තියා නාරියා** | (=හිඳින ස්ත්‍රිය විසින්) |
| **නිසීදන්තීනං නාරීනං** | (=හිඳින ස්ත්‍රීන්ට හෝ ස්ත්‍රීන්ගේ) |
| **නිසීදන්තියං නාරියං** | (=හිඳින ස්ත්‍රිය කෙරෙහි) |

### නපුංසක ලිංගයෙහි

| | |
|---|---|
| **විහරන්තං කුලං** | (=වාසය කරන හෝ වසන කුලය) |
| **විහරන්තානි කුලානි** | (=වසන කුලයෝ) |
| **විහරතා කුලෙන** | (=වසන කුලය විසින්) |
| **විහරතා කුලස්ස** | (=වසන කුලයට) |

ඉතිරි විභක්තීන් ද වචනයන්හි ද යොදන සැටි මේ අනුව තේරුම් ගත යුතුයි.

# අභ්‍යාසය 21.

**සිංහලට නැගියයුතු:**

1. ගාමං ගච්ඡන්තො දරකො එකං ගොණං දිස්වා හායි. 2. දරිකා රොදන්ති අම්මාය සන්තිකං ගන්ත්වා පීඨෙ නිසීදි. 3. වාණිජා හණ්ඩානි වික්කිණන්තා නදියං නහායන්තෙ මනුස්සෙ පස්සිංසු. 4. කඤ්ඤායො හසමානා නහායන්තියො ගච්ඡන්තිං වනිතං අක්කොසිංසු. 5. පුරිසො හසන්තො රුක්ඛං ආරුහිත්වා ඵලානි ඛාදන්තො සාඛායං නිසීදි. 6. හගවා සාවත්ථියං විහරන්තො දෙවානං ච මනුස්සානං ච ධම්මං දෙසෙසි. 7. සා සයන්තිං ඉත්ථිං උට්ඨාපෙත්වා හසමානා තම්හා ඨානා අපගච්ඡි. 8. තුම්හෙ හූමියං සයමානං ඉමං දරකං මඤ්චෙ ඨපෙථ. 9. සීහං දිස්වා හායිත්වා ධාවමානා තෙ මිගා අස්මිං වනෙ ආවාටෙසු පතිංසු. 10. ඉමස්මිං ගාමෙ වසන්තානං පුරිසානං එකො වනං ගච්ඡන්තො එකායං කාසුයං පති. 11. නිසීදන්තියා නාරියා පුත්තො රොදමානො තස්සා සන්තිකං ගමිස්සති. 12. යාචකා හත්තං පචන්තිං ඉත්ථිං ආහාරං යාචන්තා තත්ථ නිසීදිංසු. 13. වනම්හා දරූනි ආහරන්ති කඤ්ඤා උදකං පිවමානා එකස්මිං පාසාණෙ නිසීදි. 14. වාණිජා හණ්ඩානි කිණන්තා ච වික්කිණන්තා ගාමෙසු ච නගරෙසු ච ආහිණ්ඩන්ති.

**පාලියට නැගියයුතු:**

1. දසයා ගහට යන්නේ ගෙඩි කමින් ගසක් මුල හුන්නේය. 2. මව හඬන ළදැරිය ඔසවා බොන්ට කිරි දුන්නීය. 3. අපි ගං ඉවුරේ ඇවිදින්නාහු ගඟෙහි නාන මිනිසුන් දුටිමු. 4. මුවෙක් එහි සිටින අප දැක දුවගොස් වළක වැටුණි. 5. වනයෙන් පිටතට එන සිංහයා කෙතෙහි තණ කන දෙනක දුටුවේය. 6. මේ වනයෙන් දර ගෙනෙන කන්‍යාව අර වැවෙන් වතුර බීවාය. 7. මේ ගමෙහි වසන මිනිහෙක් අර පර්වතයට දුවන සිංහයකු දුටුවේය. 8. අපේ පියවරුත් සොහොයුරෝත් බඩු විකුණමින් ද මිළට ගනිමින් ද ගම්වල ඇවිදින්නාහ. 9. එද කන්ද උඩ සිටි මම ගුහාවෙහි නිදන සිංහදෙනක දුටුවෙමි. 10. ළමයා සිනාසෙමින් දුවගෙන මා වෙතට ආවේය. 11. ගොවියා බෙරයක් ගෙන යන්නේ මේ ගස් හා

කුඹුරු බලමින් මේ ගලඋඩ උන්නේය. 12. බුදුරද බොහෝ කලක් සැවැත් නුවර වසමින් එනුවර මිනිසුන්ට ධර්මය දේශනා කෙළේය. 13. ඔහුගේ සොහොයුරිය ඇගේ සොහොයුරන්ට බත් පිසන්නී පුටුවක හුන්නීය. 14. යාචකයන්ට දන්දෙන සිටු තෙමේ තමාගේ සියලු ධනය දුන්නේය.

## 50. නාමවිශෙෂණ (පද)

| | | | |
|---|---|---|---|
| මහන්ත | = මහත් | සෙත | = සුදු |
| ඛුද්දක | = කුඩා | නීල | = නිල් |
| දීඝ | = දික් | රත්ත | = රතු |
| රස්ස | = කොට, ලුහුඬු | කාල | = කළු |
| උච්ච | = උස්, උසස් | පීත | = කසාවන් |
| නීච | = පහත්, මිටි | උත්තාන | = නොගැඹුරු |
| මජ්ඣිම | = මධ්‍යම | ගම්භීර | = ගැඹුරු |
| බහු | = බොහෝ | ඛර | = කර්කශ |
| අප්පක | = අල්ප, (අඩු)වූ, ටික වූ | මුදු | = මෘදු |
| ආම | = අමු | සුරූප | = මනා රූ ඇති |
| පක්ක | = ඉදුණු, පැසුණු | විරූප | = මනා රූ නැති |
| බාල, දහර | = වයසින් අඩු | සුවණ්ණ | = මනා පැහැ ඇති |
| තනු | = තුනී වූ | මහල්ලක | = මහලු |
| සමීප | = ළං වූ | දුබ්බණ්ණ | = මනා පැහැ නැති |
| විත්ථත | = පතළාවූ, පළල්වූ | ඝන | = ඝනවූ |
| දූර | = දුර වූ | | |

'සෙතො ගොණො' (=සුදු ගොනා) යි කී කල්හි සෙතො යන්නෙන් ගොනාගේ විශේෂයක් දක්වනු ලැබේ. (වෙන පදයක් නැතිව) 'ගොනා' යි කී විට සුදු ගොනෙක්, රතු ගොනෙක්, තර ගොනෙක් යනාදි විශෙෂයක් නැතිව සාමාන්‍යයෙන් ගොනෙක් අදහස් කරනු ලැබේ. 'සුදු ගොනා' හෝ 'රතු ගොනා' යි කී

කල්හි පිළිවෙලින් සුදුපැහැ ඇති ගොනෙක් ද, රතුපැහැ ඇති ගොනෙක්ද අදහස් කරනු ලැබේ. ඉතිරි ගොනුන් අදහස් නොකරනු ලැබේ. එබැවින් 'සෙතො' යන පදය 'ගොණො' යන පදයාගේ විශෙෂණයකි. විශෙෂය (වෙනස) කරන්නා විශෙෂණ නම් වේ. විශෙෂණය හෙවත් වෙනස් කිරීම ලබන්නාවූ 'ගොණො' යන්න විශෙෂ්‍ය නම් වේ.

51. ඉංග්‍රීසි භාෂාවෙහි ගුණවචන හෙවත් විශේෂණපද (Adjectives) වලට විභක්ති යෙදීමක් නැත; හැම ලිඞ්ගයේදී ම හැම විභක්තියේදී ම නිපාතපද මෙන් වෙනස් නොවී සිටිත්. නමුත් **පාලි භාෂාවෙහි විශෙෂණපදය විශෙෂ්‍ය පදයාගේ ලිඞ්ගය ද විභක්තිය ද සංඛ්‍යාව ද ගනී. සෙතො. ගොණො** යන තැන 'සෙතො' යන විශෙෂණපදය 'ගොණො' යන පදයෙහි වූ පුල්ලිඞ්ගය ද පඨමා විභක්තිය ද එකවචනය ද ගෙන සිටී.

විශෙෂ්‍ය පදය '**ගොණා**' යි බහු වචනයෙන් සිටියේ නම් විශෙෂණය ද 'සෙතා' යි පඨමා බහුවචනය ගනී. විශෙෂණය ලබන්නී ස්ත්‍රියක් වීනම් විශෙෂණය ඒ ලිඞ්ගය ගනී. '**සෙතාගාවී**' -'සුදු ගවදෙන' යනු උදහරණයයි. විශෙෂ්‍යය නපුංසක ලිඞ්ගයෙහි වීනම් විශෙෂණය ද ඒ ලිඞ්ගය ගනී. "සෙතං වත්‍ථං" - "සුදු වස්ත්‍රය" යනු උදහරණයයි. (මේ සමානාධිකරණයයි.)

52. '**ගච්ඡන්ත - පචන්ත - ගච්ඡමාන**' ආදී අන්ත - මාන - ප්‍රත්‍යාන්ත කිතකපදයන්ද විශෙෂණ පද වශයෙන් තුන් ලිඟුවෙහි යෙදෙන බව කියන ලදී. බොහෝ සර්වනාමයෝ ද සංඛ්‍යානාම ද අන්‍ය පදයන්ට විශෙෂණ වෙති.

53. **මය්හං ගොණො** (-මගේ ගොනා) **බ්‍රාහ්මණස්ස පුත්තො** (-බ්‍රාහ්මණයාගේ පුත්‍රයා) යි කී කල්හි ගොනා ද පුත්‍රයා ද අන්‍යයන්ගේ ගොනුන්ගෙන් ද පුත්‍රයන්ගෙන් ද වෙන් කරනු ලබන බැවින් "**මය්හං. බ්‍රාහ්මණස්ස**" යන පද දෙක පිළිවෙලින් "ගොණො - පුත්තො" යන පද දෙකට විශෙෂණ වේ. මෙසේ **භින්නාධිකරණයෙන් සිටි කල්හි විශෙෂණය විශෙෂ්‍ය පදයාගේ ලිඞ්ගය ද විභක්තිය ද සංඛ්‍යාව (වචනය) ද නොගනී.**

## අභ්‍යාසය 22.

**පහත පෙනෙන වාක්‍යයන් සිංහලට නගා විශෙෂණ පද පෙන්විය යුතු:-**

1. සෙතා ගාවියො ඛෙත්තෙ ආහිණ්ඩිත්වා බහුං තිණං ඛාදිංසු. 2. මය්හං මාතා නීලානි උප්පලානි ආනෙත්වා චෙතියං පූජෙසි. 3. මය්හං සුවෙ රත්තානි පදුමානි භුඤ්ජිතුං තං වාපිං ගමිස්සාම. 4. සෙතා ච රත්තා ච ගොණා තිණං ඛාදිතුං අටවියං ආහිණ්ඩන්ති. 5. සො නීච පීඨං ආනෙත්වා භූමියං ඨපෙත්වා තත්ථ නිසීදි. 6. තුය්හං පිතා මහන්තං රුක්ඛං ඡින්දිත්වා පාතෙසි. 7. අස්මිං විහාරෙ මහන්තං චෙතියං අත්ථි. 8. දසො දීඝාය රජ්ජුයා රත්තං ගාවිං රුක්ඛෙ බන්ධි. 9. තස්මිං වනෙ බහවො උච්චා රුක්ඛා සන්ති. 10. පසන්නාචතො පුරිසස්ස බාලා ධීතා පක්කානි ඵලානි ආහරිත්වා අප්පකානං දරකානං අදසි. 11. තස්සා මහල්ලිකාය ඉත්ථියා නත්තා උත්තානෙ ජලෙ නහායති. 12. බලවන්තා කාලා ගොණා උච්චෙසු ගිරීසු චරිත්වා බහූනි පණ්ණානි ඛාදන්ති. 13. මාලිනී නාරී රස්සෙන මග්ගෙන ඛුද්දකං ගාමං ගච්ඡති. 14. බාලා කඤ්ඤා මුදුනා හත්ථෙන සෙතානි පදුමානි ගණ්හාති. 15. බහුන්නං[1] බාලානං පුත්තා තස්සා නදියා ගම්භීරෙ ජලෙ පතිත්වා මරිස්සන්ති. 16. මම භාතරානං මජ්ඣිමො උච්චෙ පීඨෙ නිසීදිත්වා ආමානි ඵලානි ඛාදති.

**සංලක්‍ෂ්‍යය:** මාලී – ආදි ඊකාරාන්ත පදයන් ස්ත්‍රීලිංගික විශෙෂණ බවට පැමිණෙන විට ඉනී – ප්‍රත්‍යයක් ගෙන "**මාලිනී, සාමිනී**" ආදි වශයෙන් සිටිත්. මහලක – ආදි පදයන් ස්ත්‍රී ලිංගික වනවිට "මහලිකා, ඛුද්දිකා" ආදී වශයෙන් සිටිත්.

**පාලියට නැගියයුතු:**

1. සුදු වූ ද රතු වූ ද ගොන්නු තණ කමින් කුඩා කෙතෙහි සිටිත්. 2. කළු දෙන අර මහ වැවෙන් බොහෝ දිය බීවාය. 3. බොහෝ කන්‍යාවෝ රතු රෙදි හැඳ ඒ මහා නගරයෙහි විශාල වෙළඳ ශාලාවකට ගියහ. 4. අර මහළු ස්ත්‍රියගේ සියලු පුත්තු බලවත්තු හෝ නොවෙති. 5. අපේ දරුවෝ සැම විටම අමු ගෙඩි කෑමට කැමතිවෙති. 6. ඒ අඥාන ස්ත්‍රී පළල්වූ ගඟට ගොස් එහි

---

1. බහුනං, බහුන්නං යි ඡට්ඨී බහුවචනය දෙවිධියකින් සෑදේ.

ගැඹුරු දියෙහි වැටුණි. 7. අපි දික් මගකින් කුඩා ගමකට පැමිණ එහි මහත්වූ ශාලාවක සිටියෙමු. 8. බොහෝ ස්ත්‍රීහු උස් ගස්වලින් ඉදුණු ගෙඩි ගෙනවුත් කඩවල වෙළඳුන්ට වික්කාහ. 9. ළමයා මිටි ගසකට නැගී එහි සුදු මල් කඩා එකතු කෙළේය. 10. ශක්තිමත් මිනිහා අර කුඩා උයනෙහි උස් වූ ද මිටි වූ ද ගස් කැපුවේය. 11. කළු ගොන්නු උස් කන්දට ළංවූ කර්කශ පොළොවෙහි නිදත්. 12. බොහෝ මිනිස්සු විශාල වූ සමුද්‍රය තරණය කොට මේ දර්ශනීය දිවයිනට එත්. 13. මේ විශාල නගරයෙහි ලොකු ගෙවල් ද, පළල් වීථි ද, දික් මාර්ග ද, බොහෝ උයන් ද ඇත්තාහ. 14. ළදරුවාගේ මෘදු අත අර පහනේ දැල්ලෙන් දැවුණේය.[1] 15. දසයා අර දික් ගහේ ඉවුරෙහි වූ කුඩා කුඹුරෙන් බොහෝ තණකොළ ගෙනාවේය.

## 54. සංඛ්‍යාවිශේෂණ හෙවත් ගණන්

### NUMERALS

| | | | |
|---|---|---|---|
| එක | = 1 | තෙළස, තෙරස | = 13 |
| ද්වි | = 2 | චුද්දස, චතුද්දස | = 14 |
| ති | = 3 | පණ්ණරස, පඤ්චදස | = 15 |
| චතු | = 4 | සොළස | = 16 |
| පඤ්ච | = 5 | සත්තරස, සත්තදස | = 17 |
| ඡ | = 6 | අට්ඨාරස, අට්ඨාදස | = 18 |
| සත්ත | = 7 | එකූනවීසති | = 19 |
| අට්ඨ | = 8 | වීසති | = 20 |
| නව | = 9 | එකවීසති | = 21 |
| දස | = 10 | ද්වෙවීසති, බාවීසති | = 22 |
| එකාදස | = 11 | තෙවීසති | = 23 |
| ද්වාදස | = 12 | චතුවීසති | = 24 |

1. ඩය්හි

පඤ්චවීසති = 25
ඡබ්බීසති = 26
ඡත්තවීසති = 27
අට්ඨවීසති = 28
එකූනති සති = 29
තිංසති = 30
එකතිංසති = 31
ද්වත්තිංසති, බත්තිංසති = 32
තෙත්තිංසති = 33
චතුත්තිංසති = 34
පඤ්චතිංසති = 35
ඡත්තිංසති = 36
සත්තිංසති = 37
අට්ඨතිංසති = 38
එකූනචත්තාළීසති, = 39
චත්තාළීසති = 40
ද්වෙචත්තාළීසති,
ද්විචත්තාළීසති = 42
එකූනපඤ්ඤාසති = 49
පඤ්ඤාසති, පණ්ණාසති = 50
ද්වෙපඤ්ඤාසති
ද්වෙපණ්ණාසති
ද්විපණ්ණාසති = 52
ද්විපඤ්ඤාසති
එකූනසට්ඨි = 59

සට්ඨි = 60
ද්වෙසට්ඨි, ද්වාසට්ඨි,
ද්විසට්ඨි = 62
එකූනසත්තති = 69
සත්තති = 70
ද්වෙසත්තති,
ද්විසත්තති, ද්වාසත්තති = 72
එකූනාසීති = 79
අසීති = 80
එකාසීති = 81
ද්වෙඅසීති, ද්වාසීති,
ද්වියාසීති = 82
එකූනනවුති = 89
නවුති = 90
ද්වෙනවුති, ද්වානවුති,
ද්වීනවුති = 92
එකූනසතං = 99
සතං = 100
නවසතං = 900
සහස්සං = 1000
දසසහස්සං, නහුතං = 10,000
සතසහස්සං, ලක්ඛං = 100,000
දසලක්ඛං = 1000,000
කොටි = 10,00,000
දසකොටි = 100,000,000
සතකොටි = 1000,000,000

55. මේ ශබ්දයන් අතුරෙන් එක – ති – චතු යන ශබ්ද තුන ලිඟුතුනෙහි වෙනස්ව වරනැගෙන බැවින් සර්වනාමවලට ඇතුළත්කොට තිබේ. එක ශබ්දය සංඛ්‍යාවෙහි වැටෙනවිට එක් දෙයක් හෝ එක් සත්වයකු ගැන යෙදෙන බැවින් හැම විභක්තීන්හි එකවචනවලට පමණක් වරනැගේ. එක්තරා, අසමාන, අසහාය යන අර්ථයන්හි වැටෙනවිට බහුවචනයන්හි ද යෙදේ. එය තුන් ලිඟුවෙහි සර්වනාම 'ය' ශබ්දය මෙන් වරනැගිය යුතු.

**ද්වි** ශබ්දය පටන් **අට්ඨාරස** – ශබ්දය අවසන්කොට ඇති ශබ්දයෝ බහුවචනයෙහි පමණක් වෙති.

ද්වි – ශබ්දය ද සර්වනාමවලට ඇතුළත්කොට දක්වා තිබෙන නමුත් එය ලිඟු තුනෙහිම වරනැගේ.

56. ද්වි ශබ්දය

| | බහු | | බහු |
|---|---|---|---|
| පඨමා: | **ද්වෙ**, **දුවෙ** (දෙදෙන) | චතුත්ථී : | **ද්වින්නං** |
| දුතියා: | **ද්වෙ**, **දුවෙ** (දෙදෙන) | පඤ්චමී : | **ද්වීභි**, **ද්වීහි** |
| තතියා: | **ද්වීභි**, **ද්වීහි** (දෙදෙන විසින්) | ඡට්ඨී : | **ද්වින්නං** |
| | | සත්තමී : | **ද්වීසු** |

57. ති – ශබ්දය

**පුල්ලිඞ්ග**

| | බහු |
|---|---|
| පඨමා: | **තයො** (=තිදෙන) |
| දුතියා: | **තයො** |
| තතියා: | **තීභි**, **තීහි** |
| චතුත්ථී: } ඡට්ඨී : } | **තිණ්ණං**, **තිණ්ණන්න** |

පඤ්චමී: තීහි, තීහි

සත්තමී: තීසු

## ඉත්ථිලිඞ්ග

| | බහු |
|---|---|
| පඨමා : | තිස්සො (=තිදෙන) |
| දුතියා : | තිස්සො |
| තතියා : | තීහි, තීහි |
| චතුත්ථී : ⎫ ඡට්ඨී : ⎭ | තිස්සන්නං |
| පඤ්චමී : | තීහි, තීහි |
| සත්තමී : | තීසු |

## නපුංසකලිඞ්ග

| | බහු |
|---|---|
| පඨමා : | තීණි (=තිදෙන) |
| දුතියා : | තීණි |
| තතියා : | තීහි, තීහි |
| චතුත්ථී : | තිණ්ණං |
| ඡට්ඨී : | තිණ්ණන්නං |
| පඤ්චමී : | තීහි, තීහි |
| සත්තමී : | තීසු |

58. චතු - ශබ්දය

| | පුල්ලිඞ්ග | ඉත්ථිලිඞ්ග | නපුංසකලිඞ්ග |
|---|---|---|---|
| | බහු | බහු | බහු |
| පඨමා : | චත්තාරෝ, චතුරෝ (=සතරදෙන) | චතස්සො (=සතරදෙන) | චත්තාරි (=සතරදෙන) |
| දුතියා : | චත්තාරෝ, චතුරෝ | චතස්සො | චත්තාරි |
| තතියා : පඤ්චමී : | චතූහි, චතුභි | චතූහි, චතුභි | චතූහි, චතුභි |
| චතුත්ථී : ඡට්ඨී : | චතුන්නං | චතස්සන්නං | චතුන්නං |
| සත්තමී : | චතූසු | චතූසු | චතූසු |

59. පඤ්ච ශබ්දය

ලිඟු තුනෙහිම සමානයි

| | බහු | | බහු |
|---|---|---|---|
| පඨමා : | **පඤ්ච** | චතුත්ථී : ඡට්ඨී : | **පඤ්චන්නං** |
| දුතියා : | **පඤ්ච** | | |
| තතියා : පඤ්චමී : | **පඤ්චහි. පඤ්චභි** | සත්තමී : | **පඤ්චසු** |

60. ඡ - ශබ්දය පටන් **අට්ඨාරස** ශබ්දය අවසන්කොට ඇති ශබ්දයෝ පඤ්ච - ශබ්දය මෙන් වරනැගෙත්. පඨමා - දුතියා දෙක්හි 'පඤ්ච -ඡ' යනාදි වශයෙන් අකාරාන්තව සිටීම ද ඉතිරි විභක්ති වලදීත් මුල් ශබ්දය වෙනස්නොවී (පඤ්චහි, පඤ්චසු) යනාදි ආකාරයට නොපැමිණ සිටීම ද මේ සංඛ්‍යා ශබ්දයන්ට විශෙෂ වූ ආකාරයකි. එබැවින් 'පඤ්ච' ශබ්දය පටන් ඇති ශබ්දයෝ - සර්ව නාමවලට ඇතුළත් නොකරන ලදහ.

61. **එකූනවීසති** ශබ්දය පටන් **අට්ඨනවුති** – ශබ්දය අවසන් කොට ඇති ශබ්දයෝ ස්ත්‍රීලිංග එකවචනයෙහි වෙති. ඉකාරාන්ත වූ මේ ශබ්දයෝ 'භූමි' ශබ්දයේ එකවචන මෙන් වරනැගෙත්. 'තිංසා – චත්තාළීසා – පඤ්ඤාසා' යි මේ ශබ්ද තුන ආකාරාන්තව ද සිටී. එවිට වනිතා ශබ්දයේ එකවචන මෙන් වරනැගිය යුතු.

**'එකූනසත'** – ශබ්දයේ පටන් **'ලක්ඛ'** – ශබ්දය දක්වා නපුංසක එකවචනයෙහි වේත්. "කොටි" – ශබ්දය ස්ත්‍රීලිංග ඒකවචනාන්තයි.

62. වීසති ශබ්දයෙන් මත්තෙහි වූ සංඛ්‍යා ශබ්දයෝ වෙන් වෙන් වූ කොටස් ප්‍රකාශ කරන කල්හි බහුවචනයෙහි ද යෙදෙත්:–

ද්වෙ වීසතියො = විස්සේ කොටස් දෙකක්

තීනි සතානි = සීයේ කොටස් තුනක්

චත්තාරි සහස්සානි = දහේ කොටස් හතරක්

යන මොහු උදහරණ වෙති.

## අභ්‍යාසය 22.

**සිංහලට නැගියයුතු:**

1. චත්තාරො පුරිසා චතුහි එරසූහි චත්තාරි රුක්ඛානි ඡින්දිස්සන්ති. 2. තා තිස්සො ඉත්ථියො ඉමෙහි තීහි මග්ගෙහි තං අටවිං ගන්ත්වා තිස්සන්නං කඤ්ඤානං තීනි ඵලානි අදංසු. 3. එකිස්සං සාලායං සතං පුරිසා, පඤ්ඤාසං ඉත්ථියො ච නිසීදිස්සන්ති. 4. මයං ඉතො නවහි දිවසෙහි[1] පඤ්චහි කුමාරෙහි සද්ධිං කොළම්බනගරං ගමිස්සාම. 5. පඤ්ච දසා දසන්නං අස්සානං බහුං තිණං අප්පකං උදකංච ආහරිංසු. 6. වීසති පුරිසා දසහි ගොණෙහි චත්තාරි ඛෙත්තානි කසන්ති. 7. වාණිජො රූපියානං[2] ද්වීහි සතෙහි අට්ඨ අස්සෙ කිණිත්වා චතුන්නං ධනවන්තානං

1. නවදිනකින් (නව දිනක් ඇවෑමෙන්) යන අර්ථ ඇත්තේයි.

2. රූපියං – රුපියල. රූපියානං ද්වීහි සතෙහි – රුපියල් දෙසීයකින් සමාසකොට "ද්වීහි රූපියසතෙහි" යි යෙදිය හැක.

වික්කිණි. 8. තාසං ජනානං වනිතානං ජ භාතරො මහන්තං පබ්බතං ආරුහිත්වා ජ කපයො ආනෙසුං. 9. තාසං මාතා දස අම්බානි කිණිත්වා චතස්සන්නං ධීතරානං දදිස්සති. 10. ඉදනි ලංකායං පඤ්චත්තාළීස – සතසහස්සං මනුස්සා වසන්ති. 11. තුම්හෙ ඉතො ද්වීහි වස්සෙහි අනුරාධපුරං ගන්ත්වා නව දිවසෙ තත්ථ වසන්තා මහන්තෙ චෙතියෙ පස්සිස්සථ. 12. දසො එකෙන හත්ථෙන ද්වෙ නාළිකෙරෙ ඉතරෙන එකං පනසඵලං ච ආනෙති.

**පාලියට නැගියයුතු:**

1. ස්ත්‍රීහු සතර දෙනෙක් අඹගෙඩි[1] අටක් ගෙනවුත් දූවරුන් දෙදෙනකුට දුන්හ. 2. හෙට මිනිස්සු පස්දෙනෙක් වනයට ගොස් පොරෝ පසකින් ගස් 10 ක් කපන්නාහ. 3. කුමරියෝ තිදෙනෙක් වැව් තුනකට ගොස් මල් තිසක් ගෙන ආහ. 4. මේ ශාලාවෙහි මිනිස්සු 500 දෙනෙක් ද 300 ක් ස්ත්‍රීහු ද සිටිත්. 5. මේ නගරයෙහි පන්දහසක් මිනිස්සු ද දහසක් ගවයෝ ද පන්සියයක් ගෙවල් ද ඇත්තාහ. 6. කන්‍යාවන් පස්දෙනාගේ සොහොයුරෝ සත්දෙන අර වනයට ගොස් මුවන් අටදෙනෙකුන් මැරූහ 7. අපි අවුරුදු නවයක් හා මාස අටක් කොළඹ විසුවෙමු. 8. පියතෙමේ වස්ත්‍ර තුනක් මිළදී ගෙනවුත් ඔහුගේ දූන් තිදෙනාට දුන්නේය. 9. මිනිස්සු දසදෙනෙක් ගොනුන් විස්සක් ගෙන කුඹුරු පහක් සීසාත්. 10. ඇත්තු හැට දෙනෙක් නුවරින් පිටතට ආහ; එයින් තිස්දෙනෙක් වනයට ඇතුළු වූහ. 11. මා මිළදීගත් අශ්වයන් දොළසගෙන්[2] එකකු අන් මිනිසකුට වික්කෙමි. 12. දසයා පොල්ගෙඩි දොළසක් ගෙනවුත් එයින් දහයක් එක්තරා ස්ත්‍රියකට වික්කේය. 13. වෙළෙන්දෝ තිදෙනෙක් රුපියල් තුන්සියයකින් අසුන් තිදෙනෙකුන් ගත්හ. 14. පණස් ලක්‍ෂයක් මිනිස්සු ලක්දිව ඇත්තාහ.

පහත පෙනෙන වාක්‍යයන්හි අඩුතැන් සංඛ්‍යාවන් යෙදීමෙන් පිරවියයුතු:–

1 ............... ගාවියො ඛෙත්තෙ ආහිණ්ඩන්ති. 2. මයං ගාමං ගච්ඡන්තා අටවියං ............. මිගෙ පස්සිම්හ. 3. දස පුරිසා .................

---

1. අඹ – කොස් ආදී ගස් කියවෙන විට ඒවා පාලියෙහි පුල්ලිංගයෙන් සිටිත්; ගෙඩි කියවෙන විට නපුංසකලිංගය ගනිත්.

2. මෙවැනි තැන් පාලියට නැගීමේදී ඡට්ඨිය හෝ සත්තමිය යෙදිය යුතු.

අම්බෙ ඛාදිංසු. 4. ඉමස්මිං ගාමෙ ................ ගෙහා සන්ති. 5. තස්මිං ගාමෙ .................. මනුස්සා වසන්ති. 6. මයං ඉතො ................ දිවසෙහි නගරං ගමිස්සාම. 7. අම්හාකං භාතරො .................. මාසෙහි ගාමං ආගමිස්සන්ති 8. කුමාරී ............... පදුමානි ආහරිත්වා ..................... දරකානං අදසි. 9. ................ දසා .................... නාළිකෙරෙ කිණිංසු. 10. මාතරො .................. ඵලානි ආනෙත්වා ..................... ධීතරානං අදංසු. 11. භගවා .................. වස්සානි සාවත්ථියං වසි. 12. ................. පක්ඛිනො රුක්ඛස්ස සාඛාසු නිසීදිංසු. 13. මය්හං ..................... භාතරො සන්ති. 14. මයං මග්ගෙ ගච්ඡන්තා .................. අස්සෙ ච .................. රථෙ ච ............. ඉත්ථියො ච ................ ගොණෙ ච පස්සිම්හ. 15. තස්සා ඉත්ථියා ............ පුත්තා ............. ධීතරො ............... භාතරො ච සන්ති.

## 63. ක්‍රමසංඛ්‍යා

| | | | |
|---|---|---|---|
| **පඨම** | = පළමුවෙනි | **දසම** | = දසවෙනි |
| **දුතිය** | = දෙවෙනි | **එකාදසම** | = එකොළොස්වෙනි |
| **තතිය** | = තුන්වෙනි | **වීසතිම** | = විසිවෙනි |
| **චතුත්ථ** | = සතරවෙනි | **තිංසතිම** | = තිස්වෙනි |
| **පඤ්චම** | = පස්වෙනි | **චත්තාළීසතම** | = හතළිස්වෙනි |
| **ඡට්ඨ** | = සවෙනි | **සත්තතිම** | = සැත්තෑවෙනි |
| **සත්තම** | = සත්වෙනි | **අසීතිම** | = අසූවෙනි |
| **අට්ඨම** | = අටවෙනි | **නවුතිම** | = අනූවෙනි |
| **නවම** | = නවවෙනි | **සතම** | = සියවෙනි |

මේ ආදීහු තද්ධිතපද වෙති; තුන්ලිඟුවෙහි ම යෙදත්. පුල්ලිංග – නපුංසකලිංගයන්හි අකාරාන්තව ද ඉත්ථිලිංගයෙහි ‘පඨමා දුතියා’ ආදි වශයෙන් ඇතැම් පදයෝ අකාරාන්තව ද ‘චතුත්ථී පඤ්චමී’ යනාදි වශයෙන් ඇතැම් පදයෝ ඊකාරාන්තව ද සිටිත්. ම යන්න අන්තයෙහි ඇති ශබ්දයෝ ඉත්ථිලිංගයේදී සත්තමා, සත්තමී යනාදි වශයෙන් දෙයාකාරයෙන් ම සිටිත්.

## 64. ක්‍රියාවිශෙෂණ

## ADVERBS

'දරකො සුඛං සයති' (=ළමයා සැපසේ නිදයි.) කී කල්හි 'සුඛං' යන පදයෙන් නිදීමේ විශෙෂයක් ප්‍රකාශ කරනු ලැබේ. එබැවින් 'සුඛං' යන්න ක්‍රියාවිශෙෂණයකි.

ක්‍රියාවිශෙෂණ සියල්ල නපුංසකලිංගයෙහි දුතියා එක වචනයෙහි වේයයි පාලිව්‍යාකරණයන්හි දක්වා තිබේ. ඇතැම් නිපාතපද ද ක්‍රියාවිශෙෂණ වශයෙන් යෙදෙන බව පෙනේ. ඛිප්පං (=වහා) සනිකං (=හෙමින්) යන මේවා නපුංසක එකවචන මෙන් පෙනෙතත් නිපාතපද වෙති.

'සහසා' (=වහා), 'පච්ඡතො' (=පස්සෙන්), 'පුරතො' (=ඉදිරියෙන්), 'පච්ඡා' (=පසුව), 'විසුං' (=වෙන්ව) යන මේ නිපාතයන් ද ක්‍රියාවන් සමග යෙදෙන බැවින් යට කී එකවචන ලක්ෂණය නැතත් ක්‍රියාවිශෙෂණයයි කියයුතුය.

| | | | |
|---|---|---|---|
| **සාධුකං** | = මනාකොට | **අභිණ්හං** | = නිතර |
| **සීඝං** | = වහා | **සමං** | = සම ලෙස |
| **දුක්ඛං** | = දුකසේ | **විසමං** | = විසම ලෙස |
| **සනිකං** | = හෙමින් | **විසුං** | = වෙන්ව |
| **ද්වික්ඛත්තුං** | = දෙවරක් | **එවං** | = මෙසේ |
| **එකධා** | = එක් ආකාරයකින් | | |

## අභ්‍යාසය 24.

**සිංහලට නැගියයුතු:**

1. ගච්ඡන්තෙසු දසසු පුරිසෙසු සත්තමො වාණිජො හොති. 2. තස්ස සත්තමා ධීතා අට්ඨමාය එකං වත්ථං අදසි. 3. චතස්සන්නං යුවතීනං තතියාය භාතා පඤ්ච අස්සෙ ආනෙසි. 4. මය්හං පිතා සත්තතිමෙ වස්සෙ පඤ්චමෙ මාසෙ කාලමකාසි. 5. මයං ඉතො ජට්ඨෙ වස්සෙ චතූහි පුරිසෙහි සද්ධිං දුතියං නගරං ගමිස්සාම.

6. අට්ඨමො එඩ්වඩ්නාමො භූපතී තස්ස පඨමස්ස භාතුනො රජ්ජං දත්වා සීහාසනා අපගච්ඡි. 7. ජෙට්ඨො පරක්කමබාහු භූපතී පුබ්බෙ ලංකායං ජයවද්ධනපුරෙ රජ්ජං කරි. 8. ඉමිස්සා පාඨසාලාය අසීතියා සිස්සෙසු පඤ්චවීසතිමො භීයො ගම්භීරෙ උදකෙ පති 9. අම්හාකං පිතරො ඉතො පඤ්චමෙ වස්සෙ බහූහි මනුස්සෙහි සද්ධිං අනුරාධපුරං ගමිස්සන්ති. 10. ද්විසු පාඨසාලාසු පඨමාය තිසතං සිස්සා උග්ගණ්හන්ති. 11. ද්වින්නං ධනවන්තානං දුතියො තිංසතියා යාචකානං දනං අදසි. 12. නහායන්තීසු පඤ්චසු නාරීසු තතියාය හත්ථා ධනවා හොති. 13. හත්ථං පචන්තීනං තිස්සන්නං ඉත්ථීනං දුතියා නහායිතුං ගමිස්සති. 14. භගවා පඨමං වස්සං බාරාණසියං ඉසිපතනාරාමෙ විහරි. 15. තද සො පඤ්චන්නං භික්ඛූනං බහුන්නං මනුස්සානං දෙවානං ච පඨමං දෙසෙසි.

**පාලියට නැගියයුතු:**

1. වෙළෙඳුන් දසදෙන අතුරෙන්[1] පස්වැනියා මැණික මිළ දී ගත්තේය. 2. සිවුවෙනි ධනවතා මෙයින් තෙවෙනි දිනයේ සියයක් යාචකයන්ට දන් දෙන්නේය. 3. පාඨශාලා තුනෙන් පළමු වැන්නෙහි අටසියයක් ශිෂ්‍යයෝ ඇත්තාහ. 4. මාගේ සිවුවැනි සොහොයුරා කොළඹ පස්වැනි වීථියෙහි සවැනි ගෙයි වාසය කරයි. 5. අපි දෙවැනි වර්ෂයේ තෙවැනි මාසයේ සත්වැනිද නුවර යන්නෙමු. 6. ඔහුගේ දසවැනි පුත්‍රයා සවැනි මාසයේ විසිපස් වැනිද මෙහි එන්නේය. 7. ස්ත්‍රීන් සත්දෙන අතුරෙන් සවෙනි ස්ත්‍රිය රතු වස්ත්‍රයක් ද පස්වෙනි ස්ත්‍රිය නිල් වස්ත්‍රයක් ද හඳියි. 8. සත්වැනි ඇඩ්වඩ් රජුගේ පුත්‍ර වූ පස්වැනි ජෝර්ජ් රජ මින් අවුරුදු තුනකට පෙර[2] කාලක්‍රියා කෙළේය. 9. ඉන්පසු ඔහුගේ පළමුවැනි පුත්‍රයා අටවැනි ඇඩ්වඩ් නම් රජ විය. 10. මම මේ අසුන් අටදෙනාගෙන් දෙවෙනියා රුපියල් දෙසියයකින් ගන්නෙමි. 11. මේ පාඨශාලාවෙහි අසූවක් ශිෂ්‍යයන් අතුරෙන් විසිවැනියා ඊයේ මළේය. 12. මාගේ සවැනි සොහොයුරා සිවුවැනියා සමග දසවැනිද මෙහි එන්නේය. 13. ඔහුගේ තෙවෙනි සොහොයුරාගේ දෙවෙනි දුව මේ

1. සත්තමිය හෝ ඡට්ඨිය යෙදීමෙන් "අතුරෙන්" යන අර්ථය ලැබේ.
2. "වස්සානං උපරි" යි යෙදිය යුතු.

පාඨශාලාවෙහි උගනී. 14. රාජදේවියගේ පළමුවැනි සොහොයුරිය මෙයින් තුන්මසකින් අනුරාධපුරය බලන්ට යන්නීය. 15. දුටුගැමුණු රජ[1] සූවිසි හවුරුද්දක් අනුරාධපුරයෙහි රාජ්‍යය කෙළේය.

## අභ්‍යාසය 25.

### සිංහලට නැගියයුතු:

1. ඉමෙසං දසන්නං ධනවන්තානං පඤ්චමො සුඛං ජීවති. 2. අයං දීපි සන්තිකා ආගන්ත්වා සහසා ගාවියා උපරි පති. 3. අට්ඨන්නං කඤ්ඤානං ඡට්ඨා ගාවිං දළ්හං බන්ධිත්වා වාපිං නෙසි. 4. ඉමෙ පඤ්ච දරකා අභිණ්හං මග්ගෙ ධාවන්තා කීළන්ති. 5. ඉමෙසු නවසු සිස්සෙසු පඤ්චමො සාධුකං උග්ගණ්හාති. 6. භික්ඛු භගවතො සන්තිකං ආගන්ත්වා වන්දිත්වා එකමන්තං නිසීදිංසු. 7. සො සෙට්ඨී ධනං පඤ්චධා[2] විභජිත්වා පඤ්චන්නං ධීතරානං අදසි. 9. තස්ස ඡට්ඨාය ධීතුයා පුත්තො ද්වික්ඛත්තුං ඉමං නගරං ආගච්ඡි. 9. පඨමං තෙ අස්සරථං සමං ආකඩ්ඪිංසු, දුතියා සීඝං ධාවිංසු. 10. මම අට්ඨන්නං භාතරානං චතුත්ථො දුක්ඛං වසති. 11. කථං තෙ චත්තාරො වාණිජා තත්ථ වසන්තා භණ්ඩානි වික්කිණන්ති? 12. සො ධීතරං එවං වත්වා සහසා අඤ්ඤං ඨානං ගච්ඡි.

### පාලියට නැගියයුතු:

1. ඒ ළමයි සදෙන නිතර මෙතැන්හි ක්‍රීඩා කරත්. 2. මේ ගොවියන් සත්දෙන අතුරෙන් සතරවැන්නා සැපසේ ජීවත් වෙයි. 3. රජතෙමේ දෙවරක් නුවරින් පිටත අවුත් මේ වැවෙහි නෑවේය. 4. අශ්වයෝ සමලෙස රථ අදිමින් වහා දුවති. 5. මේ භික්ෂූන් සත්නම අතුරෙන් තෙවැන්නා මනාසේ සිල් නොරකියි. 6. ඒ වෙළෙන්දෝ දෙළොස්දෙන බුදුන් වෙතට ගොස් ධර්මය ඇසීමට එක් පසෙක හිඳගත්හ. 7. සොරෙක් හදිසියෙන් අවුත් මාගේ

---

1. දුට්ඨගාමිණී භූපති.
2. පස් ආකාරයකින් හෙවත් පස් කොටසක් කොට, මෙය ක්‍රියාවිශෙෂණයක් වූ නිපාතයකි. අන්‍ය සංඛ්‍යා ශබ්දයන් සමගද මේ අර්ථයෙහි ධා - ප්‍රත්‍යය යෙදේ.

කුඩය ගෙන දිව්වේය. 8. මාගේ මිත්‍රයාගේ පුත්‍රයන් පස්දෙන අතුරෙන් තෙවැනියා දූකසේ ඉගෙන ගනියි. 9. ඔවුහු හෙමින් ගංඉවුරට ගොස් එහි ඇවිද වෙන්ව හැරී ආහ.[1] 10. ඔහුගේ සවැනි සොහොයුරාගේ දෙවැනි දුව වහා ඉගෙනගනී. 11. ගොවිතෙම ගොනෙකු දැඩිලෙස බැඳ කුඹුරට ගෙනගොස් සීසෑවේය. 12. රජතෙම රාජ්‍යය සතර කොටසකට[2] බෙද පුතුන් සිවුදෙනාට දුන්නේය.

## 65. කාරක විස්තරය

“පුරිසො රුක්ඛං ඡින්දති” (=මිනිසා ගස කපයි) කීකල්හි ‘පුරිසො’ යන්න සිඳීමේ ක්‍රියාව කරන්නා බැවින් කර්තෘ (=කත්තු) නම් වේ. ‘රුක්ඛං’ යන්න සිඳීම ලබන බැවින් **කර්ම** (කම්ම) නම් වේ. ‘ඡින්දති’ යනු පුරුෂයාගේ **ක්‍රියාවයි**.

මේ කර්තෘ කර්මාදීන්ට ‘කාරක’ යන නමක් ඇත්තේයි. ඒ වචනයේ අර්ථය නම්:– ‘ක්‍රියාව සම්පාදනය කරන්නා’ යනුයි. ඒ අර්ථයෙන් ප්‍රධාන වශයෙන් ගැනෙන්නේ කර්තෘ හෙවත් (1) කර්තෘ කාරකයයි. අප්‍රධාන වශයෙන් (2) කර්මකාරක (3) කරණකාරක (4) සම්ප්‍රදනකාරක (5) අපදනකාරක (6) ආධාරකාරක යන පද පස ද ගනු ලැබේ.

මෙහි (1) ක්‍රියාව කරන්නා **කර්තෘකාරකයෙහි** වැටේ. **පඨමා** විභක්තිය ද **තතියා** විභක්තිය ද මේ සඳහා යෙදිය හැකියි. කර්තෘ පඨමාවෙන් සිටි කල **‘උක්තකර්තෘ’** යයි කියනු ලැබේ. තතියාවෙන් සිටිවිට අනුක්තකර්තෘයයි කියනු ලැබේ.

(2) කරනු ලබන දෙය **කර්මකාරකයෙහි** වැටේ. **දුතියා** විභක්තිය ද **පඨමා** විභක්තිය ද මේ සඳහා යෙදිය හැකියි. කර්මය දුතියාවෙන් සිටි කල **අනුක්තය** යි ද පඨමාවෙන් සිටි කල **උක්ත** ය යි ද කියනු ලැබේ.

(3) යම් දෙයක් කරණකොටගෙන, යමක උපකාරයෙන් ක්‍රියාව කරනු ලැබේ ද, ඒ දේ **කරණකාරකයෙහි** වැටේ. (ඵරසුනා ඡින්දති) = ‘පොරවෙන් කපයි’ යන තැන ක්‍රියාව සම්පූර්ණ කිරීමට පොරොව උපකාර වේ. මේ සඳහා කරණ විභක්තිය යෙදිය යුතුයි.

---

1. පච්චාගච්ඡිංසු 2. චතුධා

(4) යමෙකුට දෙනු ලැබේ ද, කැමතිවනු ලැබේ ද, ඒ දෙනු ලබන්නා හෝ කැමතිවනු ලබන්නා **සම්ප්‍රදානකාරකයෙහි** වැටේ. (භික්ඛූනං චීවරානි දෙන්ති = භික්ෂූන්ට සිවුරු දෙත්, යන තැන දීම ලබන්නේ භික්ෂූහුයි. එබැවින් 'භික්ඛූනං' යන්න සම්ප්‍රදාන කාරකයෙහි වේ.) මේ සඳහා **චතුත්ථී** විභක්තිය යෙදියයුතු.

(5) යමක් කෙරෙන් වෙන් වේද, භයවේ ද ඒ දේ හෝ පුද්ගලයා **අපාදාන කාරකයෙහි** වැටේ. **'ඵලං රුක්ඛම්හාපතති'** යන තැන වෙන්වීමයි. 'දාරකා සීහම්හා භායන්ති' යන තැන භයවීමයි. මේ සඳහා **පඤ්චමී** විභක්තිය යෙදියයුතු.

(6) යම් දෙයක් ක්‍රියාවගේ පිහිටා සිටීමට ආධාරවේ ද ඒ දෙය **ආධාරකාරකයෙහි** වැටේ. ('මනුස්සො භූමියං තිට්ඨති') යන තැන 'භූමියං' යන්න මනුෂ්‍යයාගේ සිටීමට ආධාර වේ. මේ සඳහා **සත්තමී** විභක්තිය යෙදියයුතු.

'පුරිසො ගාමා නික්ඛමිත්වා අටවියං ඨත්වා හත්ථෙහි ඵරසුං ආදාය රුක්ඛං ඡින්දති' (=පුරුෂයා ගමින් නික්ම වනයෙහි සිට අත්වලින් පොරව ගෙන ගස කපයි) යන වාක්‍යයෙහි:

| | | |
|---|---|---|
| පුරිසො | යන්න | කර්තෘකාරකයෙහියි. |
| ඵරසුං රුක්ඛං | යන්න | කර්මකාරකයෙහියි. |
| හත්ථෙහි | යන්න | කරණකාරකයෙහියි. |
| ගාමා | යන්න | අපාදානකාරකයෙහියි. |
| අටවියං | යන්න | ආධාරකාරකයෙහියි. |

"සො භික්ඛු ගෙහෙ නිසීදාපෙත්වා තෙසං චීවරානි දත්වා ගෙහා නික්ඛමිත්වා රථෙන නගරං අගමාසි" (=හෙතෙම භික්ෂූන් ගෙහි හිඳුවා උන්වහන්සේලාට සිවුරු දී ගෙයින් පිටත්ව රථයෙන් නුවරට ගියේය) යන වාක්‍යයෙහි:

| | |
|---|---|
| 'සො' | කර්තෘකාරකයෙහියි |
| භික්ඛු, චීවරානි, නගරං | කර්මකාරකයෙහියි. |
| 'රථෙන' | කරණකාරකයෙහියි. |
| 'තෙසං' | සම්ප්‍රදානකාරකයෙහියි. |
| 'ගෙහා' | අපාදානකාරක්යෙහියි. |
| 'ගෙහෙ' | ආධාරකාරකයෙහියි. |

ඉතිරිපද පූර්වක්‍රියා ද අවසාන ක්‍රියාව ද වෙති.

# අභ්‍යාසය 26.

**මේ වාක්‍යයන්හි කර්තෘ කර්ම - ක්‍රියා දැක්විය යුතු:**

1. මය්හං භාතා වාපිං ගච්ඡන්තො එකස්ස රුක්ඛස්ස මූලෙ නිසීදි.
2. සීහො ධාවිත්වා මිගං මාරෙසි.
3. මාතා දරකානං භත්තං අදසි.
4. අයං පුරිසො එකං වත්ථං යාචති.
5. පිතා පාතො ගෙහා නික්ඛමිත්වා වනං අගමාසි.
6. සුවෙ මයං නගරං ගන්ත්වා භණ්ඩානි කිණිස්සාම.
7. වාණිජා භණ්ඩානි වික්කිණන්තා ගාමෙ ආහිණ්ඩන්ති.
8. යුවති මාලා පිලන්ධිත්වා හසන්ති භුඤ්ජති.
9. තෙ ගොණෙ ආනෙත්වා නදියා නහාපෙන්ති.
10. පක්ඛිනො රුක්ඛානං සාඛාසු නිසීදිත්වා රවන්ති.
11. හත්ථිනො තරූනං සාඛා භුඤ්ජිත්වා ඛාදිංසු.
12. කුමාරි පුප්ඵානි ඔචිනිතුං රුක්ඛං ආරුහි.
13. දරකා මග්ගෙ ධාවන්තා කීළිංසු.
14. තදා එකො පුරිසො ආගන්ත්වා තෙ පහරි.
15. දරකා රොදන්තා ගන්ත්වා තෙසං පිතූනං කථෙසුං.

**පහත පෙනෙන වාක්‍ය කර්තෘපද යොදා පිරවිය යුතු:-**

1. .................... රුක්ඛං ආරුහිත්වා ඵලානි ඔචිනාති.
2. මග්ගෙ ගච්ඡන්තා ................ ධාවන්තෙ දරකෙ ඔලොකෙසුං.
3. .................... හත්ථී මාරෙත්වා ඛාදන්ති.
4. ..................; තස්සා මාතුයා සන්තිකෙ රොදන්ති අට්ඨාසි.
5. ................... ආපණෙසු නිසීදිත්වා භණ්ඩානි වික්කිණිස්සන්ති.

6. ................. ආපණම්හා වත්ථානි කිණිත්වා ආනෙථ.
7. ................. නහායිත්වා ආගන්ත්වා භත්තං භුඤ්ජිස්සාමි.
8. ................. සුවෙ දිවා දරූනි ආහරිතුං අටවිං ගමිස්සාමි.
9. ................. ගෙහං ගන්ත්වා භත්තං පචාහි.
10. අම්හාකං ..................... තත්ථ කම්මං කරොන්තා වසන්ති.
11. ..................... පුප්ඵානි ඔචිනිත්වා විහාරං ගමිස්සන්ති.
12. තුය්හං ................. දරකං හත්ථෙන ආදාය හසන්ති අට්ඨාසි.

## ක්‍රියා - කාරකපද සම්බන්ධය

66. **යම්කිසි වාක්‍යයක කර්තෘ එකවචනයෙන් සිටී නම් ක්‍රියාව ද එකවචනයෙන් සිටියයුතු: කර්තෘපදය බහුවචනයෙන් සිටී නම් ක්‍රියාව ද බහුවචන වියයුතු:** ඒ දෙතැන්හි **කර්මය** එකවචනයෙන් හෝ බහුවචනයෙන් සිටීමට බාධාවෙක් නැත.

67. **කර්තෘ හා සම්බන්ධ වූ විශෙෂණ පදයක් වේ නම් එය කර්තෘපදය හා ලිඞ්ගයෙන් ද විභක්තියෙන් ද වචනයෙන් ද සමාන විය යුතුය. කර්මයට අයිති විශෙෂණයක් වේ නම් එය කර්මපදයේ ලිඞ්ගවිභක්ති වචනවලින් යුක්ත වියයුතු.** ක්‍රියා විශෙෂණය බොහෝසේ **නපුංසකලිඟු** එකවචනයෙන් සිටී. එය නිපාතයක් ද විය හැක. (51, 52, 53 යන අංකයන් ද බැලියයුතු.)

*උදාහරණ:*

1. "පුරිසො රුක්ඛං ඡින්දති" යන තැන කර්තෘපදයත් ක්‍රියා පදයත් එකවචනයෙන් සිටිත්. කර්තෘපදය "පුරිසා" වී නම් ක්‍රියාව ද "ඡින්දන්ති" යි බහුවචනයෙන් සිටිය යුතුය. නමුත් "පුරිසො රුක්ඛෙ ඡින්දති" යි හෝ "පුරිසා රුක්ඛං ඡින්දන්ති" යි හෝ කර්මය කැමති සංඛ්‍යාවකින්[1] යෙදිය හැකිය.

1. **බලවා පුරිසො මහන්තං රුක්ඛං ඵරසුනා සනිකං ඡින්දති** යන තැන "බලවා" යන්න පුරුෂයාගේ විශෙෂණයක්

1. එකවචන - බහුවචනයත් සංඛ්‍යානාමයෙන් හඳුන්වනු ලැබේ.

බැවින් පුල්ලිංගයෙන් ද එකවචනයෙන් හා ප්‍රථමා විභක්තියෙන් ද සිටී; "මහන්තං" යන්න වෘක්ෂයාගේ විශෙෂණයක් බැවින් කර්මයට අයත් ලිංග විභක්ති සංඛ්‍යාවන් ගනී. "සනිකං" යන්න ක්‍රියාව කරන ආකාරය දක්වන බැවින් ක්‍රියාවිශෙෂණයයි. "එරසුනා" (=පොරොවෙන්) යන්න ක්‍රියානිෂ්පාදනයට උපකාර වූ දෙයක් දක්වයි; එය ක්‍රියාවිස්තාරයෙහි ඇතුළත් කළයුතුය.

(22 වැනි අභ්‍යාසය බැලීමෙන් විශෙෂණපදයන් කර්තෘ - කර්මයන්ගේ ලිංග - විභක්ති - සංඛ්‍යා ගෙන තිබෙන ආකාරය පැහැදිලි වේ.)

68. එක් කර්තෘපදයකට හෝ කර්මපදයකට විශෙෂණපද එකකට වැඩියෙන් යොදත හැකිය. එක් ක්‍රියාවකට සම්බන්ධවන විස්තාර පද ද බොහෝ විය හැකිය.

"ධනවා බලවා පඤ්ඤවා පුරිසො මහන්තං දස්සනීයං ගෙහං කිණාති" යන වාක්‍යයෙහි 'පුරිසො' යන්නට විශෙෂණ පද තුනක් ද 'ගෙහං' යන කර්මපදයට විශෙෂණ දෙකක් ද වෙති.

## අභ්‍යාසය 27.

පහත පෙනෙන වාක්‍යයන්හි කර්තෘ කර්මාදීන්ට විශෙෂණ පද එක බැගින් හෝ ඊට වැඩි ගණනක් හෝ යෙදිය යුතු:-

1. පුරිසො රුක්ඛං ඡින්දති.
2. ගොණං තිණං ඛාදන්ති.
3. භූපති නගරං මාපෙති (=මවයි, සාදවයි.)
4. පක්ඛිනො රුක්ඛෙ නිසීදන්ති.
5. පිතා වනං ගමිස්සති.
6. කස්සකා ඛෙත්තං කසිංසු.
7. භික්ඛවො ධම්මං දෙසෙසුං.
8. මයං අනුරාධපුරං ගමිස්සාම.
9. වනිතායො පදුමානි ආහරන්ති.
10. භාතුනො පුත්තො උග්ගණ්හාති.

11. ධීතරො නදියං නහායන්ති.

12. භාතා උය්‍යානං ගච්ඡති.

13. සීහා වනෙ මිගෙ මාරෙන්ති.

14. කඤ්ඤායො චෙතියං වන්දන්ති.

සෙත - රත්තාදි ගුණනාම ද එක-ද්වි ආදි සංඛ්‍යානාම සර්ව නාමද ක්‍රම සංඛ්‍යා ශබ්ද ද මිශ්‍රක්‍රියාපද ද ෂෂ්ඨී විභක්තියෙන් යුත් පද ද විශෙෂණ වශයෙන් යෙදිය හැකි බව සැලකියයුතුඃ

"ගමෙන් පිටත කුඹුරෙහි ගොනා සිටියේය."

යන වාක්‍යයෙහි මුල්පද තුන ම **ක්‍රියාපද විස්තාරයට** ඇතුළත් වෙති. (ක්‍රියාවිශෙෂණ ක්‍රියාවිස්තාර දෙකේ මඳ වෙනසක් තිබේ. එය පසුව විස්තර වෙනවා ඇත.) එබැවින් වාක්‍යයක් විශාල කිරීමේදී කරණ - අවධි - ආධාර විභක්තිවලින් යුත් වචන ද යොදන්නට පුරුදු කළයුතු.

# කර්මකාරක ක්‍රියා

## PASSIVE VOICE

69. කර්තෘකාරකයෙහි කර්තෘ උක්ත වෙයි. එහි කර්තෘ ප්‍රථමා විභක්තියෙන් සිටී. කර්මය කර්ම විභක්තියෙන් හෙවත් ද්‍විතියාවෙන් සිටියි.

මීට ඉහතින් දක්වන ලද සියලු වාක්‍යයෝ කර්තෘ කාරකයෙහි ම වූ හ.

**කර්මකාරකයෙහි කර්මය උක්ත වෙයි. එබැවින් එහි කර්මය ප්‍රථමා විභක්තියෙන් සිටී**. කර්තෘ තෙම කර්තෘ විභක්තියෙන් හෙවත් තතියාවෙන් සිටී.

"දසො ඔදනං පචති" යන කර්තෘකාරක වාක්‍යය කර්ම කාරකයට පෙරළූවිට **දසෙන ඔදනො පච්චති** (=දසයා විසින් බතතෙම පිසනු ලැබේ) යි සිටී. එහි 'දසෙන' යන්න අනුක්ත කර්තෘ යි. 'ඔදනො' උක්තකර්මයයි. එය පඨමාවෙන් සිටී. 'පච්චති' යන්න කර්මකාරකයෙහි පඨම පුරිස - එකවචනයයි. කර්මකාරකයෙහි

කර්මය ප්‍රධාන බැවින් කර්මපදයට අයත් සංඛ්‍යාව හෙවත් එක වචනය හෝ බහුවචනය ක්‍රියාවට ද ලැබේ. "දසෙහි ඔදනො පච්චති" යි කර්තෘපදය බහුවචනයෙන් සිටියත් මෙහිදී ක්‍රියාව එය නො සලකා කර්මපදය බලාගෙන එකවචනයෙන් සිටී.

70. වර්තමාන කාලයෙහි පච - ධාතුවගේ රූප මෙසේයි:

| | | |
|---|---|---|
| පඨම පුරිස : | එක: | (සො ඔදනො) පච්චති |
| | බහු: | (තෙ ඔදනා) පච්චන්ති |
| මජ්ඣිම පුරිස : | එක: | (ත්වං ඔදනො) පච්චසි |
| | බහු: | (තුම්හෙ ඔදනං) පච්චථ |
| උත්තම පුරිස : | එක: | (අහං ඔදනො) පච්චාමි |
| | බහු: | (මය ඔදනා) පච්චාම |

**අර්ථ:-**

| | | |
|---|---|---|
| 1. | එක: | (ඒ බතතෙම) පිසනු ලැබේ. |
| | බහු: | (ඒ බත් තුමූ) පිසනු ලැබෙත්. |
| 2. | එක: | (බත වූ තෝ) පිසනු ලැබෙහි. |
| | බහු: | (බත් වූ තොපි) පිසනු ලැබෙහු. |
| 3. | එක: | (බත වූ මම) පිසනු ලැබෙමි. |
| | බහු: | (බත් වූ අපි) පිසනු ලැබෙමු. |

**සංලක්ෂ්‍යය:**

මෙහි 'සො ඔදනො' යනාදීහු කර්මපද වෙති. මේ ක්‍රියාපද සයට ම 'දසයා විසින්' කියා හෝ 'දසයන් විසින්' කියා හෝ 'උඹ විසින්' කියා හෝ 'මා විසින්' 'අප විසින්' 'තොප විසින්' කියා හෝ 'අරක්කැමියන් විසින්' කියා හෝ තතියාවෙහිවූ අන්කිසි වචනයක් හෝ කර්තෘ වශයෙන් යෙදිය හැක. කර්තෘ එකවචනයෙන් සිටියත් බහුවචනයෙන් සිටියත් පඨම පුරිසාදි කොයි පුරුෂයෙන් සිටියත් මෙහිදී ක්‍රියාව ඒ ගැන නොසලකා කර්මයාගේ එක-බහුවචන ද පුරුෂය ද ගනී.

71. කම්මකාරක ක්‍රියා සම්පාදනය කරනු ලබන්නේ ධාතුවටත් විභක්ති ප්‍රත්‍යයටත් අතරෙහි ය – ප්‍රත්‍යයක් යෙදීමෙනි. ඒ ය – ප්‍රත්‍යය යෙදෙනවිට බොහෝසේ ඊට මුලින් ඊ – කාරයක් ද යෙදේ.

මේ ය – ප්‍රත්‍යය නොයෙක්විට ධාත්වන්තයෙහි තිබෙන ව්‍යඤ්ජනය හා සමාන රූපයට පැමිණේ. 'පච + ය + ති' යි තිබුණු තැන ධාත්වන්ත අකාරය ලොප්වී 'පච්‍යති' යි සිටිවිට යකාරයට චකාරවීමෙන් **පච්චති** යි සෑදේ. එසේ පූර්වරූපයට නො පැමිණ **පචීයති** ආදී වශයෙන් ද පද සෑදෙති.

72. ය – ප්‍රත්‍යය විකාරයට නො පැමිණ සෑදෙන කම්මකාරක පදයන්ට උදහරණ මෙසේයි:–

## ප පුව් හර ධාතුව

1. එක: (චොරෙන) (සො) පහරීයති
   බහු: (චොරෙන) (තෙ) පහරීයන්ති
2. එක: (චොරෙන) (ත්වං) පහරීයසි
   බහු: (චොරෙන) (තුම්හෙ) පහරීයථ
3. එක: (චොරෙන) (අහං) පහරීයාමි
   බහු: (චොරෙන) (මයං) පහරීයාම

අර්:–

1. එක: (සොරා විසින් හෙතෙම) ගසනු ලැබේ.
   බහු: (සොරා විසින් ඔවුහු) ගසනු ලැබෙත්.
2. එක: සොරා විසින් (හේ) ගසනු ලැබෙහි.
   බහු: සොරා විසින් (තෙපි) ගසනු ලැබෙහු.
3. එක: සොරා විසින් (මම) ගසනු ලැබෙමි.
   බහු: සොරා විසින් (අපි) ගසනු ලැබෙමු.

| | | | |
|---|---|---|---|
| කරීයති | = කරනු ලැබේ | බන්ධීයති | = බඳිනු ලැබේ. |
| | සාදනු ලැබේ | දීයති | = දෙනු ලැබේ |
| කසීයති | = සීසානු ලැබේ | මාරීයති | = මරනු ලැබේ |
| ගණ්හීයති | = ගනු ලැබේ. | භාසීයති | = කියනු ලැබේ |
| හරීයති | = ගෙනයනු ලැබේ | ධොවීයති | = සෝදනු ලැබේ |
| ආහරීයති | = ගෙනෙනු ලැබේ | දෙසීයති | = දෙසනු ලැබේ |
| කිණීයති | = මිළට ගනු ලැබේ | වන්දීයති | = වඳිනු ලැබේ |
| වික්කිණීයති | = විකුණනු ලැබේ | රක්ඛීයති | = රකිනු ලැබේ |
| භුඤ්ජීයති | = අනුභවකරනු ලැබේ | ආකඩ්ඪීයති | = අදිනු ලැබේ |

මේ ආදීහු පහරීයති යන්න මෙන් වරනැගෙත්.

## අභ්‍යාසය 28.

**පාලියට නැගියයුතු-:-**

1. කඤ්ඤාය ඔදනො පචීයති. 2. ගොණා දසෙහි පහරීයන්ති. 3. ත්වං බලිනා පුරිසෙන ආකඩ්ඪීයසි. 4. මයං අම්හාකං අරීහි මාරීයාම. 5. තෙ මිගා තාය දසියා බන්ධීයන්ති. 6. ඉමිනා වඩ්ඪකිනා[1] ඉමස්මිං ගාමෙ බහූනි ගෙහානි කරීයන්ති. 7. තුම්හෙ තස්මිං ගාමෙ මනුස්සෙහි බන්ධීයථ. 8. අම්හාකං භණ්ඩානි තෙසං දසෙහි ගාමං හරීයන්ති. 9. අට්ඨහි වාණිජෙහි චත්තාරො අස්සා නගරං ආහරීයන්ති. 10. මයං අම්හාකං ධීතරෙහි නත්තාරෙහි ච වන්දීයාම. 11. තං මහන්තං ඛෙත්තං පඤ්චහි කස්සකෙහි කසීයති. 12. වනිතාය බහූනි වත්ථානි තස්සං පොක්ඛරණියං ධොවීයන්ති. 13. සෙට්ඨිනා බහූන්නං යාචකානං දනං දීයති. 14. තස්මිං ආරාමෙ වසන්තෙහි භික්ඛූහි සීලං රක්ඛීයති. 15. ඡහි භික්ඛූහි පඤ්ච සතානං මනුස්සානං ධම්මො දෙසීයති. 16. පඤ්ඤාසාය මනුස්සෙහි තම්හා ආපණා බහූනි භණ්ඩානි කිණීයන්ති. 17. දසහි වනිතාහි අම්බානං ද්විසතං වික්කිණීයති. 18. දසියා පක්කො ඔදනො ගහපතිනා භුඤ්ජීයති.

1. වඩ්ඪකී – වඩුවා, පු

**පාලියට නැගියයුතු:-**

1. මව විසින් පුත්‍රතෙම අත්වලින් ගනු ලැබේ. 2. බුදුරදුන් විසින් දෙවියන්ට ද මිනිසුන්ට ද ධර්‍මය දෙසන ලදී. 3. දසයන් විසින් දික් ලණුවලින් දෙන්නු බඳින ලදහ. 4. මේ ගෙය වඩුවන් අටදෙනෙකුන් විසින් සාදන ලදී. 5. ඒ වනයේ දිවියන් දෙදෙනකුන් විසින් දෙන්නු නවදෙනෙක් මරන ලදහ. 6. බලවත් මිනිසුන් විසින් තෝ කුඹුරට අදිනු ලැබෙහි. 7. ධනවතුන් දෙදෙන විසින් කලු අශ්වයෝ දෙදෙනෙක් මිළට ගන්නා ලදහ. 8. තෙපි මිනිසුන් සිවු දෙනෙකුන් විසින් පහරදෙනු ලැබෙව්. 9. ඒ වෙළඳුන් දෙදෙන විසින් මේ ගම්හිදී බඩු විකුණන ලදහ. 10. ළමයා ඔහුගේ මව විසින් වෙදකු වෙත ගෙනයන ලදී. 11. මේ විහාරයෙහි භික්‍ෂූන් විසින් මේ ගමේ මිනිසුන්ට ධර්‍මය දෙසන ලදී. 12. දසිය විසින් පිසන ලද බත ඇගේ පුතුන් හා සොහොයුරන් විසින් අනුභවකරන ලදී. 13. ඒ ස්ත්‍රීන් විසින් මේ වැවෙහි බොහෝ රතු රෙදි සෝදනු ලැබෙත්. 14. උස් ස්ත්‍රීන් සදෙනෙකු විසින් අඹගෙඩි තුන්සියයක් විකුණන ලදී. 15. මේ කුඹුරෙහි සියලු තණකොළ ගොනුන් අටදෙනෙකුන් හා දෙනුන් සිවුදෙනෙකුන් විසින් කනලදී. 16. බුදුරද මේ දිවයිනේ බොහෝ දෙනෙකුන් විසින් වඳිනු ලැබේ. 17. ගොවියන් දෙළොස් දෙනෙකුන් හා ගවයන් අටදෙනෙකුන් විසින් කුඹුරු දෙකක් සීසානු ලැබේ. 18. මග යන මිනිසාගේ පුත්‍රයා බලවත් මිනිසුන් විසින් පහර දෙනු ලැබීය.

## 73. කර්‍මකාරකයෙහි සිඬ වූ කිතක (නාම) පද

කර්ම කාරකයෙහි ක්‍රියා පමණක් නොව නාම පද ද සිඬ වෙති. ඒවා කිතක පදයන්හි ඇතුළත් වෙති. ඒවා සිඬ වන ආකාරය දෙවෙනි පොතෙහි දක්වේ. මෙහි උදහරණ ස්වල්පයක් දක්වනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| භුත්ත | = අනුභවකළ | දට්ඨ | = ඩසිනලද |
| පක්ක | = පිසනලද, පිසූ | ඛාදිත | = කනලද |
| වුත්ත | = කී, කියනලද | හට | = ගෙනයනලද |
| වන්දිත | = වඳිනලද | ආහට | = ගෙනෙනලද |

| | | | |
|---|---|---|---|
| පූජිත | = පුදනලද | නීත | = ගෙනයනලද |
| භින්න | = බිඳුණු, බිඳිනලද | පහට | = ගසනලද, පහරදෙනලද |
| සුත | = අසනලද, ඇසූ | ඤාත | = දන්නාලද, දත් |
| දින්න | = දෙනලද, දුන් | ඡින්න | = කපනලද. කැපූ |

මේ දක්වූ සියලු පද අතීතාර්ථයෙහි වෙති. වර්තමානාර්ථයෙහි කර්ම කාරකයෙහි සිද්ධපද නම්:–

| | |
|---|---|
| භුඤ්ජියමාන | = අනුභව කරනු ලබන |
| ආහරීයමාන | = ගෙනඑනු ලබන |
| නීයමාන | = ගෙනයනු ලබන |
| පහරියමාන | = පහරදෙනු ලබන |
| වුච්චමාන | = කියනු ලබන |
| පච්චමාන | = පිසනු ලබන |
| වන්දීයමාන | = වඳිනු ලබන |
| දීයමාන | = දෙනු ලබන ආදියයි. |

| | | | |
|---|---|---|---|
| වන්දිතබ්බ | = වැන්දයුතු | කාතබ්බ | = කළයුතු |
| පචිතබ්බ | = පිසියයුතු | භුඤ්ජිතබ්බ | = අනුභව කළ යුතු |
| දාතබ්බ | = දියයුතු | හරිතබ්බ | = ගෙනයායුතු |
| දෙසෙතබ්බ | = දෙසියයුතු | ඡින්දිතබ්බ | = කැපියයුතු |

ආදිය කර්මකාරකයෙහි සිදු වූ කාලත්‍රයට ප්‍රකාශ කරන කිතක පදයෝයි.

# අභ්‍යාසය 29.

**සිංහලට නැගියයුතු:-**

1. කඤ්ඤාය පචිතං භත්තං සූනබෙන භුත්තං හොති. 2. පුරිසෙන ජිනිදියමානො රුක්ඛො ගෙහස්ස උපරි පතිස්සති. 3. වනිතාය භුඤ්ජියමානො ආහාරො යාචකස්ස පි දාතබ්බො. 4. පුත්තෙහි ධීතරෙහි ච මාතරො පිතරො ච වන්දිතා පූජිතාච හොන්ති. 5. සබ්බෙහි බුද්ධො වන්දිතබ්බො ච හොති. 6. චොරෙහි හටා අස්සා සාමිකෙහි පුන ආහටා හොන්ති. 7. සාරථිනා පහරියමානො අස්සො සීඝං ධාවති. 8. තුම්හෙ දානානි දාතබ්බානි, සීලානි රක්ඛිතබ්බානි, පුඤ්ඤානි කාතබ්බානි (හොන්ති) 9. මයා දීයමානං භුඤ්ජිතුං බහූ යාචකා ආගතා. 10. වනිතා ධොවිතබ්බානි වත්ථානි ආදාය නදිං ගතා (හොති) 11. යුවතියො මාතුයා වුත්තං කථං සුත්වා කඤ්ඤාය නීයමානානි පුප්ඵානි න ගණ්හිංසු. 12. අම්හෙහි දින්නානි වත්ථානි භික්ඛූහි නීතානි හොන්ති. 13. හීයො අහිනා දට්ඨො බාලො වෙජ්ජස්ස සන්තිකං නීතො හොති. 14. භික්ඛූහි ධම්මො දෙසෙතබ්බො මනුස්සෙහි සුණිතබ්බො ච හොති.

**පාලියට නැගියයුතු:-**

1. ළමයා විසින් කනලද ගෙඩිය අතිකකුට නො දිය යුතුය. 2. ගොවියන් සිවුදෙනෙකුන් විසින් ඔවුන්ගේ ගොනුන් සමග කෙත සීසෑයුතුය. 3. සතුරකු විසින් පහරදෙනු ලැබූ මිනිසා කළයුතු දෙයක් නො දැන කුඹුර සරස දිව්වේය. 4. ධනවත් වෙළඳා විසින් දෙනු ලබන දානය ලබාගැනීමට බොහෝ යාචකයෝ ආහ. 5. තොපගේ මවුපියවරු[1] තොප විසින් වැන්ද යුත්තෝ ද පිදිය යුත්තෝ ද වෙති. 6. ගුරුවරයා කී දෙය ඇසූ ශිෂ්‍යයෝ කියයුත්තක් නොදැක්කාහ. 7. වෙළඳුන් විසින් ගෙනයනලද අශ්වයෝ ඊයේ විකුණන ලදහ. 8. දසයා විසින් ගසනු ලැබූ ගොනා වහා කුඹුරට දිව්වේය. 9. අප විසින් සිල් රැක්ක යුතුය, දන් දිය යුතුය, ධර්මය ඇසිය යුතුය. 10. අපේ මිතුරන් විසින් බොහෝ සුදු වස්ත්‍ර

1. මාතාපිතරො

යේදිය යුතු වෙති. 11. උයනෙහි කැපියයුතු වූ බොහෝ ගස් ඒ මිනිසුන් විසින් කපනු ලැබෙත්. 12. ඔවුන් විසින් කපනලද ගස් ඇතුන් විසින් අදිනු ලැබෙත්. 13. අප විසින් පිසනලද බත කුඹුරෙහි සිටින්නන්ට ගෙන යායුතුය. 14. ගමට ගිය වෙළඳුන්ට අනුභව කළ යුතු ආහාරයක් නො ලැබිණි.

**සංලක්‍ෂ්‍යය:**

'බුද්ධෙන ධම්මො දෙසිතො'

(බුදුන් ධර්‍මය දෙශනා කරන ලදී.)

යන වාක්‍යය සම්පූර්‍ණ වාක්‍යයක් සේ පෙනෙතත් පරීක්‍ෂණය කරන්නකුට මෙහි ක්‍රියා පදයක් නැති බව පෙනේ. 'දෙසිතො' යන්න ක්‍රියාපදයක් නොව නාම පදයකි. එබැවින් මේ අඩුව පිරවීම සඳහා අප විසින් 'දෙසිතො හොති' (=දෙසන ලද්දේ වේ) 'දෙසිතො අහොසි' (=දෙසන ලද්දේ විය) යි ක්‍රියා පදයක් යෙදිය යුතුයි. නමුත් බොහෝ තැන්හි මේ ක්‍රියාපදය නො යොද අතීතකාලික කිතකපදය පමණක් යොදන ලද වාක්‍යයෝ දක්නා ලැබෙත්. එ තැන්හි ක්‍රියාපද ආධ්‍යාහාර කොට (ගෙනැවිත් දමා) අර්‍ථ දතයුතුයි.

## 74. කාරිත හෙවත් හේත්වර්ථපද

'කරවයි, පිසවයි' ආදියෙහි පෙනෙන අන්‍යයකු ලවා කරවීම **කාරිත** නම් වේ.

ධාතුවටත් විභක්ති ප්‍රත්‍යයටත් අතරෙහි එ – අය – ආපෙ – ආපය යන කොටස්වලින් එකක් යොද ධාතුවේ මුලින්ම තිබෙන (බැඳි අකුරකට පූර්‍ව නො වූ) ස්වරයට වෘඩිකිරීමෙන් කාරිතපද සෑදිය යුතුය. 'කරොති' යන ශුඬක්‍රියාපදයෙන් **කාරෙති**, **කාරයති**, **කාරාපෙති**, **කාරාපයති** යි කාරිතපද සතරක් සෑදෙති, ඒ සතරෙන්ම "කරවයි" යන අර්ථය කියවේ.

තවත් උදහරණ:–

| | | | |
|---|---|---|---|
| පාචෙති | = පිසවයි | දපෙති | = දෙවයි |
| නහාපෙති | = නාවයි | ගණ්හාපෙති | = ගන්වයි |
| භොජෙති | = අනුභව කරවයි | ආහාරාපෙති | = ගෙන්වයි |
| නිසීදපෙති | = හිඳුවයි | හරාපෙති | = ඉවත් කරවයි |
| සයාපෙති | = නිදිකරවයි | | ගෙණයන්නට සලස්වයි. |

75. මේ පොතේ 13 වෙනි අංකයෙහි දක්වූ **පාලෙති** ආදී චුරාදිගණික ක්‍රියාපද **කාරෙති** ආදි කාරිත පදයන්ට සමානව පෙනෙත්. එ – අය දෙක යෙදී තිබෙතත් ඒවා කාරිත නොවෙති. ඒ පදයන්ගේ කාරිතපද සෑදිය යුත්තේ **ආපෙ. ආපය** දෙක පමණක් යෙදීමෙනි.

උදහරණ:–

| | |
|---|---|
| චොරාපෙති, චොරාපයති | = සොරකම් කරවයි |
| මාරාපෙති, මාරාපයති | = මරවයි |
| දෙසාපෙති, දෙසාපයති | = දේශනා කරවයි |
| පාතාපෙති, පාතාපයති | = හෙළවයි |
| ඨපාපෙති, ඨපාපයති | = තබවයි |
| යොජාපෙති, යොජාපයති | = යොදවයි |

## අභ්‍යාසය 30.

**සිංහලට නැගියයුතු:**

1. සෙට්ඨී වඩ්ඪකිං ගෙහානි කාරාපෙති. 2. මාතා දරකං පොක්ඛරණිං නෙත්වා නහාපෙස්සති. 3. අම්හාකං පිතරො විහාරං ගන්ත්වා භික්ඛූ භොජාපෙසුං. 4. තා වනිතායො දසියො භත්තං පචාපෙන්ති. 5. පාපකාරිනො පුරිසා අත්තනො දසෙහි බහූ[1] මිගෙ මාරාපෙන්ති. 6. ගහපතයො පුරිසෙහි දරකෙ ගණ්හාපෙන්ති. 7. ගරු බහූ සිස්සෙ ධම්මං උග්ගණ්හාපෙති. 8. අධිපති දසෙහි උය්‍යානෙ බහූ රුක්ඛෙ ඡින්දපෙති. 9. අහං තාහි කඤ්ඤාහි ආපණම්හා භණ්ඩානි ආහරාපෙස්සාමි. 10. තුම්හෙ භාතරෙහි කපයො ගාමං හරාපෙථ. 11. මයං තෙහි දසහි කස්සකෙහි චත්තාරි ඛෙත්තානි කසාපෙස්සාම. 12. මාතා පුත්තං පීඨෙ නිසීදපෙත්වා[2] භත්තං පාචෙතුං[3] තණ්ඩුලෙ[4] ආහරාපෙසි.

---

1. දසෙහි දසයන් ලවා යි අර්ථ කියයුතු කිරීමට අණ ලබන්නා කර්ම විභක්තියෙන් හෝ තතියාවෙන් සිටිය යුතු.
2. හිඳුවා
3. පිසවන්ට මේ දෙක ද කාරකාර්ථ ඇති පදයි.
4. තණ්ඩුල – සහල් පු. න.

**පාලියට නැගියයුතු:-**

1. පචිකාරයා ඔහු ගේ සොහොයුරන් ලවා පක්ෂීන් මරවයි. 2. ධනවත්තු ඔවුන්ගේ පුතුන් ලවා දන් දෙවත්. 3. රජතෙමේ වඩුවන් ලවා විශාල වූ ගෙවල් පසක් සාදවයි. 4. රථාචාර්‍යයා දසයන් ලවා අසුන් දෙදෙනෙකුන් රථය සමීපයට ගෙන්වීය. 5. ඒ ස්ත්‍රීහු ඇලාගේ දූවරුන් ලවා ආගන්තුකයන්ට බත් පිසවූහ. 6. වඩු තෙම කම්කරුවන් ලවා බොහෝ බඩු සාදවයි. 7. අධිපති තෙමේ මිනිසුන් ලවා වනයෙහි බොහෝ උස් ගස් කප්පවයි. 8. ඔවුහු ගොනුන් විසි දෙනෙකුන් හා මිනිසුන් පස්දෙනෙකුන් ලවා කුඹුර සීසාවන්නාහ. 9. මම මාගේ පුත්‍රයන්ට ආහාර අනුභව කරවමි. 10. අපි අපගේ දසයන් බඩු ගෙනෙන්ට නුවරට යවන්නෙමු.[1] 11. ඔවුහු කුඹුරට ගොස් දෙනුන්ට තණ කවත්. 12. අධිපතියා භික්ෂූන් ලවා විහාරයන්හි ධර්මය දේශනා කරවයි.

### 76. පඤ්චමියගේ අර්ථයෙහි තො - ප්‍රත්‍යය

'කෙරෙන්' යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා බොහෝ ශබ්දයන් කෙරෙන් තො – ප්‍රත්‍යය යොදනු ලැබේ. පඤ්චමියගේ එකවචන බහුවචන දෙක්හිම එය යෙදේ. ඒ ප්‍රත්‍යයෙන් යුත් පද නිපාත සංඛ්‍යාවට වැටෙත්.

පුරිසතො = පුරුෂයා කෙරෙන්, පුරුෂයන් කෙරෙන්

රුක්ඛතො = ගස හෝ ගස් කෙරෙන්

| | | | |
|---|---|---|---|
| ගාමතො | = ගමෙන් | චොරතො | = සොරා කෙරෙන් |
| ගෙහතො | = ගෙයින් | අග්ගිතො | = ගින්නෙන් |
| නගරතො | = නුවරින් | සබ්බතො | = සියල්ල කෙරෙන් |
| මාතිතො | = මව කෙරෙන් | පිතිතො | = පියා කෙරෙන් |

77. කර්මකාරකයෙහි සිඬවූ කිතකපද මින් පෙර දක්වන ලදහ. කර්තෘ කාරකයෙහි සිඬවන කිතක පද ද ඇත්තාහ. එයින් ස්වල්පයක් මෙහි දක්වේ.

| | | | |
|---|---|---|---|
| ගත | = ගිය; ගියාවූ | නහාත | = නෑ; නෑවා වූ |
| ආගත | = ආ; ආවාවූ | ඨිත | = සිටි |

---

1. යවයි – පෙසෙති

| | | | |
|---|---|---|---|
| මත | = මළාවූ | නිසන්නං | = හුන් |
| භූත | = වූ; සිදු වූ | වුට්ඨ | = විසූ |
| සුත්ත | = නිදගත් | කුද්ධ | = කිපි; කිපුණු |
| ඔතිණ්ණ | = බැස්සා වූ | තිණ්ණ | = එතර වූ |

ආරුළ්හ = නැගි; නැඟුණු

## අභ්‍යාසය 31.

**සිංහලට නැගියයුතු:-**

1. හීයො අරඤ්ඤං ගතො පුරිසො අහිනා දට්ඨො මරි. 2. රුක්ඛතො ඔතිණ්ණා පක්ඛී දරකෙන මාරිතාහොන්ති. 3. ගාමතො නික්ඛන්තා[1] ගාවියො ඛෙත්තෙ තිණං ඛාදිත්වා වාපිතො ජලං පිවිස්සන්ති. 4. වාණිජෙහි නගරතො ආභටානි භණ්ඩානි ඉමෙසු ගාමෙසු මනුස්සෙහි කීතානි. 5. තාය කඤ්ඤාය පචිතො ඔදනො අටවිතො ආගතෙහි තස්සා භාතරෙහි භුත්තො හොති. 6. කුතො තුම්හෙ ඉමානි වත්ථානි තානි පදුමානි ච කිතානි? 7. සා යුවති මාතිතො පිතිතො ච ලද්ධං ධනං ගණ්හිතුං න ඉච්ඡති. 8. කුද්ධො සො භූපති තස්මිං නගරෙ වුට්ඨෙ සබ්බෙ මනුස්සෙ තතො නීහරාපෙසි[2]. 9. ගෙහතො ආගතා එකා දරිකා ඉධ නිසින්නං අඤ්ඤං දරිකං පහරි. 10. තාය පහටා සා කඤ්ඤා තස්සා මාතුයා සන්තිකං ගන්ත්වා රොදි.[3] 11. භූපති තෙහි වඩ්ඪකීහි කතානි ගෙහානි පස්සිත්වා තෙසං ධනං දපෙසි. 12. අග්ගිනා දඩ්ඪො වාණිජස්ස පුත්තො දසෙහි වෙජ්ජස්ස සන්තිකං නීතො හොති. 13. අග්ගිතො උදකතො චොරතො ච මනුස්සානං භයං උප්පජ්ජති[4]. 14. නගරතො නික්ඛන්තා චොරා මනුස්සෙහි ධනං ගාහාපෙත්වා අටවිං ගච්ඡිංසු.

---

1. නික්මුණු
2. ඉවත් කරවිය
3. රොදති – හඬයි
4. උපදී

**පාලියට නැගියයුතු:-**

1. මොනරා ගසෙන් බැස පර්වතයට ගියේය. 2. සර්පයා විසින් ඩසිනලද පුරුෂයා ඔහුගේ නෑයන් විසින් වෙදකු වෙත ගෙන යන ලදී. 3. මේ ස්ත්‍රිය ඇගේ සොහොයුරියගෙන් ලැබුණු ධනය ගන්ට කැමති නො වේ. 4. ගමෙන් ආ මිනිහා මේ කඩයෙන් බඩු ගත්තේය. 5. මව කී දෙය ඇසූ ළමයා මළ මිනිසා සමීපයට නො ගියේය. 6. මාගේ නැන්දගේ දෙන්නු වනයෙන් අවුත් දසියන් විසින් ගෙනෙන ලද තණකොළ කන්නාහ. 7. නිදන මිනිසකු දුටු ගෘහපතියා තමාගේ පුත්‍රයන්ට ඔහු වෙත නො යා යුතුය යි කීය. 8. බත් පිසන තරුණිය විසින් දුවන මුවෙක් දක්නාලදී[1] 9. ඇය පිසූ බත යාචකයන්ට ද දෙනුන්ට ද දෙනලදී. 10. ඔවුන් පර්වතයෙහි සෑදූ ගෙය ඇතකු විසින් බිඳ දමන ලදී. 11. කිපියාවූ රජු විසින් නුවරට ආ සියලු මිනිස්සු මරණ ලදහ. 12. ඇතා විසින් බිඳිනලද අත්ත බිම වැටුණේය. පසුව දෙනුන් විසින් එහි කොළ කනලදී. 13. ඒ දැරිය විසින් රාජ දේවියගෙන් ඇට ලැබුණු[2] මල්දම අන් දැරියකට දෙනලදී. 14. ඔවුහු විසින් මිළ දී ගත් අශ්වයා සොරෙකු විසින් ගෙනයන ලදී.

**පහත පෙනෙන වාක්‍ය කර්මකාරකයට පෙරළිය යුතු:-**

1. වඩ්ඪකී ගෙහානි කරොති. 2. අස්සො රථං ආකඩ්ඪති. 3. දසා අස්සෙ ආහරිංසු. 4. හත්ථී රුක්ඛා ගාමා හරති. 5. චොරො තුම්හෙ පහරී. 6. මනුස්සො හත්ථිං බන්ධති. 7. දසො අස්සං ආකඩ්ඪති. 8. නාරි ඔදනං පචිස්සති. 9. කස්සකො ඛෙත්තං කසති. 10. චොරා අම්හාකං ගොණෙ බන්ධන්ති.

---

1. දිට්ඨ – දක්නාලද
2. ලද්ධ – ලැබුණු

# සම්පූර්ණ වචනමාලාව
## INDEX

**ලිඞ්ගාදිය ඇඳින්වීමට යෙදූ ලකුණු:**

පු – පුල්ලිඞ්ග
ඉ – ඉත්ථිලිඞ්ග
න – නපුංසකලිඞ්ග
3 – තුන්ලිඟු
පූ. ක්‍රි. – පූර්වක්‍රියා
ක්‍රි. වි. – ක්‍රියා විශේෂණ
නි. – නිපාත

අලිංගික ශබ්දවලට ද ක්‍රියාවලට ද කිසි ලකුණක් නො යොදන ලදී.

## පාලි - සිංහල

අකාසි = කෙළේය.
අක්කොසති = ආක්‍රෝශ කරයි: බැනවදී.
අක්ඛි = ඇස, න.
අගච්ඡි = ගියේය.
අගමාසි = ගියේය.
අගමි = ගියේය.
අග්ගි = ගින්න පු.
අග්ගිනො = ගින්න කෙරෙන් නි.
අංගුලි = ඇඟිල්ල ඉ.
අචරි = හැසුරුණේය.
අච්චි = ගිනිදැල් ඉ. න.
අජ = එළුවා පු.
අජ්ජ = අද. නි.
අඤ්ඤා = අනික්. 3.
අඤ්ඤතර = අප්‍රකට: එක්තරා 3
අටවි = වනය 3
අට්ඨ = අට 3.
අට්ඨතිංසති = තිස්අට ඉ.
අට්ඨම = අටවෙනි 3.
අට්ඨවීසති = විසිඅට. ඉ.
අට්ඨාදස = අටළොස. 3.
අට්ඨාරස = දහඅට 3.
අට්ඨාසි = සිටියේය.
අට්ඨි = ඇටය. න.
අණ්ඩ = බිත්තරය. න.
අතික්කමිතුං = ඉක්මවන්ට. නි.
අතිථි = ආගන්තුකයා පු.
අත්තනො = තමාගේ. පු. (අත්ත ශබ්ද)
අත්ථි = ඇත්තේය: ඇත්තාහ. නි.
අථ = ඉක්බිති නි.
අථවා = නොහොත් නි.
අද්දි = දුන්නේය.
අදසි = දුන්නේය.
අද්ධා = ඒකාන්තයෙන්. නි.
අධර = යට: පහත් 3.
අධිපති = අධිපතියා: ස්වාමියා: නායකයා. පු.
අනුගච්ඡති = අනුවයේ: පසු පස්සේ යයි.
අන්තරා = අතරෙහි. නි.
අන්තො = ඇතුළෙහි. නි.

අපගච්ඡති = ඉවත්වයේ.
අපර = අනික්; පසු; බටහිර. 3.
අපි = ද; ත්. නි.
අප්පක = ස්වල්පවූ; ටිකවූ. 3.
අභවි = විය; වූයේය.
අභිණ්හං = නිතර. ක්‍රි. වි.
අමත = නිවන; අමෘතය. න.
අම්බ = අඹ (ගස) පු.
අඹ (ගෙඩිය)
අම්බු = ජලය. න.
අම්මා = මව. ඉ.
අම්හාකං = අපේ; අපට.
අයං = මේතෙම; මෝතොමෝ
අරඤ්ඤ = වනය. න.
අරි = සතුරා. පු.
අලාත = ගිනිපෙනෙල්ල න.
අසනි = හෙනය. ඉ.
අසි = කඩුව පු.
අසීති = අසූව. ඉ.
අසීතිම = අසූවෙනි. 3.
අස්ස = අශ්වයා පු.
අස්ස = මොහුගේ; මොහුට.
අස්සා = මැගේ; මැට
අස්සු = කඳුලු න.
අහි = සර්පයා. පු.
අහං = මම.
ආකඩ්ඪති = ආදී.
ආකඩ්ඪීයති = අදිනු ලැබේ.
ආකාස = අහස, පු.
ආඛු = මීයා. පු.
ආගච්ඡති = එයි.
ආගත = ආ; ආවාවූ 3
ආගමි = ආවේය
ආගන්ත්වා = අවුත් පූ. ක්‍රි.
ආගන්තුං = එන්ට නි.
